ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
இலங்கை சமூகப் பாதுகாப்புச் சபை
SRI LANKA SOCIAL SECURITY BOARD

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுப்படுத்துகை அமைச்சு

Ministry of Women, Child Affairs and Social Empowerment

වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන
வருடாந்த அறிக்கை மற்றும் நிதிக் கூற்று
ANNUAL REPORT AND FINANCIAL STATEMENTS

2023

''සමාජ ආරක්ෂණ පියස'', අංක : 18, රාජගිරිය පාර, රාජගිරිය.
දුරකථන : 0112 886585 / 0112 886586, ෆැක්ස් අංකය : 0112 886088
වෙබ් අඩවිය : www.ssb.gov.lk ඊ - මේල් : info@ssb.gov.lk

අන්තර්ගතය

01.වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම 1

02.අපගේ තේමාව 2

03.අපගේ දැක්ම, මෙහෙවර සහ වටිනාකම් 2

03.1. දැක්ම 2

03.2. මෙහෙවර 2

3.3. අපගේ වටිනාකම් 2

04. සභාපතිවරයාගේ සමාලෝචනය 3

05.අධ්‍යක්ෂ මණ්ඩලය 2023 4

06. සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචන 6

07. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සංවිධාන ව්‍යුහය 8

08. "ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය" යනු කුමක්ද? 9

08.1. ව්‍යවස්ථාපිත අරමුණු 9

08.2. කාර්යභාරය 9

08.3. අපගේ සේවාවන් 10

08.3.1.ප්‍රධාන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම 10

08.3.2. විශේෂිත විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම 10

08.4. යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ 10

08.5. "සුරැකුම" විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය 11

08.5.1."සුරැකුම" යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ 11

08.6. "ආරක්ෂාව" පූර්ව සැලසුම් යෝජනා ක්‍රම 13

08.6.1."ආරක්ෂාව" පූර්ව සැලසුම් ක්‍රමයේ ප්‍රතිලාභ 13

09. ප්‍රධාන සංධිස්ථාන 14

10. කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ 16

10.1. **2023** වර්ෂයේ විශේෂ අවස්ථා සහ කළමනාකරණ විශ්ලේෂණය 16

10.2. මුළු බදවා ගැනීම් එකතුව පදනම්ව ඉහළම ප්‍රගතිය වාර්තාකළ සම්බන්ධීකරණ නිලධාරීන් - **2023** 22

103.. පළමු වාරික මුදල් රැස්කිරීම්හි එකතුව පදනම්ව ඉහළම ප්‍රගතිය වාර්තා කළ සම්බන්ධීකරණ නිලධාරීන් -2023 23

10.4. අනුමත කාර්යය මණ්ඩලය හා පුරප්පාඩු 23

10.5. අනුමත කාර්යය මණ්ඩලය වැඩි කිරීම හා පුරප්පාඩු පිරවීම 24
10.6. **2023** වර්ෂයේ අස්වීම් හා විශ්‍රාම යාම් 25
10.7. පුහුණුව හා සංවර්ධනය 26
11.මණ්ඩලයේ කොට්ඨාශ / අංශ /ඒකකවල කාර්යයන් 27
11.1. පාලන අංශය 27
11.1.1. පාලන අංශයේ ප්‍රධාන කාර්යයන් 27
11.1.2. පාලන අංශයේ සත්‍ය කාර්යය මණ්ඩලය 28
11.1.3. භෞතික සම්පත් 28
11.1.4. සන්නිවේදන පහසුකම් 29
11.1.5. ප්‍රවාහන පහසුකම් 29
11.1.5.1. දැනට තිබෙන වාහනවල විස්තර (2023.12.31 දිනට) 30
11.1.6. පාලන අංශයේ සීමාවන් 31
11.2. සමාජ ආරක්ෂණ අංශය 32
11.2.1. ප්‍රධාන කාර්යයන් 32
11.2.2. ප්‍රතිලාභ ගෙවීම 32
11.2.3. සේවා ඒකකයන් හා දිස්ත්‍රික් කාර්යාල 32
11.2.4.යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධ වන නිලධාරින් 32
11.2.5.සමාජ ආරක්ෂණ අංශයේ කාර්යය මණ්ඩලය 33
11.2.6. සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය 34
11.2.7. නව සාමාජිකයින් බඳවාගැනීමේ හා වාරික රැස්කිරීමේ වාර්ෂික ප්‍රගතිය 35
11.2.8. **2023** වර්ෂයේ ප්‍රතිලාභ ගෙවීම 36
11.2.9. **2023** වර්ෂයේ දායකයින්ගේ අය කළ මුදල් 36
11.2.10. **2023** වර්ෂයේ පවත්වන ලද පුහුණු හා ජංගම දැනුවත් කිරීමේ වැඩසටහන 36
11.2.11. සමාජ ආරක්ෂණ අංශයේ සීමාවන් 36
11.3. මුදල් අංශය 37
11.3.1.ප්‍රධාන කාර්යයන් 37
11.3.2.මුදල් අංශයේ සත්‍ය කාර්යය මණ්ඩලය 37
11.3.3.ආයතනය සතු වත්කම් 38
11.3.4. **2023** වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන 38
11.3.5. වෙනත් ළඟා කර ගැනීම් 38
11.4.අභ්‍යන්තර විගණන අංශය 39
11.4.1. ප්‍රධාන කාර්යයන් 39
11.4.2. විෂය පථය 39

11.4.3. අභ්‍යන්තර විගණන අංශයේ සත්‍ය කාර්ය මණ්ඩලය 39
11.4.4. විගණන කමිටු රැස්වීම් 40
11.4.5. **2023** වර්ෂයේ දී ඉදිරිපත් කළ අභ්‍යන්තර විගණන වාර්තා 40
11.4.6. දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව 40
11.4.7.ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව.....41
11.4.8. විශේෂ පැවරුම් වාර්තා 41
11..5 තොරතුරු තාක්ෂණ ඒකකය..... 42
11..5.1. ප්‍රධාන කාර්යයන් 42
11..5.2. **2023** වර්ෂයේ තොරතුරු තාක්ෂණ ඒකකයෙන් සිදු කළ කාර්යයන්..... 42
11..5.3. තොරතුරු තාක්ෂණ ඒකකයේ සත්‍ය කාර්යය මණ්ඩලය 42
11.6 ප්‍රවර්ධන ඒකකය 43
11.6.1. ප්‍රධාන කාර්යයන් 43
11..6.2.**2023** වර්ෂයේ ප්‍රවර්ධන හා මාධ්‍ය ඒකකයෙන් සිදු කළ කාර්යයන්..... 43
11..6.3 ප්‍රවර්ධන ඒකකයේ සත්‍ය කාර්යය මණ්ඩලය.....43
12. ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය හා තෘතීය කළමනාකාරීත්වය (2023.12.31 දිනට).....44
12.1. ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය..... 44
12.2. තෘතීය කළමනාකාරීත්වය 45
13. පසුගිය වසර 10 ක මූල්‍ය ප්‍රගතියේ විශේෂ අවස්ථා.....47
14. මූල්‍ය විශ්ලේෂණය සහ මෙහෙයුම් කාර්ය සාධනය 50
15. අනු කමිටු..... 51
- විගණන කමිටු වාර්තාව
- ආයෝජන කමිටු වාර්තාව
16. විගණකාධිපතිවරයාගේ වාර්තාව 54
17. **2023** විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම 60
18. අවසන් ගිණුම් ප්‍රකාශන..... 66
ස්තූතිය..... 86

1. වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම

වාර්තාවේ අන්තර්ගතය

2023 වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය 2023 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ප්‍රධාන කාර්යාලය , දිස්ත්‍රික් කාර්යාල 25 සහ ප්‍රදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන් ක්‍රියාත්මක වන මෙහෙයුම් ආවරණය කරයි. එමෙන්ම යොමුගත වාර්තාවේ මූල්‍ය ප්‍රගතියත්, වසර කිහිපයක මූල්‍ය විශ්ලේෂණයත් ඉදිරිපත් කර ඇත. එමෙන්ම අවසන් මූල්‍ය වාර්තා පිළිබඳ විගණකාධිපතිවරයාගේ මතය හා වාර්තාවන්, ඒ පිළිබඳ වන කළමනාකරණයේ අදහස් දැක්වීමක් ඇතුළත් කර ඇත.

වාර්තාවේ අරමුණ

මෙය ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ 28 වන වාර්ෂික වාර්තාව වන අතර, මෙම වාර්තාවේ අරමුණ ආයතනය 2023 වසරේදී එහි ප්‍රතිලාභීන් සහ අනෙකුත් පාර්ශවකරුවන්ට ලබාදී ඇති සේවය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් සැපයීමයි.

එමෙන්ම එමගින් උපාය මාර්ග, පාලනය සහ අරමුදල් කළමනාකරණය පිළිබඳ සන්නිවේදනයක්ද ඉදිරිපත් කරන අතර, එහි මූල්‍ය කාර්යය සාධනය සහ මණ්ඩලයේ මං සලකුණු පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් ද ඉදිරිපත් කරයි.

වාර්තාව ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්තවලින් සමන්විත වන අතර, සැසඳීම් සහ වැඩිදුර විශ්ලේෂණයන් සඳහා පහසුකම් සැපයීම සඳහා හැකි සෑම තැනකම ප්‍රමාණාත්මක දත්ත සැපයීම අපගේ අරමුණයි.

වාර්තාවේ අනුකූලතාවය

1971 අංක 38 දරණ මුදල් පනතේ 14 වගන්තිය යටතේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කෙරේ. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිධාන ප්‍රකාරව විගණකාධිපති දෙපාර්තමේන්තුව මගින් විගණනය සිදු කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව විගණකාධිපතිවරයාගේ මතය වේ.

2. අපගේ තේමාව

රජයේ රැකියාවක් නොකරන ඔබට රාජ්‍ය විශ්‍රාම වැටුපක්

දිනෙන් දින වැඩිවන වැඩිහිටි ජනගහණය සමඟ පොදුවේ රටටත් සමාජයටත් ඇතිවන අභියෝගවලට මුහුණ දීම සඳහා අප මණ්ඩලයේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සමඟ සම්බන්ධවීම තම අනාගතය ස්ථාවර කරගැනීමට පිටුවහලක් වනු ඇත. රටේ සංවර්ධනයට විවිධ ආකාරයෙන් දායකවන ව්‍යවසායකයින් , ස්වයං රැකියා නියුක්තිකයන් ඇතුළු රජයේ විශ්‍රාම වැටප් නොලබන පුරවැසියන්ගේ අනාගත සුරක්ෂිතභාවය තහවුරු කිරීමටත්, තමාගෙන් පසු තම පවුලේ සුරක්ෂිතභාවය, එමෙන්ම තම දරුවන් සම්ප්‍රදායික ලෙස රජයේ රැකියා සඳහා යොමු නොකර දරුවන් කැමති රැකියාවක් තොරාගත්තද ඔවුන්ගේ අනාගත සුරක්ෂිතභාවය පිළිබඳ තහවුරු කරගැනීම අප මණ්ඩලයේ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා දායක වීම මඟින් තහවුරු කර ගත හැකිය. එනම් ශ්‍රී ලංකාව තුළ රජයේ රැකියා සඳහා යොමුවීම තුළින් පමණක් අනාගත සුරක්ෂිතභාවය ආරක්ෂාවක් සැපයේ යන මතයෙන් මිදී තම අභිමතය පරිදි රැකියාවක නිරත වී විශ්‍රාම දිවියේ සුරක්ෂිතභාවයක් ඇති කර ගැනීමට මෙම යෝජනා ක්‍රම උපයෝගී වනු ඇත.

3. අපගේ දැක්ම, මෙහෙවර සහ වටිනාකම්

3.1. දැක්ම

“සමාජ ආරක්ෂණයෙන් සුරක්ෂිත වූ අභිමානවත් ජාතියක්”

3.2. මෙහෙවර

“අභිමානවත් ජාතියක් ගොඩනැගීම උදෙසා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තීන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා නියාමනය මඟින් යහපාලන ප්‍රතිපත්තිවලට අනුගත වෙමින් ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ආර්ථික, සමාජීය, සංස්කෘතික, සුරක්ෂිතබව වෙනුවෙන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමඟ උපාය මාර්ගික සම්බන්ධතා ගොඩ නගමින් තිරසාර සංවර්ධනයක් කරා.....”

3.3. අපගේ වටිනාකම්

1. මුල්‍ය ආරක්ෂාව : විශ්‍රාම දිවියේ මුල්‍ය සුරක්ෂිතභාවය තහවුරු කිරීම
2. සමාජ ආරක්ෂණ ජාලය : විවිධ වූ සාමාජීය හා ආර්ථික අභියෝගවලට එරෙහිව රැකවරණ ජාලයක් වීම.
3. තිරසාරභාවය:තිරසාර පැවැත්මක් සඳහා වත්මන් සහ අනාගත පරම්පරාවන්ගේ සමාජ ආරක්ෂණය සහතික කිරීම.
4. තේරීම සහ නම්‍යශීලී බව : පුද්ගලවරණය සහ මුල්‍ය ශක්‍යතාව අනුව නම්‍යශීලී තේරීමක් සහිත සේවාවක් සැපයීම.
5. සවිබලගැන්වීම : මුල්‍ය සැලසුම් තුළින් පුද්ගලයන් සවිබලගැන්වීම.

4.සභාපතිවරයාගේ සමාලෝචනය



ශ්‍රී ලංකා ඉතිහාසයේ ප්‍රභලම ආර්ථික අර්බුදයකට මුහුණ දී අනතුරුව 2023 වර්ෂය රටක් වශයෙන් විශාල අභියෝග රැසකට මුහුණ දුන් බව අප කවුරුත් දන්නා සත්‍යකි .ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයද විශේෂයෙන් රාජ්‍ය ආයතනයක් වශයෙන් ප්‍රභල අභියෝග රැසකටම නොඅඩුව මුහුණ දුන් වර්ෂය ලෙස 2023 වර්ෂය හැඳින්විය හැක. මේ සියලුම අභියෝග මැදද ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය සිය සමාජ වගකීම මැනවින් වටහාගෙන කටයුතු කර ඇති බව සිහිපත් කිරීමට කැමැත්තෙමි.

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය 1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය පනතින් හා 1999 අංක 33 දරණ සංශෝධිත පනතින් පිහිටු දැනට කාන්තා , ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය යටතේ සමාජ සවිබල ගැන්වීම් රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. වර්තමාන රජයේ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභීන් ප්‍රයෝගික ක්‍රියාවට නංවමින් රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති පුරවැසියන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සහතික කිරීම මෙම මණ්ඩලයේ කාර්ය භාරය වන අතර එමගින් විශ්‍රාම වැටුප් ලබා දීම , හදිසි අකර්මන්‍යතාවකදී හා මරණයකදී මුල්‍ය සහය ලබාදීම ආවරණය වේ.

මාගේ ධුර කාලය පුරා වසරක් සම්පූර්ණවන 2023 වර්ෂය තුළ විශේෂයෙන්ම ගරු රාජ්‍ය අමාත්‍ය අනුප පැස්කුවල් මැතිතුමාගේ නිබඳ උපදෙස් සහ අනුග්‍රහය ලැබුණු අතර මෙම අභියෝගාත්මක වර්ෂය තුළ ජයග්‍රහණ රැසක් ලබා කර ගත හැකි විය. ඒ අතරින් ආයතනයේ ප්‍රගතිය සුවිශේෂී වන අතර 2022 වසරට සාපෙක්ෂව 17.06 % ක වූ බඳවා ගැනීම ප්‍රගතියක් ද 26.75 % ක පළමු වාරික අය කිරීමේ මුල්‍ය ප්‍රගතියක්ද 10.42% ක පසුවාරික අයකිරීමේ ප්‍රගතියක් ද ලබා කර ගත හැකි විය.එසේම ආයතනය තුල කාලයක් තිස්සේ ගොඩගැසී තිබූ මෙහෙයුම් හා පරිපාලන ගැටළු නිරාකරණය කිරීමේ විධිමත් වැඩපිළිවලක් ක්‍රියාවට නගන ලදී.

ඒ අතුරින් , අවුරුදු 5ක් තිස්සේ පවත්වීමට නොහැකිව තිබූ රාජ්‍ය නිලධාරී ඇගයීම් උත්සව සියලු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පවත්වා අවසන් කිරීම , ප්‍රධාන කාර්යාලයේ ඇති සීමිත ඉඩකඩ නිසා ගොඩගැසී තිබූ විශ්‍රාම වැටුප් අයදුම්පත්‍ර ගබඩා කිරීම වෙනුවට ප්‍රාදේශීය කාර්යාල තුලම ප්‍රතිලොකනය කිරීමේ වැඩපිළිවල තුලින් විශාල ප්‍රවාහන හා ඉඩකඩ ඉදිරියේදී ලබාගැනීමට හැකිවීම , පස්වන මහල සඳහා විශේෂ උපදෙස් වලට අනුකූලව විධිමත්ව ටෙන්ඩර් කැඳවීම තුලින් කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීමට කටයුතු කිරීම හා අවුරුදු 5ක් තිස්සේ දිග්ගැසී තිබූ අසාර්ථක ව්‍යාපෘතියක් වූ නව පරිගණක පද්ධතිය සකස් කිරීමේ කොන්ත්‍රාතුව අන්නෝන්‍ය එකඟතාව මත අවසන් කර නව ව්‍යාපෘතියක් ලෙස නැවත ප්‍රසම්පාදනය කිරීමට කටයුතු කිරීම විශේෂයෙන් සඳහන් කිරීමට කැමැත්තෙමි.

මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු වලට ප්‍රභල අභියෝගයක්ව පවතින අක්‍රිය සාමාජිකත්වයේ ඉහල ප්‍රතිශතය පහල නංවා ගැනීම සඳහා පවතින ආයතන ව්‍යුහයේ අත්‍යවශ්‍ය වෙනස්කම් කිරීම සඳහා සියලුම අණපනත් සකස් කර අවසන් කර ඇත.ඉහල මට්ටමේ සක්‍රිය දායකත්වයක් පවත්වා ගැනීමට කටයුතු කිරීම තුලින් මණ්ඩලයේ ආදායම් වර්ධනය වන අතරම සමාජ ආරක්ෂණ අරමුණු කරා ලඟා වීම තුලින් ජනතාවට වැඩි ප්‍රතිලාභයක් අත්කර දෙයි.

ඒ සඳහා මණ්ඩලයේ සියලුම නිලධාරීන්ගේ මනා කැපවීම අත්‍යවශ්‍යවේ. ඒ සඳහා මණ්ඩලයේ අප සියලු දෙනාටම අවශ්‍ය ශක්තිය ඇති බව මම විශ්වාස කරමි.වසර 27 ක කාලයක් පුරා ක්‍රියාත්මකව පවතින ශ්‍රී ලංකා සමාජ ආරාක්ෂණ මණ්ඩලයේ සියලුම නිලධාරීන්ගේ සහයෝගය සහ උනන්දුව , කැපවීම මඟින් මෙපමණ කාලයක් අඛණ්ඩව ජනතාවට සේවය කරමින් මෙහි ජයග්‍රහණ ලබා ගැනීම සඳහා ප්‍රධාන වශයෙන් සහයෝගය ලබාදුන් සියලුම නිලධාරීන් වෙත කෘතඥතාව පිරිනැමීමට ද මෙය අවස්ථාවක් කරගනිමි.

ඉංජිනේරු ශාන්ත දික්වැල්ල මහතා
සභාපති
ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
2024.07.1

5.අධ්‍යක්ෂ මණ්ඩලය - 2023



ඉංජිනේරු ශාන්ත දික්වැල්ල මහතා
සභාපති
ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය



ඩඩ්.එම්.සුනිල් ශාන්ත වීරසේකර මහතා
ක්‍රියාකාරී අධ්‍යක්ෂක
ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
(2023.02.09 දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික තනතුරේ කටයුතු කර ඇත)



එම්.එෆ්.ඒ.මුබාරක් මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික -භාණ්ඩාගාර නියෝජිත
(2023.06.26 දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික තනතුරේ කටයුතු කර ඇත)



නීතිඥ ජානක රත්නායක මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
(2023.02.09 දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික තනතුරේ කටයුතු කර ඇත)



ආචාර්ය ධම්මික දිසානායක මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
(2023.10.27 දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික තනතුරේ කටයුතු කර ඇත.)



ඉංජිනේරු අරුණ කුමාරවඩු මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික




ජී.ඩී.එන්.එස් ගමගේ මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
(2023.05.10 සිට 2023.08.31 දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික තනතුරේ කටයුතු කර ඇත)



එච් .ඒ. බෝගොඩගෙදර මහත්මිය
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



කේ.කේ.ඩී.කුමාරසිරි කන්නන්ගර මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
(2023.05.10 සිට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික තනතුරේ කටයුතු කරනු ඇත.)



කේ.එච්.වී ජයතිලක මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
(2023.05.10 සිට අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු කරනු ඇත.)



කේ.කේ.ඒ. කපුරුබණ්ඩාර මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
(2023.12.08 සිට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික තනතුරේ කටයුතු කරනු ඇත.)



කේ.කේ. ගජපාල මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
(2023.12.08 සිට අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු කරනු ඇත.)

6.සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය



ශ්‍රීමත් විලියම් නෙල්සන් අයිවන් ජෙනික්ස් මහතාගේ සභාපතීත්වයෙන් යුත් සමාජ සේවා කොමිෂන් සභාව විසින් 1947 දී එළි දැක්වූ සමාජසේවා කොමිෂම් සභා වාර්තාව මඟින් ශ්‍රී ලංකාවේ නූතන සමාජ ආරක්ෂණ වැඩපිළිවල සඳහා පසුබිම සකස් වී ඇත. එතැන් පටන් ආරම්භ වූ සමාජ ආරක්ෂණ වැඩපිළිවෙලේ ඉදිරි පියවරක් ලෙස 1996 වර්ෂයේදී ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය ස්ථාපිත විය. ඒ වනවිට විධිමත් සමාජ ආරක්ෂණ වැඩපිළිවෙලකින් ආවරණය නොවූ මිලියන 4 කට අධික වූ ශ්‍රම බලකායකින් සමන්විත වූ ස්වයං රැකියා නියුක්තිකයින් සඳහා විධිමත් විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ වැඩපිළිවෙලක් ආරම්භ කිරීමට මෙමඟින් හැකි විය. ඒ අනුව අද වනවිට ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් රැකවරණය අවශ්‍ය කණ්ඩායම් සඳහා අවශ්‍ය සමාජ ආරක්ෂණය ලබා දෙමින් සමාජ සවිබලගැන්වීම් කාර්යයට උර දී සිටී.

සමාජ ආරක්ෂණ වැඩපිළිවෙලකින් රටක පුරවැසියන් සුරක්ෂිතවීම එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ද මූලික මානව හිමිකමක් ලෙස හඳුනාගෙන ඇත. බටහිර රටවල්වල මෙන්ම දකුණු කොරියාව, ජපානය වැනි ආසියාතික රටවල දියුණු සමාජ ආරක්ෂණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මකවනු දැකිය හැකි අතර, එවැනි වැඩපිළිවෙලකින් ශ්‍රී ලාංකික පුරවැසියන් ද සුරක්ෂිත කිරීම අපගේ ඒකායන අභිප්‍රායයි.

2020 වසර අවසාන වනවිට අභියෝග රාශියකට මුහුණුදී තිබූ අපගේ විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය 2021, 2022 හා 2023 තුන් අවුරුදු කාලසීමාව තුළ ස්ථිරසාර සමාජ ආරක්ෂණ වැඩපිළිවෙලක් බවට පත්කිරීමට අපට හැකි විය.

2021 වර්ෂයේ 57,803 ක් ද, 2022 වර්ෂයේ 57,606 ක් ද, 2023 වර්ෂයේ 66,448 ක් ලෙස අඛණ්ඩව නව සාමාජිකයින් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සඳහා දායකකර ගැනීම වර්ධනයකර ගැනීමට අපට හැකි විය. එසේම 2021 වර්ෂයේ රු.මි.524,7 ක ආදායමකුත්, 2022 වර්ෂයේ රු.මි.685.7 ක ආදායමකුත්, 2023 වර්ෂයේ රු.මි.932.09 ක ආදායමකුත් පරිපාලන වියදම් දැරීමවලට අමතරව සමාජ ආරක්ෂණ අරමුදලට එකතු කිරීමට හැකි වූ අතර, පුරවැසියන් වෙත විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලෙස 2021 වර්ෂයේ රු.මි.380.8 කුත් , 2022 වර්ෂයේ රු.මි. 419.5 කුත්, 2023 වර්ෂයේ රු.මි. 439.1 කුත් පිරිනැමීමට හැකි විය.

ශක්තිමත් අරමුදලක් සහ ශක්තිමත් සමාජ ආරක්ෂණ වැඩපිළිවෙලක් ස්ථාපනය කිරීමේ අභියෝග ජය ගනිමින් ස්ථිරසාර සමාජ ආරක්ෂණ අරමුදලක් ස්ථාපනයකර ගැනීමට හැකි වූ අතර, එමඟින් සංචිත අරමුදලක් ඇතිකර ගැනීමට හැකිවීම තුළින් මණ්ඩලයේ ස්ථිර පැවැත්ම තහවුරු කිරීමට හැකි වී තිබේ.

තවද, දිස්ත්‍රික් මට්ටමේ කාර්යාලවලට පමණක් සීමා වී තිබූ සමාජ ආරක්ෂණ මණ්ඩල කාර්යාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ස්ථාපිත කිරීමට හැකි විය. එසේම නව යෝජනාක්‍රම ලෙස මනුසවි යෝජනා ක්‍රමය, නාවිකයා යෝජනා ක්‍රමය, කලාකරු යෝජනා ක්‍රමය සහ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන සඳහා සමාජ ආරක්ෂණ යෝජනාක්‍රමයක් ආදී විශේෂිත යෝජනා ක්‍රම සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකි විය. එසේම ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමේදී අප සමඟ සම්බන්ධ වී සහයෝගයෙන් කටයුතු කරන රාජ්‍ය නිලධාරීන් ජාලය අභිප්‍රේරණය කිරීම සඳහා දිරි දීමනා, සහතිකපත් හා කුසලාන පිරිනැමීම සඳහා අගැයීම් උත්සව පළාත් මට්ටමින් සහ දිස්ත්‍රික් මට්ටමින් පවත්වමින් ද පාසල් සිසුන්, වෘත්තීය පුහුණු ආයතනවල සිසුන් සඳහා ව්‍යවසායකත්වය සහ සමාජ ආරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම මඟින් ද පාසල් විෂය නිර්දේශයට සමාජ ආරක්ෂණය පිළිබඳ අගැයීම් ක්‍රියාකාරකම් ඇතුළත් කිරීමට හැකිවීම මඟින්ද සමාජ මාධ්‍ය, ගුවන් විදුලි, පුවත්පත් වැනි මාධ්‍ය


මඟින් ප්‍රචාරණය ලබාදීම මඟින් ද මෙම සමාජ ආරක්ෂණ වැඩපිළිවෙල වඩ වඩාත් සමාජගත කිරීමට මෙම වසරේ හැකි විය.

මණ්ඩලය සඳහා දීප ව්‍යාප්ත නවීන පරිගණක ජාලයක් හඳුන්වාදීමේ වැඩ කටයුතුත්, දායකයින්ගේ සියලු ලියකියවිලි ඩිජිටල් මාධ්‍යතුළ ගබඩාකර තැබීමේ කටයුතුත්, මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය ගොඩනැඟිල්ල සවිමත්කර අංග සම්පූර්ණ ගොඩනැඟිල්ලක් බවට පත් කිරීමේ කටයුතුත් මේ වනවිට ආරම්භකර පවතී. අපගේ සාමාජිකයින් සක්‍රීයව පවත්වා ගැනීමෙන් ඔවුන් විශ්‍රාම වැටුප් ලාභීන් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභීන් බවට පත් කිරීම සඳහාවන අඛණ්ඩ අභියෝගය සාර්ථකව ජය ගැනීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙල ද මේ වනවිට ආරම්භකර ඇත.

400 කට ආසන්න කාර්යය මණ්ඩලයක් මෙහෙයවමින් වාර්ෂිකව බිලියනයකට අධික මුදල් ප්‍රවාහයකුත් බිලියන 3.5 ක පමණ ආයෝජන ප්‍රවාහයකුත් විනිවිදභාවයෙන් යුක්තව කළමනාකරණය කර ගැනීමට හැකිවීම නිසා අප මණ්ඩලයේ 2023 වසර සඳහා විගණකාධිපතිවරයා විසින් තත්වාගණනය නොකළ මතයක් ඉදිරිපත් කිරීම අප මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු හා මූල්‍ය කළමනාකරණය ප්‍රශස්ත ආකාරයෙන් සිදු කිරීම පිළිබඳ සහතිකයක් වන අතර, ඒ අනුව රජයේ, දායකයින්ගේ සහ අනෙකුත් පාර්ශවයන්ගේ විශ්වාසය වඩාත් අප මණ්ඩලය වෙත තහවුරු වීමට එය නිසැක හේතුවක් වනු ඇත.


2023 වර්ෂයේ කටයුතු සාර්ථකකර ගැනීම සඳහා නායකත්වය හා මඟ පෙන්වීම් ලබාදුන් ගරු කැබිනට් අමාත්‍යතුමා, ගරු රාජ්‍ය අමාත්‍යතුමා, කාන්තා,ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඇතුලු අමාත්‍යාංශයේ නිලධාරී මණ්ඩලයත්, සභාපතිතුමන් ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩලයත්, කාර්යය මණ්ඩලයටත් අනෙකුත් අපගේ කොටස්කාර ආයතනවලින් ලැබුණු සහයෝගයත් ස්තුති පූර්වකව සිහිපත් කරමි.

විශ්‍රාම වැටුපකින් සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක ප්‍රතිලාභවලින් සුරක්ෂිත නොවූ තම සැදෑ සමයේ රැකවරණය හා යැපෙන්නන්ගේ රැකවරණය ශ්‍රී ලාංකික ජනතාවට සුරක්ෂිතකර සමාජ ආරක්ෂණයෙන් සවිබලගැන්වීම සඳහා රාජකාරියෙන් ඔබ්බට ගිය සමාජ වගකීමක් ලෙස සලකා එය ඉටු කිරීමට අප මණ්ඩලයේ කාර්යය මණ්ඩලය නිරන්තරයෙන් ඇපකැප වී සිටී.



සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
2024.05.21

7. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සංවිධාන ව්‍යුහය



8. "ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය" යනු කුමක්ද?

8.1. ව්‍යවස්ථාපිත අරමුණු

1999 අංක 33 දරණ පනතින් සංශෝධිත 1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත සහ 2006 සැප්තැම්බර් 25 දිනැති අංක 1464/ 05 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි අංක 04 අනුව විශ්‍රාම වැටුප් හිමිකම ලබා නොසිටින හෝ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් නොදරන, සියලු සේවා නියුක්තිකයන් වෙත සමාජ ආරක්ෂණ හා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ප්‍රධාන අරමුණ වේ.

ඒ අනුව,

- ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ට ඔවුන් වයෝවෘද්ධ කාලයේදී හෝ ඔවුන් යම් අශක්නුතාවයකය පත්වූ විට එම කාලයේදී ඔවුන්ට සමාජ ආරක්ෂණය සැලසීම.
- ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් මියගිය විට, ඔවුන්ගේ යැපැන්නන්ට සහන සැලසීම.
- ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ට ඔවුන්ගේ අදාළ වෘත්තීයවල යෙදෙන ලෙස දිරිමත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වැඩි දියුණු කිරීම.
- ස්වයං රැකියාවල යෙදෙන තරුණයන් දිරිමත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වැඩි දියුණු කිරීම.
- සකසුරුවම් වීම හා සම්පත් කළමනාකරණයේ ප්‍රතිලාභ පිළිබඳව ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් දැනුවත් කිරීම.
- ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම.

8.2. කාර්යභාරය

රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති තැනැත්තන් වෙත විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබාදීම ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කාර්යභාරය වේ.

1996 අංක 17 දරණ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ පනතේ ප්‍රකාරව 2006 සැප්තැම්බර් 25 දිනැති අංක 1464/5 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කරන ලද යෝජනාක්‍රම 06 ක් ක්‍රියාත්මක කරන ලදී.

ආර්ථික වශයෙන් ඵලදායී යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීම හා සාමාජිකයින් වෙත ඉහළ හා සුරක්ෂිත විශ්‍රාම වැටුපක රැකවරණය සැලසීම පෙරදැරිව වර්තමානය වන විට "සුරැකුම" යෝජනා ක්‍රමය ක්‍රියාවට නංවා ඇත.

සුරැකුම යෝජනා ක්‍රමය සඳහා වයස අවුරුදු 18 සිට 59 දක්වා රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති තැනැත්තන්ට දායකවිය හැකි අතර, වාරික ගෙවීමේ හැකියාව මත සාමාජිකයාට අවශ්‍ය ප්‍රමාණයක විශ්‍රාම වැටුප් ලබාගත හැකිය.

2012 ඔක්තෝම්බර් 11 දිනට යෙදී තිබුණ "ගැහැණු දරුවාගේ ජාත්‍යන්තර දිනය" ට සමගාමීව "ආරස්සාව" පූර්ව සැලසුම් සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී. එම යෝජනා ක්‍රමය සඳහා වයස අවුරුදු 18ට අඩු දරුවන්, සිය දෙමාපිය/ භාරකරු භාරකත්වය යටතේ සාමාජික කල හැකි අතර, වයස අවුරුදු 18 සම්පූර්ණ වූ පසු ඔවුන් සුරැකුම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට මාරුකර ගිණුමේ පවතින ශේෂය අනුව විශ්‍රාම වැටුප් හිමිකම ලබාදේ.

8.3. අපගේ සේවාවන්

රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති විවිධ වූ ඉලක්කගත කණ්ඩායම් සඳහා විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනාක්‍රම හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම ප්‍රධානතම සේවාව වේ .ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය මඟින් හඳුන්වා දී ඇති විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම කිහිපයකි.

8.3.1. ප්‍රධාන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම

- **"සුරැකුම"** විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනාක්‍රමය.
- **"ආරක්ෂාව"** පූර්ව සැලසුම් විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය.

8.3.2. විශේෂිත විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම

විශේෂිත ඉලක්කගත කණ්ඩායම් වෙනුවෙන් ඔවුන්ගේ අවශ්‍යතාවයන් අනුව හඳුන්වා දී ඇති සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම

- **“කලාකරු”** විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය.
- **“නාවිකයා”** සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය.
- **“මනුසවි”** සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය.
- **“බුදුපුත් මාපිය හරසර”** විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය.

8.4.යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ

- වයස අවුරුදු 60 සිට වයස අවුරුදු 80 දක්වා සාමාජිකයාට මාසිකව විශ්‍රාම වැටුප ලබාදීම.
- සාමාජිකයා විශ්‍රාමිකයෙකු ලෙස මියගිය විට සමාජිකයාගේ වයස අවුරුදු 80 දක්වා කලත්‍රයාට විශ්‍රාම වැටුප ගෙවීම.
- ස්ථිර අර්ධ අබලතාවක දී වයස අනුව ගැලපූ රු.25,000/- දක්වා පාරිතෝෂික මුදලක් සහ නියමිත වාරික ගෙවීමෙන් පසු වයස අවුරුදු 60 සිට විශ්‍රාම වැටුප
- ස්ථිර පූර්ණ අබලතාවක දී වයස අනුව ගැලපූ රු.50,000/- දක්වා පාරිතෝෂිකය සහ ශුද්ධ දායක මුදල හෝ අබලතාවට පත් වූ දිනයේ සිට ගෙවනු ලබන මාසික විශ්‍රාම වැටුප
- විශ්‍රාම ලැබීමට පෙර සාමාජිකයා මියගියහොත් යැපෙන්නන්ට එකවර ගෙවනු ලබන පාරිතෝෂිකයක් ලබාදීම.

යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලබාගැනීම මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා වෙනත් බලය පවරන ලද නිලධාරීන් මඟින් සිදුකළ හැකිය.

වාරික ගෙවීම ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, තැපැල් කාර්යාල හා බලය පවරන ලද ග්‍රාම නිලධාරීන් මඟින් හා මෙම මණ්ඩලයේ කාර්යාල මඟින් සිදුකළ හැකිය.

8.5. "සුරකුම" විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය



වයස අවුරුදු 18 ට වැඩි සහ 59 ට අඩු රජයේ විශ්‍රාම වැටුපක් සහිත රැකියාවක නොයෙදෙන පුද්ගලයන් සඳහා ක්‍රියාත්මකවන යෝජනා ක්‍රමයකි. මේ යටතේ සාමාජිකවීමට මනාප පුද්ගලයකුහට තම අවශ්‍යතාවය සහ දායක මුදල් ගෙවීමේ හැකියාව අනුව කැමති ඕනෑම ප්‍රමාණයක විශ්‍රාම වැටුපක් සකස්කර ගැනීමේ හැකියාව පවතී.

8.5.1. "සුරකුම" යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ

- **විශ්‍රාම වැටුප**

  ඔප්පුව කල්පිරුණු සාමාජිකයකු (වයස අවුරුදු 60 ඉක්මවූ) වෙත සිය ජීවිතාන්තය දක්වා ගිවිසගත් විශ්‍රාම වැටුප මාසිකව ගෙවනු ලැබේ. සාමාජිකයකු විසින් සියළු වාරික මුදල් නිසිපරිදි ගෙවා ඇති විට 100% ක විශ්‍රාම වැටුපක් හිමිවේ.

  ගිණුම කල්පිරෙන අවස්ථාවේදී ශුද්ධ ගිණුම් ශේෂය විශ්‍රාම වැටුපට සාපේක්ෂව 75% ත් 100% ත් අතර පවතී නම් එම වාරික මුදලට අනුරූපව ගලපන ලද විශ්‍රාම වැටුපක් ලබාගැනීමේ හැකියාව විශ්‍රාමිකයාට හිමිවේ.

- **කලත්‍රයාට විශ්‍රාම වැටුප**

  ඔප්පුව කල්පිරී මාසික විශ්‍රාම වැටුප ලබාගැනීම ආරම්භ කළ විශ්‍රාමිකයකු අවුරුදු 80 එළඹීමට පෙර මරණයට පත්වුවහොත් ඒ වනවිට ඔහුගේ/ඇයගේ කලත්‍රයා ජීවත්ව සිටීනම්, විශ්‍රාමිකයාට අවුරුදු 80 දක්වා ලබාගැනීමට නියමිතව තිබූ විශ්‍රාම වැටුප, විශ්‍රාමිකයාගේ වයස අවුරුදු 80 හෝ එකී කලත්‍රයා මිය යන දිනය යන දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා ලබාගැනීමට කලත්‍රයාට හිමිකම ලැබේ.

- **ස්ථීර අර්ධ අබලතාවය**

I. හදිසි අනතුරක හෝ රෝගයක ප්‍රතිඵලයක් වශයෙන් යම් දායකයකු

- එක් ඇසක පෙනීම නැතිවීම
- එක් අතක් නැතිවීමෙන් හෝ එක් අතක් ස්ථීර වශයෙන් අබලතාවයට පත්වීම හෝ
- එක් පාදයක් නැතිවීමෙන් හෝ එක් පාදයක් ස්ථීර වශයෙන් අබලතාවයට පත්වීම, එම දායකයා ස්ථීර අර්ධ අබලතාවයට පත්වූවකු ලෙස සැලකේ.

II. ප්‍රතිලාභය

විශ්‍රාම ලැබීමට පෙර දායකයා ස්ථිර අර්ධ අබලතාවයකට පත්වුවහොත් එකවර ගෙවනු ලබන රු. 6,000.00 සිට රු.25,000.00 දක්වා අර්ධ අබලතා පාරිතෝෂිකයක් සහ අදාළ වාරික මුදල් නොකඩවා ගෙවන්නේ නම් විශ්‍රාම ලබන වයසේ සිට ජීවිතාන්තය දක්වා ගෙවනු ලබන මාසික විශ්‍රාම වැටුපක් ලබාගත හැක. පාරිතෝෂිකය ලබාගෙන යෝජනා ක්‍රමයෙන් ඉවත් වන්නේ නම් පාරිතෝෂිකය සමඟ දායකයාගේ නමින් තැන්පත්ව ඇති ශුද්ධ දායක මුදල ද ආපසු ගෙවනු ලැබේ.

- **ස්ථිර පූර්ණ අබලතාවය**

I. යම් හදිසි අනතුරක හෝ රෝගයක ප්‍රතිඵලයක් වශයෙන් යම් දායකයෙකු

- අත්දෙකම නැතිවීමෙන් හෝ අත් දෙකම ස්ථිර වශයෙන් අබලතාවයට පත්වීමෙන්
- පා දෙකම නැතිවීමෙන් හෝ පා දෙකම ස්ථිර වශයෙන් අබලතාවයට පත්වීමෙන්
- ඇස් දෙකේම පෙනීම නැතිවීමෙන්
- එක් අතක් නැතිවීමෙන් හෝ ස්ථිර වශයෙන් අබලතාවයට පත්වීමෙන් සහ එක් පාදයක් නැතිවීමෙන් හෝ ස්ථිර වශයෙන් අබලතාවයට පත්වීමෙන්
- එක් අතක් හෝ පාදයක් නැතිවීමෙන් සහ එක් ඇසක පෙනීම නැතිවීමෙන් හෝ එක් පාදයක් හෝ අතක් ස්ථිර වශයෙන් අබලතාවට පත්වීමෙන් සහ එක් ඇසක පෙනීම නැතිවීමෙන් හෝ
- බෙල්ලෙන් පහල පූර්ණ පක්ෂඝාතයකට ලක්වීමෙන්, පීඩාවකට පත්වන අවස්ථාවක දායකයා ස්ථිර වශයෙන්ම පූර්ණ ආබාධිත තත්වයකට පත්වූවකු ලෙස සලකනු ලැබිය යුතුය.

II. ප්‍රතිලාභය

විශ්‍රාම ලැබීමට පෙර දායකයා ස්ථිර පූර්ණ අබලතාවයකට පත්වුවහොත් තම කැමැත්ත පරිදි එකවර ගෙවනු ලබන රු. 12,000.00 සිට 50,000.00 දක්වා පූර්ණ අබලතා පාරිතෝෂිකයක් හෝ අබලතාවයට පත්වූ දින සිට ජීවිතාන්තය දක්වා ගෙවනු ලබන මාසික විශ්‍රාම වැටුපක් ලබාගත හැක. පාරිතෝෂිකය ලබාගෙන යෝජනා ක්‍රමයෙන් ඉවත් වන්නේ නම් පාරිතෝෂිකය සමඟ දායකයාගේ නමින් තැන්පත්ව ඇති ශුද්ධ දායක මුදල ද ආපසු ගෙවනු ලැබේ.

- **මරණ පාරිතෝෂිකය**

විශ්‍රාම ලැබීමට පෙර මරණයට පත්වන සාමාජිකයකු වෙනුවෙන් රු. 25000/- දක්වා වූ මරණ පාරිතෝෂිකයක් සහ දායකයාගේ නමින් තැන්පත්ව ඇති ශුද්ධ දායක මුදල උරුමකරුවන් වෙත හිමිවේ.

- **ශුද්ධ දායක මුදල ආපසු ගෙවීම**

ඔප්පුව කල්පිරෙන අවස්ථාවේ දී,

I. ගෙවිය යුතු මුළු වාරික සංඛ්‍යාවෙන් 25% ත් 75% ත් අතර ප්‍රමාණයක් ගෙවා ඇත්නම්, ගෙවූ මුදල් ඊට අදාල පොලියද සමඟ (**ශුද්ධ දායක මුදල**) සාමාජිකයාට ආපසු ගෙවනු ලැබේ.

II. ගෙවිය යුතු මුළු වාරික සංඛ්‍යාවෙන් 75% ත් 100% ත් අතර ප්‍රමාණයක් ගෙවා ඇත්නම්, ඊට අනුරූපව ගලපන ලද විශ්‍රාම වැටුපක් ගෙවනු ලැබේ.

III. ගෙවිය යුතු මුළු වාරික සංඛ්‍යාවෙන් 25% කට වඩා අඩුවෙන් ගෙවා ඇත්නම්, ගෙවූ මුදල් මණ්ඩලය සතු වේ.

8.6. "ආරක්ෂාව" පූර්ව සැලසුම් යෝජනා ක්‍රමය



උපතේ සිට වයස අවුරුදු 17 දක්වාවන දරුවන් වෙනුවෙන් හඳුන්වා දී ඇති පූර්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයකි. මේ යටතේ දෙමාපිය/භාරකරුවකුගේ භාරකාරත්වය යටතේ දරුවන් සාමාජික කළ හැකි අතර, වයස අවුරුදු 18 වනවිට ගිණුම කල්පිරේ. එම කල්පිරුණු ගිණුම් ශේෂය පදනම්ව සුරැකුම යෝජනා ක්‍රමයට එකවර මුදල් ගෙවා දායකවීමේ පදනම යටතේ අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

8.6.1. "ආරක්ෂාව" පූර්ව සැලසුම් ක්‍රමයේ ප්‍රතිලාභ

අධ්‍යාපන කඩඉම් ප්‍රතිලාභ

I. 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් අවම දිස්ත්‍රික් පරිසාධන ලකුණු මට්ටම සම්පූර්ණ කර විභාග සමත්වීමේදී ගිවිසගත් මාසික විශ්‍රාම වැටුප් වටිනාකමින් 50% ක මුදලක් ප්‍රදානය කිරීම.

උදා. - රුපියල් 100,000ක විශ්‍රාම වැටුපක් නම් රුපියල් 50,000ක් හිමිවේ.

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ විෂයන් 5 කට විශිෂ්ඨ සාමාර්ථ සහිතව සියළුම විෂයන් සමත්වීමේදී ගිවිසගත් මාසික විශ්‍රාම වැටුප් මුදලට සමාන මුදලක් ප්‍රදානය කිරීම.

උදා. - රුපියල් 100,000ක විශ්‍රාම වැටුපක් නම් රුපියල් 100,000ක් හිමිවේ.

III අධ්‍යයන පොදු සහතික පත්‍ර(උසස් පෙළ) විභාගය සමත්ව ජාතික විශ්ව විද්‍යාලයකට ප්‍රවිෂ්ඨ ලද විට ගිවිසගත් විශ්‍රාම වැටුප් මුදල මෙන් දෙගුණයක් ප්‍රදානය කිරීම.

උදා. - රුපියල් 100,000ක විශ්‍රාම වැටුපක් නම් රුපියල් 200,000ක් හිමිවේ.

අනෙකුත් ප්‍රතිලාභ

දරුවාගේ වයස අවුරුදු වූ පසු ගිණුමේ පවත්නා ශේෂය දරුවා නමින් සම්පූර්ණ 18"සුරැකුම" විශ්‍රාම වැටුප් සැලසුමට මාරු කරනු ලබන අතර එදින සිට දරුවා "සුරැකුම" විශ්‍රාම වැටුප් සැලසුමට අදාළ පහත ප්‍රතිලාභ සඳහා හිමකම් ලබයි.

- වයස අවුරුදු 60 සිට ජීවිතාන්තය දක්වා මාසික විශ්‍රාම වැටුප
- කලත්‍රයා වෙත විශ්‍රාම වැටුප
- මරණ පාරිතෝෂික
- ස්ථිර අර්ධ අබලතා ප්‍රතිලාභ
- ස්ථිර පූර්ණ අබලතා ප්‍රතිලාභ

වෙනත් කොන්දේසි,

I. අධ්‍යාපන ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා වාරික වශයෙන් ගෙවීමේදී විභාගය පැවැත්වෙන දිනට වර්ෂයකට පෙර දායකත්වය ලබා තිබිය යුතු අතර එකවර ගෙවීමේදී විභාගය පැවැත්වෙන දිනට පෙර සාමාජිකත්වය ලබා තිබිය යුතුය.

II. ප්‍රතිඵල නිකුත් වී දින 90ක් ඇතුලත එම ඉල්ලීම ඉදිරිපත් කළ යුතුයි.

III. රු.10,000කට වැඩි විශ්‍රාම වැටුපක් සඳහා දායකත්වය ලබා තිබිය යුතුය.

9. ප්‍රධාන සංධිස්ථාන

1996

1996 වර්ෂයේ දී සුවසිරිපායේ පිහිටි සෞඛ්‍ය, මහාමාර්ග හා සමාජ සේවා අමාත්‍යාංශයේ දී 1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත යටතේ 1996 ඔක්තෝම්බර් මස 16 වන දින ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම පැවැත්වීමෙන් අනතුරුව සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කටයුතු ආරම්භ කිරීම.

ඉන් අනතුරුව බොරැල්ලේ පිහිටි සමාජ සේවා දෙපාර්තමේන්තු කාර්යාල ගොඩනැගිල්ල තුළ සමාජ සේවා අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය පිහිටුවන ලදී.

1997

1997 මාර්තු මාසයේ දී කොළඹ 06, ගාලු පාරේ, අංක 585 දරණ ස්ථානයේ පිහිටි ගොඩනැගිල්ල බදු ගිවිසුමක් මත කුලියට ගෙන මණ්ඩල කාර්යාලය එහි පිහිටුවීම දෙවන අදියර යටතේ සිදුවිය.

1999

1999 අංක 33 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය (සංශෝධන) පනත මඟින් මුල් පනත සංශෝධනය කරන ලදී.

2003

2003.07.01 දින සිට නුගේගොඩ, නාවල පාරේ, අංක 150 ඒ, දරණ ස්ථානයේ කාර්යාලය ස්ථාපනය කරන ලදී.

2006

2006.09.25 දිනැති අංක. 1464/5 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද රෙගුලාසි මත පදනම්ව ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩල මඟින් සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කර ඇත.

2012

2012 ඔක්තෝම්බර් 11 දිනට යෙදී තිබුණ "ගැහැණු දරුවාගේ ජාත්‍යන්තර දිනය" ට සමගාමීව "ආරස්සාව" පුර්ව සැලසුම් සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී.

2013

2013.03.06 දින ප්‍රධාන කාර්යාලය අංක 18, රාජගිරිය පාර, රාජගිරිය යන ලිපිනයේ මණ්ඩලය විසින් මිල දී ගත් ගොඩනැගිල්ලක ස්ථාපිත කරන ලද අතර, එය "සමාජ ආරක්ෂණ පියස" ලෙස නම් කෙරින. මෙමඟින් වඩාත් විශ්වාසදායි හා කාර්යක්ෂම සේවාවන් සැපයීමට හැකියාව ලැබී තිබේ. වර්තමානය වන විට සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකම දිස්ත්‍රික් කාර්යාල ස්ථාපිත කර සේවා කටයුතු වඩාත් පුළුල් කර ඇත.

2016

සමාජ ආරක්ෂණ ජාතික සම්මාන උත්සවය - 2016 පැවැත්වීම

2017

සමාජ ආරක්ෂණ ජාතික සම්මාන උත්සවය - 2017 පැවැත්වීම

2021

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ 25 වන සංවත්සර සැමරුම් උත්සවය 2021 ඔක්තෝම්බර් මස 28 වන දින උත්සවාකාරයෙන් පවත්වන ලදී.

මෙහි දී 25 වන සංවත්සර සැමරුම සනිටුහන් කරමින් තැපැල්පති රංජිත් ආරියරත්න මැතිතුමාගේ මූලිකත්වයෙන් විශේෂ සමරු කවරයක් සහ සමරු මුද්දරයක් නිකුත් කිරීම ද සිදුකරනු ලැබිය.

2022

විදේශ සේවා නියුක්තිකයින් වෙනුවෙන් ක්‍රියාත්මක “මනුසවි” විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාළව ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය හා විදේශ සේවා නියුක්ති කාර්‍යාංශය අතර අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී.

10.කළමනාකරණ සාකච්ජාව සහ විශ්ලේෂණ

10.1. 2023 වර්ෂයේ විශේෂ අවස්ථා සහ කළමනාකරණ විශ්ලේෂණය

01. "නාවිකයා" සමාජ ආරක්ෂණ ඔප්පු ප්‍රදානෝත්සවය

(2023.02.01 - වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශ ශ්‍රවණාගාරය)

රටට ආර්ථිකමය වශයෙන් ඉතා වැදගත් දායකත්වයක් සපයනු ලබන ව්‍යාත්තීය කණ්ඩායමක් වන වෙළඳ නාවික ප්‍රවාහන ක්ෂේත්‍රය ආශ්‍රිතව සේවා නියුක්ත නාවිකයින් වෙත ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය සහ වෙළඳ නාවික ලේකම් කාර්යාලය ඒකාබද්ධව ඉකුත් වර්ෂයේදී හඳුන්වාදුන් "නාවිකයා" සමාජ ආරක්ෂණ යෝජනාක්‍රමය සඳහා සේවායෝජක නැව් සමාගම්හි අනිවාර්යය වූ මුල්‍ය දායකත්වය මත සාමාජිකත්වය ලැබූ පළමු නාවිකයින් කණ්ඩායම සඳහා සමාජ ආරක්ෂණ ඔප්පු ප්‍රදානය 2022.02.01 දින පෙරවරුවේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශ ශ්‍රවණාගාරයෙදී පැවැත්විය

අන්තර්ජාතික කම්කරු සංවිධානයේ 2006 සමුද්‍රීය කම්කරු ප්‍රඥප්තියට අනුකූලව වෙළඳ නාවිකයන් සඳහා අවශ්‍ය සමාජ ආරක්ෂණය සැපයීම සඳහා හඳුන්වා දුන් මෙම සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නෛතික විධිවිධාන සලසා 2022 වර්ෂයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද අංක 2292/18–2022 ඇති විශේෂ ගැසට් පත්‍රය මගින් සැපයීමෙන් අනතුරුව ප්‍රථම සාමාජිකත්වය ලද නාවිකයින් කණ්ඩායම ලෙස ACME International Shipping (Pvt)Ltd මගින් රැකියාව සඳහා පිටත්ව යන සහ පිටත්ව ගිය 40 දෙනෙකුගෙන් යුත් නාවිකයින් පිරිසක් මේ සඳහා ඇතුළත් විය.

ඔප්පු ප්‍රදානෝත්සවය වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍ය ගරු අනුප පස්කුවල් මැතිතුමාගේ සහභාගිත්වයෙන් පැවැත්විය.

මෙම අවස්ථාව සඳහා කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යාංශය, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය, වෙළඳ නාවික ලේකම් කාර්යාලය, ACME International Shipping (Pvt)Ltd යන ආයතනයන්හි නිලධාරීන් රැසක් ද සහභාගී විය.





02. "ආරස්සාව" පළමු සාමාජිකා රශ්මි නිමේෂා දියණියට අධ්‍යාපන කඩයිම් ප්‍රතිලාභ

(2023.03.31 - සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශ ශ්‍රවණාගාරය)

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ අනුග්‍රාහකත්වයෙන් "ආරස්සාව" පූර්ව සැලසුම් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ප්‍රථම සාමාජිකාව වූ රශ්මි නිමේෂා දිරිය දියණිය විශ්ව විද්‍යාල වරම් හිමිකරගැනීම මත ඇයට හිමි රුපියල් ලක්ෂ 200,000.00 ක අධ්‍යාපන කඩඉම් ප්‍රතිලාභ ප්‍රදානය සහ පහ වසර ශිෂ්‍යත්ව විභාගය සමත්, විශ්වවිද්‍යාල වරම් හිමිකරගත් දරු දැරියන් වෙත ප්‍රතිලාභ ප්‍රදානය ඇතුලුව නව සාමාජිකත්වය ලද දරු දැරියන් වෙත විශ්‍රාම වැටුප් ඔප්පු ප්‍රදානය, සමාජ සවිබලගැන්වීම් ගරු රාජ්‍ය අමාත්‍ය අනුප පස්කුවල් මැතිතුමා සුරතින් 2023.03.31 දින සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශ ශ්‍රවණාගාරයෙ දී පැවැත්විය

මෙම අවස්ථාව සඳහා කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් යමුනා පෙරේරා මහත්මිය, එම අමාත්‍යාංශ අතිරේක ලේකම් (සංවර්ධන III) හේමා පෙරේරා මහත්මිය සහ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සභාපති පී.එස්.එස්.දික්වැල්ල මහතා ඇතුළු රාජ්‍ය නිලධාරීන් රැසක් ද සහභාගී විය.





03. සමාජ ආරක්ෂණයට කැප වූ නුවරඑළිය නිලධාරීන් අගයයි

රාජ්‍ය විශ්‍රාම වැටුපකට හිමිකම් නොකියන පිරිස් සඳහා ක්‍රියාත්මක විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ ක්‍රමය සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ වැඩිම දායකත්වය දැක්වූ රාජ්‍ය නිලධාරීන් ඇගයීමේ "සමාජ ආරක්ෂණ සම්මාන උළෙල 2023 - නුවරඑළිය" උත්සවය, දිස්ත්‍රික් ලේකම් නන්දන ගලබඩ මහතා සහ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ගරු සභාපති ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු පී.එස්.එස්. දික්වැල්ල මහතාගේ ප්‍රධානත්වයෙන් 2023.04.03 වන දින නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේදී පැවැත්විය.

මෙහිදී නුවරඑළිය දිස්ත්‍රික්කයේ සමාජ ආරක්ෂණ හිමිකම් ලබාදීම වෙනුවෙන් කැපවීමෙන් කටයුතු කළ ග්‍රාම නිලධාරීන් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, සමාජ සේවා නිලධාරීන් සහ පරිපාලන ග්‍රාම නිලධාරීන් ඇගයීමට ලක්විය. මෙහි දී ආරස්සාව යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලබා 5 වසර ශිෂ්‍යත්වය, අ.පොෂ සාමාන්‍ය පෙළ සහ අ.පොෂ උසස් පෙළ විභාගය සමත් වූ දරුවන් වෙත අධ්‍යාපන කඩයිම් ප්‍රතිලාභ ප්‍රදානය කිරීම ද, වයස 60 සම්පූර්ණ වූ වැඩිහිටි අය සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම ද සිදුවිය.

මෙම අවස්ථාවට ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී කේ.ඒ.එස්.ප්‍රසන්න කළුආරච්චි මහතා සහ අතිරේක දිස්ත්‍රික් ලේකම් සුජීවා බෝධිමාන්න මහත්මිය, දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්, ඇතුළු රාජ්‍ය නිලධාරීන් රැසක් සහභාගී විය.





04. ගම්පහ දිස්ත්‍රික් සමාජ ආරක්ෂණ සම්මාන උළෙල - 2023

රාජ්‍ය විශ්‍රාම වැටුපකට හිමිකම් නොකියන පිරිස් සඳහා ක්‍රියාත්මක විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ ක්‍රමය සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ගම්පහ දිස්ත්‍රික්කයේ වැඩිම දායකත්වය දැක්වූ රාජ්‍ය නිලධාරීන් ඇගයීමේ "සමාජ ආරක්ෂණ සම්මාන උළෙල 2023 - ගම්පහ" උත්සවය, දිස්ත්‍රික් ලේකම් සමන් දර්ශන පාඩිකෝරාළ මහතා සහ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ගරු සභාපති ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු පි.එස්.එස්. දික්වැල්ල මහතාගේ ප්‍රධානත්වයෙන් 2023.07.07 වන දින ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේදී පැවැත්විය.
මෙහිදී ගම්පහ දිස්ත්‍රික්කයේ සමාජ ආරක්ෂණ හිමිකම් ලබාදීම වෙනුවෙන් කැපවීමෙන් කටයුතු කළ ග්‍රාම නිලධාරීන් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, සමාජ සේවා නිලධාරීන් සහ පරිපාලන ග්‍රාම නිලධාරීන් ඇගයීමට ලක්විය. මෙහි දී ආරස්සාව යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලබා 5 වසර ශිෂ්‍යත්වය, අ.පොෙ.ස සාමාන්‍ය පෙළ සහ අ.පොෙ.ස උසස් පෙළ විභාගය සමත් වූ දරුවන් වෙත අධ්‍යාපන කඩයිම් ප්‍රතිලාභ ප්‍රදානය කිරීම ද, වයස 60 සම්පූර්ණ වූ වැඩිහිටි අය සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම ද සිදුවිය





05. උතුරු හා නැගෙනහිර පළාත් සමාජ ආරක්ෂණ සම්මාන උළෙල - 2023

රාජ්‍ය විශ්‍රාම වැටුපකට හිමිකම් නොකියන පිරිස් සඳහා ක්‍රියාත්මක විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ ක්‍රමය සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ උතුරු, නැගෙනහිර පළාත් හී වැඩිම දායකත්වය දැක්වූ රාජ්‍ය නිලධාරීන් ඇගයීමේ "සමාජ ආරක්ෂණ සම්මාන උළෙල 2023 - උතුරු හා නැගෙනහිර පළාත්" උත්සවය, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ගරු සභාපති ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු පි.එස්.එස්. දික්වැල්ල මහතාගේ ප්‍රධානත්වයෙන් 2023.07.13 වන දින ත්‍රිකුණාමලය JKAB හොටෙල් පරිශ්‍රයේදී පැවැත්විය.

මෙහිදී උතුරු, නැගෙනහිර පළාත් හී සමාජ ආරක්ෂණ හිමිකම් ලබාදීම වෙනුවෙන් කැපවීමෙන් කටයුතු කළ ග්‍රාම නිලධාරීන් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, සමාජ සේවා නිලධාරීන් සහ පරිපාලන ග්‍රාම නිලධාරීන් ඇගයීමට ලක්විය. මෙහි දී ආරස්සාව යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලබා 5 වසර ශිෂ්‍යත්වය, අ.පොෙ.ස සාමාන්‍ය පෙළ සහ අ.පොෙ.ස උසස් පෙළ විභාගය සමත් වූ දරුවන් වෙත අධ්‍යාපන කඩයිම් ප්‍රතිලාභ ප්‍රදානය කිරීම ද, වයස 60 සම්පූර්ණ වූ වැඩිහිටි අය සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම ද සිදුවිය.





06. බදුල්ල දිස්ත්‍රික් සමාජ ආරක්ෂණ සම්මාන උළෙල - 2023

රජයේ විශ්‍රාම වැටුපක් අහිමි ජනතාවගේ ජීවන තත්ත්වය සුරක්ෂිත කිරීම සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය වෙත සාමාජිකයින් බඳවාගනිමින් එය ව්‍යාප්ත කිරීමට දායකත්වය ලබා දුන් රාජ්‍ය නිලධාරීන් ඇගයීම සඳහා වූ ඇගයීම් උත්සවයක් (සම්මාන උළෙලක්) බදුල්ල දිස්ත්‍රික් ලේකම් ශ්‍රී පණ්ඩුක ප්‍රභාත් අභයවර්ධන මහතා හා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සභාපති ශාන්ත දික්වැල්ල මහතාගේ ප්‍රධාත්වයෙන් සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සමාජ ආරක්ෂණ) කල්හාරි ද සිල්වා මහත්මිය, සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) ෂර්මිලා ප්‍රනාන්දු මෙනවිය ඇතුළු තවත් රාජ්‍ය නිලධාරීන් රැසකගේ සහභාගිත්වයෙන් 2023.08.04 වන දින බදුල්ල දිස්ත්‍රික් ශ්‍රවනාගාරයේදී පැවැත්විය.

සම්මාන උළෙල තුළදී, 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලසීමාව තුළ සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී ඉහළ දායකත්වයක් දක්වන ලද ප්‍රාදේශීය ලේකම්වරු, ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ඇතුළු රාජ්‍ය නිලධාරීන් රැසක් ඇගයීමට ලක්විය.

එමෙන්ම මෙහිදී වයස 60 සම්පූර්ණ කළ සාමාජිකයින් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය සහ ආරම්භක සාමාජිකත්වය ලද දරු දැරියන් වෙත අධ්‍යාපන කඩයිම් ප්‍රතිලාභ ප්‍රදානයද සිදුකරන ලදී.





07. වෘත්තීය මාර්ගෝපදේශන හා රැකියාවිරහිත තරුණ තරුණියන් රැකියාගත කිරීමේ වැඩසටහන.

තරුණ තරුණියන් සඳහා **වෘත්තීය මාර්ගෝපදේශන හා** රැකියාගතකිරීමේ වැඩසටහනක් යුනියන් ඇෂුවරන්ස් රක්ෂණ සමාගමේ සම්පත් දායකත්වයත් ද සහිතව, මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී 2023 සැප්තැම්බර් මස 6 වන දින පැවැත්විණි.

මෙම වැඩසටහන යටතේ කළුතර දිස්ත්‍රික්කයේ මතුගම හා වලල්ලාවිට යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ අ.පොෂ. උසස් පෙළ හදාරා අවසන් සහ මේ වනවිට රැකියා විරහිත හෝ ස්ථීර රැකියාවක නොයෙදෙන තරුණ තරුණියන් 200 ක පිරිසක සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය, අලෙවිකරණය සහ නායකත්වය යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වැඩමළුවක් පැවැත්වීමටත් එම තරුණ කණ්ඩායම් සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සමාජ ආරක්ෂණ උපදේශකවරුන් ලෙස රැකියා සඳහා රැකියාගතකිරීමට ද කටයුතු කරන ලදී





8. මහනුවර දිස්ත්‍රික් සමාජ ආරක්ෂණ සම්මාන උළෙල - 2023

රාජ්‍ය විශ්‍රාම වැටුපකට හිමිකම් නොකියන පිරිස් සඳහා ක්‍රියාත්මක විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ ක්‍රමය සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ මහනුවර, මාතලේ, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ වැඩිම දායකත්වය දැක්වූ රාජ්‍ය නිලධාරීන් ඇගයීමේ "සමාජ ආරක්ෂණ සම්මාන උළෙල 2023 - මහනුවර" උත්සවය, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ගරු සභාපති ජ්‍යේෂ්ඨ ඉංජිනේරු පි.එස්.එස්. දික්වැල්ල මහතාගේ ප්‍රධානත්වයෙන් 2023.09.19 වන දින මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේ දී පැවැත්විය.

මෙහිදී මහනුවර දිස්ත්‍රික්කයේ සමාජ ආරක්ෂණ හිමිකම් ලබාදීම වෙනුවෙන් කැපවීමෙන් කටයුතු කළ ග්‍රාම නිලධාරීන් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, සමාජ සේවා නිලධාරීන් සහ පරිපාලන ග්‍රාම නිලධාරීන් ඇගයීමට ලක්විය. මෙහි දී ආරක්ෂාව යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලබා 5 වසර ශිෂ්‍යත්වය, අ.පොෂ සාමාන්‍ය පෙළ සහ අ.පොෂ උසස් පෙළ විභාගය සමත් වූ දරුවන් වෙත අධ්‍යාපන කඩයිම් ප්‍රතිලාභ ප්‍රදානය කිරීම ද, වයස 60 සම්පූර්ණ වූ වැඩිහිටි අය සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම ද සිදුවිය.




09. කුරුණෑගල දිස්ත්‍රික් සමාජ ආරක්ෂණ සම්මාන උළෙල - 2023

රාජ්‍ය විශ්‍රාම වැටුපකට හිමිකම් නොකියන පිරිස් සඳහා ක්‍රියාත්මක විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ ක්‍රමය සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩිම දායකත්වය දැක්වූ රාජ්‍ය නිලධාරීන් ඇගයීමේ "සමාජ ආරක්ෂණ සම්මාන උළෙල 2023 - කුරුණෑගල" උත්සවය, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ගරු සභාපති ජ්‍යේෂ්ඨ ඉංජිනේරු පි.එස්.එස්. දික්වැල්ල මහතාගේ ප්‍රධානත්වයෙන් 2023.10.17 වන දින කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේ දී පැවැත්විය.

මෙහිදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ සමාජ ආරක්ෂණ හිමිකම් ලබාදීම වෙනුවෙන් කැපවීමෙන් කටයුතු කළ ග්‍රාම නිලධාරීන් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, සමාජ සේවා නිලධාරීන් සහ පරිපාලන ග්‍රාම නිලධාරීන් ඇගයීමට ලක්විය. මෙහි දී ආරක්ෂාව යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලබා 5 වසර ශිෂ්‍යත්වය, අ.පොෂ සාමාන්‍ය පෙළ සහ අ.පොෂ උසස් පෙළ විභාගය සමත් වූ දරුවන් වෙත අධ්‍යාපන කඩයිම් ප්‍රතිලාභ ප්‍රදානය කිරීම ද, වයස 60 සම්පූර්ණ වූ වැඩිහිටි අය සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම ද සිදුවිය.




10. මාතර දිස්ත්‍රික් සමාජ ආරක්ෂණ සම්මාන උළෙල - 2023

රාජ්‍ය විශ්‍රාම වැටුපකට හිමිකම් නොකියන පිරිස් සඳහා ක්‍රියාත්මක විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ ක්‍රමය සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ මාතර දිස්ත්‍රික්කයේ වැඩිම දායකත්වය දැක්වූ රාජ්‍ය නිලධාරීන් ඇගයීමේ "සමාජ ආරක්ෂණ සම්මාන උළෙල 2023 - මාතර" උත්සවය, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ගරු සභාපති ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු පි.එස්.එස්. දික්වැල්ල මහතාගේ ප්‍රධානත්වයෙන් 2023.10.26 වන දින මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේ දී පැවැත්විය.

මෙහිදී මාතර දිස්ත්‍රික්කයේ සමාජ ආරක්ෂණ හිමිකම් ලබාදීම වෙනුවෙන් කැපවීමෙන් කටයුතු කළ ග්‍රාම නිලධාරීන් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, සමාජ සේවා නිලධාරීන් සහ පරිපාලන ග්‍රාම නිලධාරීන් ඇගයීමට ලක්විය. මෙහි දී ආරක්ෂාව යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලබා 5 වසර ශිෂ්‍යත්වය, අ.පොෂ සාමාන්‍ය පෙළ සහ අ.පොෂ උසස් පෙළ විභාගය සමත් වූ දරුවන් වෙත අධ්‍යාපන කඩයිම් ප්‍රතිලාභ ප්‍රදානය කිරීම ද, වයස 60 සම්පූර්ණ වූ වැඩිහිටි අය සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම ද සිදුවිය.





11. ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන පුහුණු වැඩසටහන් මාලාව

තරුණ ප්‍රජාව ස්වයං රැකියා සඳහා යොමුවීම දිරිමත් කිරීම, ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතාවයන් වැඩිදියුණු කිරීම සඳහා වූ වැඩසටහන් මාලාවක් ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන කේන්ද්‍ර කරගනිමින් සංවිධානය කරන ලදී. ඒ අනුව යක්කල, අත්තනගල්ල, කටුනායක, දිවුලපිටිය හා බුලත්සිංහල ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානයන්හි පුහුණුව ලබන තරුණ තරුණියන් වෙත ස්වයං රැකියා සඳහා යොමු වීම දිරිමත් කිරීම, ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වාදීම සඳහා වූ එම වැඩසටහන් පවත්වන ලදී.





12. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණු වැඩසටහන් මාලාව

තරුණ ප්‍රජාව ස්වයං රැකියා සඳහා යොමුවීම දිරිමත් කිරීම, ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතාවයන් වැඩිදියුණු කිරීම සඳහා වූ වැඩසටහන් මාලාවක් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ, පුහුණු මධ්‍යස්ථාන කේන්ද්‍ර කරගනිමින් සංවිධානය කරන ලදී. ඒ අනුව බෙල්ලන්විල හා ගොතටුව පුහුණු මධ්‍යස්ථානයන්හි පුහුණුව ලබන තරුණ තරුණියන් වෙත ස්වයං රැකියා සඳහා යොමු වීම දිරිමත් කිරීම, ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වාදීම සඳහා වූ එම වැඩසටහන් පවත්වන ලදී.





10.2.මුළු බඳවා ගැනීම් එකතුව පදනම්ව ඉහළම ප්‍රගතිය වාර්තාකළ සම්බන්ධීකරණ නිලධාරීන් - 2023

අනු අංක	දිස්ත්‍රික්කය	සම්බන්ධීකරණ නිලධාරි නම	මුළු බඳවා ගැනීම්
1	අම්පාර	එස්.ටී.සුදාකරන් මයා	8,950
2	මඩකලපුව	ඒ.එම්.අමීන් මයා	5,769
3	යාපනය	ටී. සංකර් මයා	5,022
4	නුවරඑළිය	යූ.ජී.එම්.ඩී.ජයලත් මයා	3,474
5	කුරුණෑගල	එස්.පී.ඒ.එස්.පතිරණ මිය	3,223
6	මහනුවර	රසික සංජීලා සෙනෙවිරත්න මිය	3,092
7	මාතර	බී.ජී.අමිල ගමගේ මයා	2,733
8	යාපනය	ටී.පරනන් මයා	2,504
9	කුරුණෑගල	එච්.එම්.පී.බණ්ඩාර මයා	2,319
10	කිලිනොච්චිය	කේ.නිදර්සන් මයා	2,312

10.3. පළමු වාරික මුදල් රැස්කිරීම්හි එකතුව පදනම්ව ඉහළම ප්‍රගතිය වාර්තාකළ සම්බන්ධීකරණ නිලධාරීන් - 2023

අනු අංක	දිස්ත්‍රික්කය	සම්බන්ධීකරණ නිලධාරි නම	මුළු මුදල (රු.)
1	යාපනය	ටී. සංකර් මයා	33,998,116.00
2	යාපනය	ටී.පරනන් මයා	11,449,718.00
3	මඩකලපුව	ඒ.එම්.අමීන් මයා	10,447,160.00
4	කුරුණෑගල	එස්.පී.ඒ.එස්.පතිරණ මිය	8,858,946.00
5	අම්පාර	එස්.ටී.සුදාකරන් මයා	6,565,845.00
6	වව්නියාව	ආර්.රමේෂ් මයා	6,259,713.00
7	බදුල්ල	එම්.වී.ඒ.තිලිණ හසංක මයා	5,136,126.00
8	බදුල්ල	රුවාෂා මෙය	4,196,796.00
9	නුවරඑළිය	යූ.ජී.එම්.ඩී.ජයලත් මයා	3,843,120.00
10	කුරුණෑගල	එච්.එම්.පී.බණ්ඩාර මයා	3,745,527.00

10.4. අනුමත කාර්යය මණ්ඩලය හා පුරප්පාඩු

1999 සිට වරින්වර සේවක මාරුවීම්, ඉල්ලා අස්වීම් නිසා පුරප්පාඩු දිගින් දිගටම පැවති අතර, එවකට සේවයේ යෙදී සිටි ස්ථිර කාර්යය මණ්ඩලය 179 දෙනෙකි. තනතුරු අනුව එම සේවක සංඛ්‍යාව බෙදී ඇති අයුරු පහත වගුවේ දැක්වේ. කාර්යය මණ්ඩලයේ ප්‍රමාණවත් නොවීම මත ආයතනයේ ප්‍රගතිය අපේක්ෂිත මට්ටමට ළඟා නොවන බැවින්, කටයුතු වඩාත් පුළුල් කිරීම සඳහා 198 කින් සමන්විත නව කාර්යය මණ්ඩලයක් සඳහා මහා භාණ්ඩාගාරය විසින් අනුමැතිය ලබා දී ඇති අතර, අදාළ බඳවාගැනීමේ පටිපාටිය සකස් කර වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2012.09.14 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සමාජ ආරක්ෂණ මණ්ඩලයේ බඳවාගැනීම් පරිපාටිය අනුමත කරන ලදී.

2023.12.31 දින වන විට ආයතනයේ පුරප්පාඩු 45ක් පවතින අතර, මුදල් අමාත්‍යාංශය විසින් 2021.08.28 දින යොමු කරන ලද අංක MF/NB/07/CM/2021/163 අංක දරණ රාජ්‍ය වියදම් සමාලෝචනය නමින් යොමුකර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශය හා 2021.09.06 දින සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මඟින් රාජ්‍ය වියදම් සමාලෝචනය නමින් යොමුකර ඇති අංක SMS/ACC/11/Budget / 2022 දරණ ලිපිය මඟින් සේවක බඳවාගැනීම් කල්තබා ඇති බැවින්, මෙම පුරප්පාඩු වූ තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට නොහැකි වී ඇත.

10.5. අනුමත කාර්යය මණ්ඩලය වැඩි කිරීම හා පුරප්පාඩු පිරවීම

මුදල් අමාත්‍යාංශය විසින් 2021.08.28 දින යොමු කරන ලද අංක MF/NB/07/CM/2021/163 අංක දරණ රාජ්‍ය වියදම් සමාලෝචනය නමින් යොමුකර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශය හා 2021.09.06 දින සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මඟින් රාජ්‍ය වියදම් සමාලෝචනය නමින් යොමුකර ඇති අංක SMS/ACC/11/Budget / 2022 දරණ ලිපිය මඟින් සේවක බඳවාගැනීම් කල්තබන ලෙස උපදෙස් ලබාදී ඇති බැවින්, පුරප්පාඩුව පවතින තනතුරු සඳහා බඳවාගැනීම් නවත්වා ඇති අතර, අත්‍යවශ්‍ය තනතුරු සඳහා අනුමැතිය ලබාගෙන බඳවාගැනීම් සිදුකරන ලදී. ඒ අනුව, පුරප්පාඩු වූ තනතුරු සඳහා බඳවා ගැනීම් ඉදිරියේදී සිදුකර ඉහළ සේවා ඵලදායිතාවක් ළඟා කරගැනීමටත් කටයුතු සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

කාර්යය මණ්ඩල විශ්ලේෂණය - 2023 වර්ෂය (2023.12.31 දිනට)

අනු අංකය	තනතුරු නාමය	අනුමත	දැනට සිටින	පුරප්පාඩු
1	සාමාන්‍යාධිකාරී	1	1	0
2	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)	1	0	1
3	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සමාජ ආරක්ෂණ)	1	1	0
4	සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය)	1	1	0
5	සහකාර සාමාන්‍යාධිකාරී (බඳවා ගැනීම් හා දිස්ත්‍රික් පරිපාලන)	1	1	0
6	සහකාර සාමාන්‍යාධිකාරී (පාලන)	1	0	1
7	සහකාර සාමාන්‍යාධිකාරී (විශ්‍රාම වැටුප්/රක්ෂණ)	1	1	0
8	අභ්‍යන්තර විගණක	1	1	0
9	කළමණාකරු (පාලන)	1	1	0
10	කළමණාකරු (ඔප්පු සේවා)	1	1	0
11	කළමණාකරු (රක්ෂණ)	1	1	0
12	ගිණුම් නිලධාරී (මූල්‍ය)	1	1	0
13	සමාජ ආරක්ෂණ නිලධාරී (ප්‍රචර්ධන)	1	1	0
14	සමාජ ආරක්ෂණ නිලධාරී (විශ්‍රාම වැටුප්)	1	1	0
15	සමාජ ආරක්ෂණ නිලධාරී (තොරතුරු තාක්ෂණ)	1	0	1
16	ගිණුම් නිලධාරී (රැස්කිරීම්)	1	0	1
17	ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරී	6	5	1
18	විගණන නිලධාරීන්	2	0	2
19	සම්බන්ධීකරණ නිලධාරීන්	49	36	13
20	විමර්ශන නිලධාරීන්	2	1	1
21	දත්ත පරිපාලක	1	0	1
22	පරිගණක ජාල සහකරු	1	0	1
23	පරිගණක වැඩසටහන් සහකාර (මෘදුකාංග)	1	1	0
24	පරිගණක වැඩසටහන් සහකාර (දෘඩාංග)	1	1	0
25	පොත් තබන්නා	2	1	1
26	කළමනාකරණ සහකාර	74	55	19
27	රියදුරු	9	7	2
28	කාර්යාල කාර්ය සහායක	34	34	0
එකතුව		**198**	**153**	**45**

ස්ථානය අනුව කාර්යය මණ්ඩලය

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සේවකයින් 159න් 70 ක් ප්‍රධාන කාර්යාලයට අනුබද්ධව සේවය කරන අතර, සේවකයින් 83ක් සමාජ ආරක්ෂණ මණ්ඩල දිස්ත්‍රික් කාර්යාලයන්හි විහිදී සිටී.

ප්‍රධාන කාර්යාලය - 70
දිස්ත්‍රික් කාර්යාල - 83
එකතුව - 153

10.6. 2023 වර්ෂයේ අස්වීම් හා විශ්‍රාම යාම්

අනු අංකය	තනතුර	නම	අස්වීම් හා විශ්‍රාම යාම් දිනය	විස්තරය
1	දත්ත පරිපාලක	කසුන් හසක මයා	2023.01.13	ඉල්ලා අස්වීම.
2	කළමනාකරණ සහකාර	මනෝරි විජේරත්න මිය	2023.01.30	ඉල්ලා අස්වීම
3	කළමනාකරණ සහකාර	නිසංකා සමීරණී මිය	2023.03.06	ඉල්ලා අස්වීම
4	කළමනාකරණ සහකාර	එච්. ඒ. එස්. හර්ෂණී හපුආරච්චි	2023.03.30	ඉල්ලා අස්වීම
5	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)	එස්.ඩබ්. ලක්ෂ්මන් මයා	2023.04.09	ඉල්ලා අස්වීම
6	ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරී	එම්.එම්.මහබූර් මයා	2023.09.15	විශ්‍රාම යාම
7	විමර්ශන නිලධාරී	සචිනි ගුණරත්න මෙය	2023.09.30	ඉල්ලා අස්වීම.
8	අභ්‍යන්තර විගණන නිලධාරී	නදීමා තිරාණගමගේ මිය	2023.10.31	ඉල්ලා අස්වීම.
9	අභ්‍යන්තර විගණන නිලධාරී	මහේෂ් අමරසිරිවර්ධන මයා	2023.11.06	ඉල්ලා අස්වීම.
10	සම්බන්ධීකරණ නිලධාරී	ටී.පරනන් මයා	2023.11.13	ඉල්ලා අස්වීම
11	සමාජ ආරක්ෂණ නිලධාරී (තොරතුරු තාක්ෂණ)	එෂානි ගුණවර්ධන මෙය	2023.11.17	ඉල්ලා අස්වීම.

10.7.පුහුණුව හා සංවර්ධනය

2023 වර්ෂයේ පැවැත් වූ පාඨමාලා සම්බන්ධ විස්තර

අනු අංකය	පාඨමාලාවේ නම	පැවැත් වූ දිනය	අදාළ නිලධාරීන්	සම්පත් දායකත්වය	පැවැත්වූ ස්ථානය	වැය වූ මුදල (රු.)
01.	අලෙවිකරණ උපාය මාර්ග සම්බන්ධ වැඩමුළුව	2023.05.22	මාණ්ඩලික නිලධාරීන්, කළමණාකරුවන්, සමාජ ආරක්ෂණ නිලධාරීන්,ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරීන්,සම්බන්ධීකරණ නිලධාරීන් සහ කලාකරුවන් = **50**	ප්‍රවීණ කලා ශිල්පී, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී උද්දික ප්‍රේමරත්න මැතිතුමාගේ සහ ජාතික උරුම, ප්‍රසංග කළා, ග්‍රාමීය කළා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ උපදේශක ආචාර්ය ප්‍රේමසිරි ගමගේ ආචාර්ය ප්‍රේමසිරි ගමහේ මයා	අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ	**29,800.00**
02.	අලෙවිකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව	2023.11.10	1.ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරීන් 04 2.සම්බන්ධීකරණ නිලධාරීන් 24 3.සමාජ ආරක්ෂණ උපදේශකයන් : 42 4.ප්‍රධාන කාර්යාලීය නිලධාරීන් 15 **එකතුව : 85**	K.L.M.T.D.ඩයස් මහතා (අලෙවිකරණය පිළිබඳ දේශක)	ග්‍රාම සංවර්ධන පුහුණු පර්යේෂණ ආයතන ශ්‍රවණාගාරයේ - බොරැල්ල	**216,500.00**
03.	කාර්යාල ක්‍රම සම්බන්ධ පුහුණු වැඩසටහන	2023.11.15	ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාලයන්හි කළමනාකරණ සහකාර නිලධාරීන් භෞතික - 24 මාර්ගගත ක්‍රමය - 26 එකතුව - **50**	ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ, ආර්.කේ.සමන් අනුර මහතා	ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය - ප්‍රධාන කාර්යාලය 3 වන මහලේ.	8,330.00 650.00 **8,980.00**
04.	මුදල් රෙගුලාසි සම්බන්ධ පුහුණු වැඩසටහන	2023.11.29	ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාලයන්හි කළමනාකරණ සහකාර නිලධාරීන්,ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් භෞතික - 50 මාර්ගගත ක්‍රමය - 26 එකතුව - **76**	ආගමන හා විගණන දෙපාර්තමේන්තුවේ සුමිත් ජේ කුමාර මහතා	ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය - ප්‍රධාන කාර්යාලය 3 වන මහලේ.	**14,320.00**
	වැය වූ මුළු මුදල					**269,600.00**

11. මණ්ඩලයේ කොටයාශ / අංශ / ඒකකවල කාර්යයන්

11.1. පාලන අංශය

11.1.1.පාලන අංශයේ ප්‍රධාන කාර්යයන්

මණ්ඩලයේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේ දී ආයතනික පරිපාලන කටයුතු හා පරිපාලන ව්‍යුහය ශක්තිමත්ව හා ඵලදායීව පවත්වාගෙන යාම පරිපාලන අංශය වෙත පැවරී තිබේ. ආයතනයේ භෞතික හා මානව සම්පත් සංවර්ධනය සඳහා සැලසුම්කරණය, සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දෙනු ලබන නියෝග ක්‍රියාත්මක කිරීම, රජය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛන ප්‍රකාරව කටයුතු කිරීම හා අනෙකුත් සේවා අංශයන්ගේ කටයුතු වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීමට අවශ්‍ය සහයෝගය පාලන අංශය විසින් ලබා දීමේ දී පහත සඳහන් මූලික කාර්යභාරයන් ඉටු කරනු ලැබේ.

1. අනුමත බඳවා ගැනීම් පරිපාටිය අනුව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, පුහුණු කිරීම, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම, වැටුප් වර්ධක ලබා දීම, වැටුප් වැඩිකිරීමේ පරිවර්තන සිදු කිරීම සහ සුදුසුකම් සැපිරීමෙන් පසු උසස් වීම් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

2. ආයතනයේ සමස්ත කාර්ය මණ්ඩලයේ පුද්ගලික ලිපිගොනු නිසිලෙස නඩත්තු කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී විනය කටයුතු සිදු කිරීම.

3. ආයතනයේ ප්‍රවාහන කටයුතු, වාහන නඩත්තු කටයුතු, ආරක්ෂක සේවා, සනීපාරක්ෂක සේවා ලබා ගැනීමේ දී ගිවිසුම් ඇති කර ගැනීම.

4. වාර්ෂික වාර්තා, සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හා අනෙකුත් මාසික, ත්‍රෛමාසික සියලු වාර්තා සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු අමාත්‍යාංශය වෙත යොමු කිරීම.

5. දිවයින පුරා ඇති ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කටයුතු විධිමත් කර ගැනීම සඳහා අභ්‍යාසලාභී උපාධිධාරීන් 58000 ක් බඳවා ගැනීමේ රජයේ වැඩපිළිවෙල යටතේ බඳවා ගෙන ඇති උපාධිධාරීන් 230ක් අප ආයතනය වෙත අනුයුක්ත කර ඇති අතර, ඔවුන්ගේ ලිපිගොනු ආශ්‍රිත කටයුතු සිදුකිරීම.

6. බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව මඟින් බහුකාර්ය සංවර්ධන කාර්ය සහායක පුහුණුලාභීන් අප ආයතනය වෙත අනුයුක්ත කර ගැනීමට අදාළව ඉදිරි කටයුතු සිදුකරමින් අප ආයතනය වෙත නිලධාරීන් 06 දෙනෙකු අනුයුක්ත කර ඇති අතර, මෙම නිලධාරීන් සංඛ්‍යාව වැඩිකර ගැනීම සඳහා රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීමේ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුව වෙත ලිපියක් මඟින් ඉල්ලීම් සිදුකර ඇත.

7. වර්ෂ අවසාන කාර්ය සාධන වාර්තාව සකස්කර අමාත්‍යාංශය වෙත යොමු කිරීම.

8. තාක්ෂණික උපදේශන කමිටුව සඳහා අවශ්‍ය පත්‍රිකා සකස්කර ඉදිරිපත් කිරීම හා රැස්වීම් පැවැත්වීමේ කටයුතු සංවිධානය කිරීම.

9. මාසිකව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දෙන නියෝග ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

10. කාර්ය මණ්ඩලයේ දෛනික පැමිණීමේ වාර්තා ගොනු නඩත්තු කර ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාල 25 මාස 06කට වරක් නිවාඩු වාර්තා සියළුම කර්යමණ්ඩලයට නිකුත් කිරීම සහ මාසිකව වාර්තා ගොනු කිරීම.

11. කාර්යමණ්ඩලයේ අග්‍රහාර රක්ෂණ අරමුදලේ සාමාජිකත්වය ලබා ගෙන ඇති අයගේ රක්ෂණ වාරික මුදල් පිළිබඳ වාර්තා සකස් කර මාසිකව රක්ෂණ භාර අරමුදලට යොමු කිරීම හා රක්ෂණ ආවරණ ඉල්ලීම් සඳහා කඩිනමින් මුදල් ලබාගැනීමේ අවශ්‍ය කටයුතු කිරීම.

12. දෛනිකව ආයතනයට ලැබෙන සියළුම ලිපි ලේඛණ පරීක්ෂාකර බලා සභාපති, සාමාන්‍යාධිකාරී අදාළ අංශ ප්‍රධානීන් වෙත නොපමාව යොමු කිරීම මෙන්ම දිස්ත්‍රික් කාර්යාල හා අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වෙත යොමු කළ යුතු ලිපි හා පාර්සල් කඩිනමින් තැපෑලට යොමු කිරීම.

13. කාර්යමණ්ඩලයේ මාරු මණ්ඩල රැස්වීම් පවත්වා ඒ අනුව ස්ථානමාරුවීම් සඳහා අවශ්‍ය ලිපි නිකුත් කිරීම හා ආයතනයේ රාජකාරි අවශ්‍යතාවය මත සිදුකරන ස්ථාන මැරුවීම් සඳහා කටයුතු කිරීම.

14. මාසිකව,ත්‍රෛයි මාසිකව හා වාර්ථා ,අභ්‍යන්තර විගණන විමසුම් හා රජයේ විගණන විමසුම් සඳහා පිළිතුරු යොමු කිරීම හා විගණන රැස්වීම් සඳහා සහභාගි වීම.

15. තාක්ෂණික කමිටු රැස්වීම් සඳහා සහභාගි වීම ,අවශ්‍ය තාක්ෂණික කමිටු පත්‍රිකා සකස් කිරීම හා රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සපයා දීම.

16. අත්‍යවශ්‍ය ආයතනික කටයුතු සඳහා අවශ්‍ය කැබිනට් පත්‍රිකා සකස් කිරීම හා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම.

17. කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම.

11.1.2.පාලන අංශයේ සත්‍ය කාර්යය මණ්ඩලය

තනතුර	නිලධාරි සංඛ්‍යාව
සාමාන්‍යාධිකාරී	1
සහකාර සාමාන්‍යාධිකාරි (පාලන)	0
කළමනාකරු (පාලන)	1
කළමනාකරණ සහකාර	8
සභාපතිතුමාගේ ලේකම් (සංවර්ධන නිලධාරී)	1
කාර්යාල කාර්ය සහයක	2
කාර්යාල කාර්ය සහයක (සභාපතිතුමාට අනුයුක්ත)	1
තැපැල් කටයුතු (කාර්යාල කාර්ය සහයක)	1
රියදුරු	7

11.1.3. භෞතික සම්පත

ප්‍රධාන කාර්යාලය - 2013 මාර්තු මස 06 දින අංක 18, රාජගිරිය පාර, රාජගිරිය පිහිටි මහල් 04කින් යුත් මණ්ඩලයටම අයත් ගොඩනැගිල්ලක ස්ථාපිත කර ඇත.

දිස්ත්‍රික් කාර්යාල - දිවයින පුරා සියලු දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සමාජ ආරක්ෂණ දිස්ත්‍රික් කාර්යාල ස්ථාපනය කර ඇත.

11.1.4. සන්නිවේදන පහසුකම්

ආයතනය සඳහා ලබාගෙන තිබූ දුරකතන පද්ධතිය වැඩි දියුණුකර සෑම අංශයක්ම ආවරණය වන පරිදි නව ගොඩනැගිල්ලේ ස්ථාපනය කරන ලද අතර, ඒ සඳහා පොදු දුරකථන සම්බන්ධතා 03ක් ෆැක්ස් පහසුකම් ද සමඟ ස්ථාපනය කර ඇත. ඊට අමතරව පහත පරිදි සෘජු දුරකථන සම්බන්ධතා ලබා ගෙන ඇත.

සභාපති	-	සෘජු දුරකථන හා ෆැක්ස් අංක එකක්
සාමාන්‍යාධිකාරි	-	සෘජු දුරකථන හා ෆැක්ස් අංක එකක්
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි 02	-	සෘජු දුරකථන හා ෆැක්ස් අංක දෙකක්
සහකාර සාමාන්‍යාධිකාරි 03	-	දුරකථන තුනක්
අභ්‍යන්තර විගණක	-	දුරකථන එකක්
රැස්කිරීම් අංශය විසින් තැපැල් කාර්යාල හා සම්බන්ධ වීමට	-	දුරකථන තුනක් හා ඩයලොග් සිම්පත් එකක්
ක්ෂණික ඇමතුම්	-	දුරකථන එකක්
පොදු දුරකථන	-	දුරකථන දෙකක්

ඉහත දුරකථන සම්බන්ධතාවලට අමතරව දිස්ත්‍රික් කාර්යාල 25ක් සඳහා ද දුරකථන පහසුකම් ලබා දී ඇත. ප්‍රධාන කාර්යාලයේ පරිගණක ජාලගත පද්ධතිය ස්ථාපිත කරන ලද අතර, VPN පද්ධතියක් හරහා දිස්ත්‍රික් කාර්යාල වෙත ජාලගත කරමින් සේවා කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීමට පියවර ගෙන ඇත.

11.1.5. ප්‍රවාහන පහසුකම්

2023.12.31 දින වන විට කැබ් රථ 02 , කාර් රථ 02, වෑන් රථ 01, ත්‍රී රෝද රථ 01 හා යතුරු පැදි 14ක් ලෙස සියලුම වාහන 20ක් මණ්ඩලය සතුවේ.

එම වාහනවලින් කැබරථ 02 ක් 1997 හා 1998 යන වර්ෂවල මිලදී ගෙන ඇති අතර, කාර් රථය 2008 වර්ෂයේ දී ද, නිසාන් ජූක් කාර් රථය 2013 වර්ෂයේදී ද, බජාජ් වර්ගයේ ත්‍රී රෝද රථය 2013 වර්ෂයේදී ද, ටොයොටා හයිඒස් වෑන් රථය 2014 වර්ෂයේදී ද මිලදී ගෙන ඇත. එමෙන්ම බජාජ් වර්ගයේ යතුරු පැදි 09 ක් 2011 වර්ෂයේදී ද, අනිකුත් යතුරු පැදි 05 ක් 2014 වර්ෂයේදී මිලදී ගන්නා ලදී.

2017 වර්ෂයේ දී මෙහෙයුම් කල්බදු පදනම යටතේ සභාපතිතුමා වෙත ලබාගෙන ඇති ජීප් රථය 2024.11.20 දින දිර්ඝ කර ඇත. සාමාන්‍යාධිකාරීතුමා වෙත 2023.02.13 දින සිට වසර 03ක කාලයක් සඳහා මෝටර් රථයක් කල්බදු ක්‍රමයට ලබාගෙන ඇත.

11.1.5.1. දැනට තිබෙන වාහනවල විස්තර **(2023.12.31** දිනට)

වාහන අංකය	වර්ගය	පළමුව ලියාපදිංචි කල දිනය	ඉතා හොඳයි	හොඳයි	අළුත්වැඩියා කර ධාවන තත්ත්වයේ පවතී	අබලන්	ගර්හිත
250 - 6095	කැබ් රථය	1997.10.24			√		
252 - 5463	ඩබල් කැබ් රථය	1998.08.14			√		
KH- 4506	කාර් රථය	2008.09.30		√			
KX- 0914	නිසාන් ජූක් කාර් රථය	2013.10.17		√			
NB - 8428	ටොයොටා හයිඒස් වෑන් රථය	2014.08.18	√				
WP CAH-4984	ජීප් රථය TOYOTA-FORTUNER වර්ගයේ	2017.11.21	√				
WP AAG - 9346	බජාජ් වර්ගයේ ත්‍රී රෝද රථය	2013.04.18		√			
WP WK-3810	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06		√			
WP WK-3806	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06		√			
WP WK-3789	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06		√			
WP WK-3880	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06		√			
WP WK-3815	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06			√		
WP WK-3795	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06		√			
WP WK-3801	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06		√			
WP WK-3882	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06		√			
WP WK-	බජාජ් වර්ගයේ යතුරු	2011.04.06		√			

3787	පැදිය						
WP BAR-3240	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2014.01.27		√			
WP BAR-3263	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2014.01.27		√			
WP BAR-3250	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2014.01.27		√			
WP BAU-0765	ස්කූටි වර්ගයේ යතුරු පැදිය	2014.03.19		√			
WP BAU-0769	ස්කූටි වර්ගයේ යතුරු පැදිය	2014.03.19		√			
WP KJ 6856	ජීප් රථය	2011.06.13	√				
WP CAK 5812	Toyota – Axio මෝටර් රථය		√				

11.1.6. පාලන අංශයේ සීමාවන්

1. මේ වන විට ආයතනයේ පුරප්පාඩු 45ක් පවතින අතර, මුදල් අමාත්‍යාංශය විසින් 2021.08.28 දින යොමු කරන ලද අංක MF/NB/07/CM/2021/163 අංක දරණ රාජ්‍ය වියදම් සමාලෝචනය නමින් යොමුකර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශය හා 2021.09.06 දින සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මඟින් රාජ්‍ය වියදම් සමාලෝචනය නමින් යොමුකර ඇති අංක SMS/ACC/11/Budget / 2022 දරණ ලිපිය මඟින් සේවක බඳවාගැනීම් කල්තබන ලෙස උපදෙස් ලබාදී ඇති බැවින් ආයතනයේ අත්‍යවශ්‍ය බඳවාගැනීම් සිදුකිරීමට නොහැකි වී ඇත.
2. පවතින රථවාහන සංචිතය තුළ පැරණි වාහන අධික වීම හේතුවෙන් අළුත්වැඩියා වැය අධික වන නිසා නව වාහන මිල දී ගැනීමට කටයුතු කළ යුතු වේ.
3. දිස්ත්‍රික් කාර්යාල වෙත සේවා කටයුතු විමධ්‍යගත කිරීම සඳහා, භෞතික හා මානව සම්පත් අවශ්‍යතා සපුරාලීම.
4. ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ දැනට කාර්යය මණ්ඩලය සඳහා රැස්වීම් පැවැත්වීමට පහසුකම් නොමැති බැවින් ශ්‍රවණාගාරයක් ඉදිකිරීමට අවශ්‍යව කටයුතු සිදුකල යුතුව ඇත.
5. මෙම මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාල ස්ථාපිත කර ඇති අතර, මෙහෙයුම් කටයුතු සිදුකිරීමේ දී නිලධාරීන්ගේ ප්‍රවාහන රාජකාරී අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් වාහන නොමැති බැවින් ඒ සඳහා පහසුකම් ඇති කිරීම.
6. මණ්ඩලයේ සේවකයන්ගේ සුභසාධනය මෙන්ම රටේ පවතින ආර්ථිකමය තත්ත්වය හේතුවෙන් සහනදායී පොලී ණය ලබා ගැනීමේ ඇති හැකියාව අවම වීම හේතුවෙන් සේවක අතෘප්තිය ඇති වීම හා එසේ සේවකයන් සඳහා ණය ලබාදීම සඳහා මණ්ඩලය සතුව ප්‍රමාණවත් මුදල් සංචිත නොමැති වීම.

11.2. සමාජ ආරක්ෂණ අංශය

11.2.1. ප්‍රධාන කාර්යයන්

1. සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා එම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන නිලධාරීන් හා ඉලක්කගත ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු කිරීම.
2. යෝජනාක්‍රමය පිළිබඳ දැනුවත් කිරීමෙන් පසුව සාමාජිකත්වය ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.
3. සාමාජිකයින් සඳහා අවශ්‍ය වන පාස්පොත්, වාරික මුදල් ගෙවීම සහ හිමිකම් ඔප්පු නිකුත් කිරීම.
4. ප්‍රධාන කාර්යාලයේ සමාජ ආරක්ෂණ අංශය හා දිස්ත්‍රික් කාර්යාල 25ක් පරිපාලනය කරමින් සේවා කටයුතු කාර්යක්ෂම කිරීමට පියවර ගැනීම.
5. ආයතන, නිලධාරීන් හා විවිධ සංවිධාන සම්බන්ධීකරණය කරමින් විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.

11.2.2.ප්‍රතිලාභ ගෙවීම

1. සාමාජිකයාගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට ජීවිතාන්තය දක්වා අඛණ්ඩව මාසිකව විශ්‍රාම වැටුප ලබාදීම.
2. සාමාජිකයාගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වීමට පෙර සිදුවන සාමාජිකයාගේ මරණය වෙනුවෙන් යැපෙන්නන් සඳහා ප්‍රතිලාභ ගෙවීම , අර්ධ අබලතා, පූර්ණ අබලතා ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කිරීම.
3. “ආරක්ෂාව” පූර්ව සැලසුම් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ අතිරේක ප්‍රතිලාභ ගෙවීම.

11.2.3.සේවා ඒකකයන් හා දිස්ත්‍රික් කාර්යාල

ඔප්පු සේවා, විශ්‍රාම වැටුප් හා රක්ෂණ වශයෙන් ප්‍රධාන කාර්යාලයේ සේවා ඒකක 03ක් සහ සියළුම දිස්ත්‍රික්කවල පිහිටුවා ඇති කාර්යාල 25 මඟින් සේවා කටයුතු ඉටුකරනු ලබයි. දිස්ත්‍රික් කාර්යාල 25 කලාප 6කට බෙදා ජ්‍යෙෂ්ඨ සම්න්ධීකරණ නිලධාරීන් 06 දෙනෙකුගේ අධීක්ෂණය යටතේ කටයුතු කරනු ලැබේ.

11.2.4.යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධ වන නිලධාරීන්

දිස්ත්‍රික් කාර්යාල සඳහා සම්බන්ධීකරණ නිලධාරීන්, සහයක කාර්ය මණ්ඩල පත්කර ඇති අතර,ඔවුන් දිස්ත්‍රික් කටයුතු මෙහෙයවීම හා සම්බන්ධීකරණය හා සෘජු බඳවාගැනීම් කටයුතු සිදුකරනු ලබයි. කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය මඟින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් අනුයුක්ත කල සංවර්ධන නිලධාරීන් මඟින් ප්‍රදේශීය ලේකම් මට්ටමේ සම්බන්ධීකරණ කටයුතු සිදුකරනු ලබයි. එමෙන්ම විවිධ අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු හා ආයතන සමඟ ඒකාබද්ධව යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී එම නිලධාරීන්ගේ මැදිහත්වීම ලබා ගැනීමට කටයුතු කර ඇත.

11.2.5. සමාජ ආරක්ෂණ අංශයේ කාර්යය මණ්ඩලය

ප්‍රධාන කාර්යාලයේ සත්‍ය කාර්යය මණ්ඩලය

තනතුර		තනතුරු සංඛ්‍යාව
නි.සාමාන්‍යාධිකාරි (සමාජ ආරක්ෂණ)	-	01
ස.සාමාන්‍යාධිකාරි (බඳවාගැනීම් හා දිස්ත්‍රික් පරිපාලන)	-	01
ස.සාමාන්‍යාධිකාරි (විශ්‍රාම වැටුප්/රක්ෂණ)	-	01
කළමනාකරුවන් / සම්බන්ධීකරණ නිලධාරීන්		
කළමනාකරු (ඔප්පු සේවා)	-	01
කළමනාකරු (රක්ෂණ)	-	01
සමාජ ආරක්ෂණ නිලධාරි (විශ්‍රාම වැටුප්)	-	01
සම්බන්ධීකරණ නිලධාරීන්	-	02
කළමනාකරණ සහකාර	-	14
කාර්යාල කාර්ය සහයක	-	03
එකතුව		**25**


දිස්ත්‍රික් කාර්යාලයන්හි සත්‍ය කාර්යය මණ්ඩලය

තනතුර		තනතුරු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරී	-	06
සම්බන්ධීකරණ නිලධාරි	-	35
කළමනාකරණ සහකාර	-	21
කාර්යාල කාර්යය සහයක	-	24
එකතුව		**86**

11.2.6. සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය


2023 වර්ෂයේ දී සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දිස්ත්‍රික් මට්ටමින් බඳවාගත් නව සාමාජිකයන් පිළිබඳ ප්‍රගතිය

අනු අංකය	දිස්ත්‍රික්කය	2023 වර්ෂයේ බඳවා ගැනීම් (සාමාජිකයින්)	අනු අංකය	දිස්ත්‍රික්කය	2023 වර්ෂයේ බඳවා ගැනීම් (සාමාජිකයින්)
01	අම්පාර	8,940	14	කෑගල්ල	1,196
02	මඩකලපුව	7,779	15	පුත්තලම	1,113
03	යාපනය	7,707	16	රත්නපුරය	1,094
04	කුරුණෑගල	5,539	17	මොනරාගල	1,073
05	මහනුවර	5,276	18	නිකුණාමලය	1,051
06	නුවරඑළිය	4,944	19	කළුතර	899
07	මාතර	3,218	20	කොළඹ	795
08	මුලතිව්	2,585	21	හම්බන්තොට	675
09	බදුල්ල	2,342	22	පොළොන්නරුව	554
10	කිලිනොච්චිය	2,301	23	මාතලේ	546
11	වව්නියාව	2,186	24	අනුරාධපුරය	522
12	කෑගල්ල	2,157	25	ගාල්ල	443
13	පුත්තලම	1,274	26	ගම්පහ	239
එකතුව		56,248	එකතුව		10,200
මුළු එකතුව			66,448		



11.2.7. නව සාමාජිකයින් බඳවාගැනීමේ හා වාරික රැස්කිරීමේ වාර්ෂික ප්‍රගතිය.

අනු අංකය	වර්ෂය	නව බඳවාගැනීම් සංඛ්‍යාව	පළමු වාරික මුදල (රු.) (මිලියන)	වාර්ෂික වාරික රැස්කිරීම් (රු.) (මිලියන)
01	2013	8,769	7.24	150.37
02	2014	15,995	7.66	148.99
03	2015	21,599	13.79	146.38
04	2016	72,351	40.81	148.87
05	2017	63,141	36.84	170.96
06	2018	83,362	52.18	190.46
07	2019	38,543	37.26	198.04
08	2020	25,778	45.07	180.26
09	2021	57,803	126.33	177.57
10	2022	56,764	114.60	223.68
11	2023	66,448	145.25	246.99



11.2.8. 2023 වර්ෂයේ ප්‍රතිලාභ ගෙවීම

විස්තරය	සංඛ්‍යාව	වියදම (රු.)
විශ්‍රාම වැටුප් ගෙවීම්	35,191	407,000,980.00
මරණ පාරිතෝෂික ගෙවීම්	48	2,404,513.00
ආබාධිත පාරිතෝෂික ගෙවීම්	20	658,570.00
අතිරේක ප්‍රතිලාභ (5 වසර ශිෂ්‍යත්වය, අ.පො.ස: සා/පෙ, අ.පො.ස: උ/පෙ)	581	7,428,819.00
එකතුව	**35,854**	**417,492,882.00**

ශුද්ධ දායක මුදල් ආපසු ගෙවීම්	සංඛ්‍යාව	මුදල (රු.)
	574	**22,712,140.00**

11.2.9. 2023 වර්ෂයේ දායකයින්ගේ අය කළ මුදල්

බඳවාගැනීමේ මුල් වාරික රැස්කිරීම්	ලැබීම් (රු.)
බඳවාගැනීමේ මුල් වාරික මුදල	**145,258,044.61**

11.2.10. 2023 වර්ෂයේ පවත්වන ලද පුහුණු හා ජංගම දැනුවත් කිරීමේ වැඩසටහන

	සංඛ්‍යාව	වැය වූ මුදල (රු.)
විශ්‍රම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රවර්ධන වැඩසටහන්	126	2,033,106.00

11.2.11. සමාජ ආරක්ෂණ අංශයේ සීමාවන්

1. පුහුණුව ලත් ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සේවයෙන් ඉවත්වීම බහුලව පැවතීම හේතුවෙන් සේවක පිරිවැටුම ඉහළ අගයක් ගෙන ඇති අතර, නව නිලධාරීන් බඳවාගැනීම හා ඔවුන් පුහුණුකර සේවයේ යෙදවීමට සිදුවීම.

2. පරිගණක පද්ධතිය නිසිපරිදි ක්‍රියාත්මක නොවීම කාර්යක්ෂම සේවයක් ලබාදීම කෙරෙහි අහිතකර ලෙස බලපෑම් ඇතිකරන ලදී.

3. සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ප්‍රවර්ධනය හා ප්‍රචාරණ වියදම් සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම වර්ෂයේ ප්‍රගතියට සෘණාත්මකව බලපාන ලදී.
4. රටේ පවතින අර්බුධකාරී ආර්ථිකමය තත්වයන් හේතුවෙන් විශ්‍රාම සැලසුම් වැනි ආයෝජනයන් සඳහා දක්වන උනන්දුව ක්‍රමයෙන් අඩුවීම.

5. ප්‍රාදේශීය ලේකම් කාර්යවලට අනියුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන්ගේ ගමන් වියදම්, ලිපිද්‍රව්‍ය,කාර්යාල උපකරණ ඉල්ලීම් ඉටුකිරීම ඉතා අවම මට්ටමකින් පමණක් සිදුකිරීමට හැකිවීම.

11.3. මුදල් අංශය

11.3.1. ප්‍රධාන කාර්යයන්

- වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම.
- වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීම.
- මාසික අක්මුදල් වාර්තා පිලියල කිරීම (වාර්ෂික අයවැය ප්‍රසම්පාදන මත)
- 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන වලට අනුව වාර්ෂික මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා නියමිත වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.
- මහා භාණ්ඩාගාරයට, රේඛීය අමාත්‍යාංශයට හා කළමනාකරණ කාර්යයන් සඳහා අවශ්‍ය වන මුල්‍ය වාර්තාවන් වරින් වර පිළියෙල කිරීම.
- මුදල් අංශයට අදාල සියලුම ගිණුම් යාවත්කාලීන කිරීම.
- සියලුම ගණුදෙනු වලට අදාළ බැංකු ගිණුම් ක්‍රමානුකූලව පවත්වා ගෙන යාම සහ මාසික බැංකු සැසඳුම් වාර්තා පිලියෙල කිරීම.
- මාසික විශ්‍රාම වැටුප් සහ අනෙකුත් සියලුම දායක ගෙවීම් සිදුකිරීම සහ ගිණුම්ගත කිරීම.
- දායකයින්ගෙන් ලබාගන්නා මුදල් ඵලදායී ලෙස ආයෝජනය කිරීම.
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදු කිරීම තුළින් ආයතනය සතු ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තාවන් පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම.
- කාර්යය මණ්ඩලය සඳහා මාසිකව වැටුප් සැකසීම හා අදාළ වාර්තාවන් පිළියෙල කිරීම.
- කළමනාකරණයට අවශ්‍ය තීරණ ගැනීම සඳහා විධිමත් හා නිවැරදි තොරතුරු ලබාදීම.
- විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාළ සාමාජික මුදල් තැන්පතු භාර ගැනීම හා බැංකුගත කිරීම.
- මණ්ඩලය අවශ්‍ය සියලුම භාණ්ඩ හා සේවාවන් සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම.
- බැංකු සහ තැපැල් කාර්යාල මඟින් ලද දායක මුදල් මත දායක ගිණුම් යාවත්කාලීන කිරීම.
- වාර්ෂිකව සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාළ කටයුතු සිදු කිරීම.
- බදවාගැනීම් සහ දායක මුදල් රැස්කිරීම් මත දිරිදීමනා ගණනය කිරීම සහ අදාළ ගෙවීම් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- ආයතනයේ පුනරාවර්තන වියදම් සඳහා අවශ්‍ය සියලුම ගෙවීම් කටයුතු කළමනාකරණය කිරීම.
- ආයතනයේ භාණ්ඩ තොග පවත්වාගෙන යාම.
- ආයතනයේ අක්‍රිය දායකයින් සක්‍රිය කිරීමට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ආයතනයේ කාර්යමණ්ඩලය ලබාගන්නා ණය මුදල් පිළිබඳ ගිණුම් පවත්වාගෙන යාම.
- කලාකරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාළ ගිණුම් පවත්වාගැනීම හා කලාකරුවන්ට අදාළ ස්ථාවර තැන්පතු ගිණුම් විවෘත කිරීම.

11.3.2.මුදල් අංශයේ සත්‍ය කාර්යය මණ්ඩලය

තනතුර		නිලධාරීන් සංඛ්‍යාව
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)	-	-
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)	-	01
ගිණුම් නිලධාරී (මුදල්)	-	01
ගිණුම් නිලධාරී (රැස්කිරීම්)	-	-
පොත් තබන්නා	-	01
කළමනාකරණ සහකාර	-	11
කාර්යාල කාර්ය සහයක	-	02
එකතුව	-	**16**

11.3.3.ආයතනය සතු වත්කම්

අනු අංකය	විස්තරය	2023.12.31 දිනට වටිනාකම (රු.)
01	ගොඩනැගිලි	74,683,068.00
02	ඉඩම්	97,050,000.00
03	මෝටර් රථ	3,416,124.00
04	කාර්යාල උපකරණ	6,953,876.00
05	පරිගණක	3,109,095.00
06	සන්නිවේදන උපකරණ	-
07	පරිගණක මෘදුකාංග	-
08	වෙනත්	-
09	යන්ත්‍ර උපකරණ හා කාර්යාල උපකරණ	221,073.00
	එකතුව	**18,543,326.00**

11.3.4. 2023 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන

පුනරාවර්තන

භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන (2023) (රු.)	වියදම (රු.)
145,800,000.00	**138,106,840.00**

ප්‍රාග්ධන

භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන (2023) (රු.)	වියදම (රු.)
5,300,000.00	**1,599,651.13**

11.3.5.වෙනත් ළඟා කර ගැනීම්

සියලු වෙක්පත් ලිවීම් ගිණුම් සැකසීමේ කාර්යයන් හා වැටුප් සැකසීම් පරිගණක ගතකර ඇත.

වාර්ෂිකව රුපියල් මිලියන 407 ක් පමණ දායකයින් වෙත විශ්‍රාම වැටුප් ගෙවනු ලබන අතර දිවයින පුරා පිහිටි සමුපකාර ග්‍රාමීය බැංකු 2000ක් තුළින් විශ්‍රාම වැටුප් ගෙවීම සිදු කෙරේ.

දැනට දිවයින පුරා පිහිටි මහජන බැංකු, ලංකා බැංකු , ජාතික ඉතිරිකිරීමේ බැංකු, ප්‍රාදේශිය සංවර්ධන බැංකුව තුළින් හා තැපැල් කාර්යාල මඟින් දායකයින්ගේ මුදල් එකතුවීම සිදුවේ. විදේශ රටවල සේවා නියුක්තිකයන් වෙනුවෙන් නේවාසික විදේශ මුදල් ගිණුමක් ද (RFC) මහජන බැංකුවේ ආරම්භ කර ඒ හරහා ද දායකයින්ගේ වාරික මුදල් එකතු කිරීම සිදු කෙරේ.

11.4.අභ්‍යන්තර විගණන අංශය

11.4.1. ප්‍රධාන කාර්යයන්

- අනුමත සේවක සංඛ්‍යාව ,කාර්යය මණ්ඩල බදවා ගැනීම් සහ පුද්ගලික ලිපිගොනු පරීක්ෂාව
- කාර්යය මණ්ඩල පැමිණීම පිටවීම සහ නිවාඩු පරීක්ෂාව
- කාර්යමණ්ඩල පුහුණු සහ සංවර්ධන ක්‍රියාමාර්ග පරීක්ෂාව
- වාහන ධාවනය සහ නඩත්තු කටයුතු පරීක්ෂාව
- නඩත්තු කටයුතු හා සනීපාරක්ෂක සහ ආරක්ෂක සේවා කටයුතු පරීක්ෂාව
- භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීම් සහ දායක වාරික මුදල් ලැබීම් පරීක්ෂාව
- ප්‍රසම්පාදන කටයුතු පරීක්ෂාව
- අනිකුත් පුනරාවර්ථන සහ ප්‍රාග්ධන වියදම් පරීක්ෂාව
- බැංකු ගිණුම් සහ බැංකු සැසඳුම් පිළියෙළ කිරීම පරීක්ෂාව
- ආයෝජන කටයුතු පරීක්ෂාව
- ගිණුම් වාර්තා සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම, පරීක්ෂා කිරීම
- දායක බදවා ගැනීම් හා අයදුම්පත් පරිගණක ගත කිරීම හා ඔප්පු නිකුත් කිරීම සහ පරීක්ෂාව
- වාරික අයකිරීම, ප්‍රේෂණය සහ ගිණුම් ගත කිරීම පරීක්ෂාව
- ප්‍රතිලාභ ගෙවීම් කටයුතු පරීක්ෂාව
- දායකත්වයෙන් ඉවත්වීම සඳහා ගෙවීම් පරීක්ෂාව
- ප්‍රවර්ධන කටයුතු සහ වැඩසටහන් පරීක්ෂාවට ලක්කිරීම
- සැලසුම් සකස් කිරීම සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පරීක්ෂාව
- ක්ෂණික පරීක්ෂා කිරීම්
- දිස්ත්‍රික් කාර්යාල ඇතුළු ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම්
- විශේෂ පැවරුම්
- ජාතික විගණන කාර්යාල විගණන විමසුම් සහ වාර්තා සඳහා පිළිතුරු සැපයීම සම්බන්ධීකරණය
- පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම සම්බන්ධීකරණය

11.4.2.විෂය පථය

- අභ්‍යන්තර පාලන ව්‍යුහය, අධිකාරීත්ව සීමාවන් හඳුනාගැනීම සහ පරිපාලන කටයුතුවල කාර්යක්ෂමතාව සහ කාර්යය මණ්ඩල කාර්ය සාධනයේ ගුණාත්මක බව ඇගයීම
- ගණුදෙනු ක්‍රියාත්මක කිරීම, මූල්‍ය පාලනය සහ අයවැය, නීති හා රෙගුලාසිවලට දක්වා ඇති අනුකූලතාව පරීක්ෂා කිරීම
- මෙහෙයුම් ක්‍රියාවලිය සහ ප්‍රවර්ධන කටයුතුවල කාර්යක්ෂම බව සහ සාර්ථකත්වය ඇගයීම.
- වත්කම්වල පාලනය සහ ආරක්ෂාව ඇගයීම.
- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව නව ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම්වල ප්‍රගතිය ඇගයීම
- දිස්ත්‍රික් කාර්යාලවල කාර්ය සාධනය සහ මූල්‍ය හා පරිපාලන කටයුතුවල ප්‍රගතිය පරීක්ෂාව

11.4.3.අභ්‍යන්තර විගණන අංශයේ සත්‍ය කාර්ය මණ්ඩලය

තනතුර	නිලධාරී සංඛ්‍යාව	2023.12.31 දිනට සේවයේ යෙදී සිටින නිලධාරීන් සංඛ්‍යාව
අභ්‍යන්තර විගණක	01	01
විගණන නිලධාරි	02	-
විමර්ශන නිලධාරි	02	01
එකතුව	**05**	**02**

11.4.4.විගණන කමිටු රැස්වීම්

2023 වර්ෂයේ විගණන කමිටු රැස්වීම් පැවති දිනයන්

පළමු රැස්වීම - 2023 මැයි 19
දෙවන රැස්වීම - 2023 ඔක්තෝබර් 04
තෙවන රැස්වීම - 2023 දෙසැම්බර් 19

11.4.5.2023 වර්ෂයේ දී ඉදිරිපත් කළ අභ්‍යන්තර විගණන වාර්තා

	අභ්‍යන්තර විගණන වාර්තා විෂයය	ඉදිරිපත් කළ දිනය
01	වාර්ෂික සැලසුම් සකස් කිරීම	2023.02.07
02	දායක බඳවාගැනීම්/අයදුම්පත් ලැබීම් හා ඔප්පු නිකුත්කිරීම	2022.02.14
03	ආපදා ණය	2023.02.20
04	ක්‍රියාකාරී සැලැස්ම ඇගයීම - 2022	2023.02.28
05	පුද්ගලික ලිපි ගොනු පවත්වාගෙන යාම හා අනුමත සේවක සංඛ්‍යාව	2023.02.28
06	ගමන් වියදම්	2023.03.14
07	වාරික රැස්කිරීම හා ප්‍රේෂණය - පළමු වාර්තාව	2023.05.15
08	ක්‍රියාකාරී සැලැස්ම ඇගයීම - 2023 පළමු කාර්තුව	2023.05.29
09	සුළු මුදල්	2023.06.07
10	වාරික රැස්කිරීම හා ප්‍රේෂණය - දෙවන වාර්තාව	2023.06.09
11	පැමිණීම - පිටවීම සහ නිවාඩු	2023.06.26
12	මුදල් අයකැමි භාරයේ පවතින මුදල් භෞතිකව පරීක්ෂාව(ක්ෂණික පරීක්ෂාව)	2023.07.27
13	පරිගණක දත්ත සැකසුම සහ නව පරිගණක පද්ධතිය සකස් කිරීම	2023.08.23
14	ක්‍රියාකාරී සැලැස්ම ඇගයීම - 2023 දෙවන කාර්තුව	2023.08.23
15	අභ්‍යන්තර පාලන තක්සේරුව - වාරික රැස් කිරීම සහ ප්‍රේෂණය කිරීම	2023.10.26
16	අභ්‍යන්තර පාලන තක්සේරුව - වාරික පරිගණකගත කිරීමේ ක්‍රියාවලිය	2023.12.28

11.4.6.දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව

	දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව	වාර්තාව ඉදිරිපත් කළ දිනය
1	දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව - රත්නපුර	2023.03.16
2	දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව - කුරුණෑගල	2023.03.29
3	දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව - කළුතර	2023.03.30
4	දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව - කෑගල්ල	2023.04.19
5	දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරීක්ෂාව -පුත්තලම	2023.06.28

	දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව	වාර්තාව ඉදිරිපත් කළ දිනය
6	දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරීක්ෂාව -මාතලේ	2023.07.27
7	දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරීක්ෂාව -මාතර	2023.09.04
8	දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරීක්ෂාව -මොණරාගල	2023.09.22
9	දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරීක්ෂාව -අම්පාර	2023.09.27
10	දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරීක්ෂාව -අනුරාධපුරය	2023.12.29

11.4.7 ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව

	ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව	වාර්තාව ඉදිරිපත් කළ දිනය
1	ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කටයුතු පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්ගේ කාර්යභාරය	2023.02.06
2	ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව - හික්කඩුව	2023.02.03
3	ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව - ගම්පහ	2023.02.03
4	ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව - මහර	2023.02.03
5	ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව - පොල්ගහවෙල	2023.02.03
6	ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව - ඇහැළියගොඩ	2023.02.20
7	ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව -මහරගම	2023.03.10
8	ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව -කළුතර	2023.03.16
9	ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව -බද්දේගම	2023.03.23
10	ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව - මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ	2023.04.19
11	ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව -යටිනුවර	2023.04.19
12	ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව -රත්මලාන	2023.04.21
13	ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව -මොරටුව	2023.04.21
14	ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව -පුත්තලම	2023.06.07
15	ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව - අලව්ව	2023.06.28
16	ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව -මාතලේ	2023.06.28
17	ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව - කැළණිය	2023.07.17
18	ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව - බියගම	2023.07.17
19	ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව - මාතර කඩවත් සතර	2023.08.03
20	දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරීක්ෂාව -රඹුක්කන	2023.09.27

11.4.8 විශේෂ පැවරුම් වාර්තා

1	තැපැල් කළමනාකරණ පද්ධතිය (යෝජිත)	2023.06.28
2	System requirements to be considered when setting up the TOR for the Social Security Pension Management System	2023.09.18

11.5. තොරතුරු තාක්ෂණ ඒකකය

11.5.1. ප්‍රධාන කාර්යයන්

1. නව විශ්‍රාම වැටුප් තොරතුරු කළමනාකරණ මෘදුකාංග පද්ධති ස්ථාපනය කිරීමට අදාල කටයුතු සිදු කිරීම.
2. ආයතනයේ නව වෙනස්කම් සිදුකිරීමේ හා අනෙකුත් කර්තව්‍යයන් සඳහා ඉහල කළමනාකාරිත්වයට අවශ්‍ය වාර්තා ලබා දීම.
3. පරිගණක ජාලය යාවත් කාලීනව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම.
4. ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත පරිගණක වැඩසටහන් බිඳ වැටීමකින් තොරව පවත්වාගෙන යාම හා සුරක්ෂිත භාවය තහවුරු කිරීම.
5. පවතින මෘදුකාංග පද්ධතියේ දත්ත සුරක්ෂිතභාවය තහවුරු කිරීම සහ ඉදිරි පියවර ගැනීම.

11.5.2. 2023 වර්ෂයේ තොරතුරු තාක්ෂණ ඒකකයෙන් සිදු කළ කාර්යයන්

1. සමාජ ආරක්ෂණ මණ්ඩලයේ නව විශ්‍රාම වැටුප් කළමනාකරණ පරිගණක පද්ධතිය සකස් කිරීම සඳහා වන සාකච්ඡාවන් සඳහා අවශ්‍ය කටයුතු මෙහෙය වීම .
2. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ නව වෙබ් අඩවිය භාෂා ත්‍රිත්වයෙන් නිර්මාණය කිරීමේ කටයුතු සිදු කිරීම.
3. Google sheet මෙවලම යොදාගනිමින් සමාජ ආරක්ෂණ මණ්ඩලයේ විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා දෛනිකව බදවා ගැනීම් පිළිබඳව වාර්තා ලබාදීම.
4. Zoom තාක්ෂණය යොදාගනිමින් පැවැත් වූ රැස්වීම් මෙහෙය වීම හා තාක්ෂණික සහය ලබාදෙමින් ආයතනික ක්‍රියාවලින් හට සහය වීම.
5. දිස්ත්‍රික් කාර්යාල සඳහා වන පරිගණක හා උපාංග ලබා දීම , අළුත් වැඩියාවන් සිදු කිරීම හා තාක්ෂණික සහය ලබා දීම.
6. විශ්‍රාම වැටුප් ගෙවීම හා දෛනික රාජකාරි කටයුතු සඳහා තාක්ෂණික දායකත්වය ලබා දීම.
7. ආයතනයේ පවතින වැඩමුළු සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම.
8. නව පරිගණක උපාංග මිල දී ගැනීමේදී අවශ්‍ය කරනු ලබන තාක්ෂණික සහය ලබා දීම හා ප්‍රසම්පාදන කටයුතු සඳහා අවශ්‍ය පිරිවිතර සකස් කිරීම.

11.5.3.තොරතුරු තාක්ෂණ ඒකකයේ සත්‍ය කාර්යය මණ්ඩලය (2023.12.31 දිනට)

තනතුර		නිලධාරීන් සංඛ්‍යාව
සමාජ ආරක්ෂණ නිලධාරි (තොරතුරු තාක්ෂණ)	-	1
දත්ත පරිපාලක	-	0
පරිගණක වැඩසටහන් සහකාර (මෘදුකාංග)	-	1
පරිගණක වැඩසටහන් සහකාර (දෘඩාංග)	-	1
එකතුව	-	**3**

11.6.ප්‍රවර්ධන ඒකකය

11.6.1. ප්‍රධාන කාර්යයන්

1. විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම ප්‍රවර්ධනය සඳහා ප්‍රචාරණ වැඩසටහන් සැලසුම් කිරීම හා මෙහෙයවීම.
2. නව ඉලක්ක කණ්ඩායම් හඳුනාගැනීම සහ එම ඉලක්ක කණ්ඩායම්වල අවශ්‍යතාවය අනුව විශ්‍රාම වැටුප් සැලසුම් සංවර්ධනය සහ හඳුන්වාදීම.
3. විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම ප්‍රවර්ධනය සඳහා බාහිර ආයතන, සංවිධාන හා නිලධාරීන් සම්බන්ධීකරණය කිරීම.
4. පාරිභෝගික ප්‍රතිචාර විශ්ලේෂණය සහ ඒ අනුව අවශ්‍ය සංවර්ධනයන් හඳුනාගැනීම.
5. සමාජ ආරක්ෂණය පිළිබඳ දැනුම සමාජය තුල ප්‍රචලිත කිරීම සඳහා වැඩසටහන් සැලසුම් කිරීම සහ මෙහෙයවීම.

11.6.2. 2023 වර්ෂයේ ප්‍රවර්ධන හා මාධ්‍ය ඒකකයෙන් සිදු කළ කාර්යයන්

1. **“මනුසවි”** විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ව්‍යාප්ත කිරීම සඳහා විදේශ රැකියා නියෝජිත ආයතන, විදේශ සේවා නියුක්ති කාර්යංශයට, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් අනුයුක්ත නිලධාරීන් දැනුවත් කිරීම සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ව්‍යාපෘතිය මෙහෙයවීම සහ අධීක්ෂණය සිදු කිරීම.
2. වෙළඳ නාවික ප්‍රවාහන ක්ෂේත්‍රය ආශ්‍රිතව සේවා නියුක්ත නාවිකයින් වෙත ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය සහ වෙළඳ නාවික ලේකම් කාර්යාලය ඒකාබද්ධව හඳුන්වාදුන් **“නාවිකයා”** සමාජ ආරක්ෂණ යෝජනාක්‍රමය සඳහාසාමාජික බඳවාගැනීම් ආරම්භ කිරීම හා සාමාජිකත්වය ලැබූ පළමු නාවිකයින් කණ්ඩායම සඳහා සමාජ ආරක්ෂණ ඔප්පු ප්‍රදානෝත්සවයක් පැවැත්වීම.
3. 2023 වර්ෂයේ දී දීප ව්‍යාප්තව පවත්වන ලද (නුවරඑළිය, ගම්පහ, ත්‍රිකුණාමලය, බදුල්ල, කුරුණෑගල, මාතර) සමාජ ආරක්ෂණ ඇගයීම් උත්සවයන්ට අදාළ සංවිධාන කටයුතු සිදු කිරීම.
4. තරුණ ප්‍රජාව ස්වයං රැකියා සඳහා යොමුවීම දිරිමත් කිරීම, ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතාවයන් වැඩිදියුණු කිරීම සඳහා වූ වැඩසටහන් මාලාවක් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය හා ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානවල පුහුණුව ලබන තරුණ, තරුණියන් ඇතුලු ප්‍රාදේශීය තරුණ කණ්ඩායම් ඉලක්ක කරමින් වැඩසටහන් 12 ක් ක්‍රියාත්මක කිරීම.
5. සමාජ ආරක්ෂණ විෂය පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීමේ ව්‍යාපෘතියේ වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම.
6. පාසල් ශිෂ්‍ය ප්‍රජාව සමාජ ආරක්ෂණය සහ එහි අවශ්‍යතාව පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාව මෙහෙයවීම සහ අධීක්ෂණය.
7. විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම ප්‍රවර්ධනයට අදාළව සමාජ මාධ්‍ය, ගුවන් විදුලි, රූපවාහිනී, පුවත්පත් ඔස්සේ ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා වෙළඳ සන්නාම් කටයුතු සිදු කිරීම

11.6.3.ප්‍රවර්ධන ඒකකයේ සත්‍ය කාර්යය මණ්ඩලය (2023.12.31 දිනට)

තනතුර		නිලධාරීන් සංඛ්‍යාව
සමාජ ආරක්ෂණ නිලධාරි (ප්‍රවර්ධන)	-	1
කළමනාකරණ සහකාර	-	1
කාර්යාල කාර්ය සහයක	-	1
එකතුව	-	**3**

12.ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය හා තෘතීය කළමනාකාරීත්වය (2023.12.31 දිනට)

12.1. ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය



කේ.ඒ.එස්.පී.කළුආරච්චි මහතා
සාමාන්‍යාධිකාරී
දුරකතන : +94 11 2886581
ෆැක්ස් : +94 11 2886581
ඊමේල් : gm@ssb.gov.lk



කල්හාරි ද සිල්වා මහත්මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සමාජ ආරක්ෂණ)
දුරකතන : +94 11 2886582
ෆැක්ස් : +94 11 2886582
ඊමේල් : dgm.socialsecurity@ssb.gov.lk



කපිල ක්‍රිෂාන්ත මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
(බදවාගැනීම් හා දිස්ත්‍රික් පරිපාලන)
දුරකතන : +94 11 5745357
ෆැක්ස් : +94 11 2886582
ඊමේල් : agm.socialsecurity@ssb.gov.lk



ශ්‍යාමලී ප්‍රින්සි හෙට්ටිආරච්චි මෙනවිය
සහකාර සාමාන්‍යාධිකාරී
(විශ්‍රාම වැටුප්/රක්ෂණ)
දුරකතන : +94 11 2889220
ෆැක්ස් : +94 11 2886582
ඊමේල් : agm.pension.ins@ssb.gov.lk



ඩබ්ලිව්.ශාමිලා ප්‍රනාන්දු මෙනවිය
සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය)
දුරකතන : +94 11 2889209
ෆැක්ස් : +94 11 2886583
ඊමේල් : agm.finance@ssb.gov.lk



අජිත් කුමාර මහතා
අභ්‍යන්තර විගණක
දුරකතන : +94 11 2865820
ෆැක්ස් : +94 11 2865820
ඊමේල් : int.audit@ssb.gov.lk

12.2.තෘතීය කළමනාකාරීත්වය



දයානි පුෂ්පලතා මිය
කළමනාකරු (පාලන)
දුරකතන : +94 11 2886585 – 86
ඊමේල් :



එම්.එම්.මානෙල් ජයසේකර මිය
කළමනාකරු (ඔප්පු සේවා)
දුරකතන : +94 11 2886585 – 86
ඊමේල් : mgr.policy@ssb.gov.lk



ඩබ්ලිව්.සාවිත්‍රි එම් ගුණතිලක මෙනවිය
කළමනාකරු (රක්ෂණ)
දුරකතන : +94 11 2886585 – 86
ඊමේල් : mgr.insurance@ssb.gov.lk



එච්.ජී.බී.ශිරාණි මෙනවිය
ගිණුම් නිලධාරී (මුදල්)
දුරකතන : +94 11 2886585 – 86
ඊමේල් : mgr.finance@ssb.gov.lk



ඩී.එස්. ලක්මාල් මහතා
සමාජ ආරක්ෂණ නිලධාරී (ප්‍රවර්ධන)
දුරකතන : +94 11 2886585 – 86
ඊමේල් : mgr.promotions@ssb.gov.lk



එම්.එච්.එස්.යූ.කරුණාරත්න මිය
සමාජ ආරක්ෂණ නිලධාරී (විශ්‍රාම වැටුප්)
දුරකතන : +94 11 2886585 – 86
ඊමේල් : mgr.pension@ssb.gov.lk

තෘතීය කළමනාකාරීත්වය



එම්.එම්.මහබූර් මහතා
ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරී



පී.ප්‍රතීපන් මහතා
ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරී
(උතුරු නැගෙනහිර පළාත්)



රංජිත් දිසානායක මහතා
ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරී
(මධ්‍යම, වයඹ සහ උතුරු මැද පළාත්)



වයි.එච්.එම්.සිරියලතා මහත්මිය
ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරී
(සබරගමු පළාත හා විශේෂ ව්‍යාපෘති 2)



කේ.ජී.ඒ.චන්ද්‍රා මාලනී මහත්මිය
ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරී
(දකුණු සහ ඌව පළාත්)



ඩී.එම්.එස්.කේ.කේ.දසනායක මහතා
ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරී
(බස්නාහිර පළාත සහ විශේෂ ව්‍යාපෘති 3)




පසුගිය
වසර දහයක
මූල්‍ය ප්‍රගතියේ
විශේෂ අවස්ථා

FINANCIAL HIGHLIGHTS OF THE PRECEEDING 10 YEARS

All amounts shown in Rs. Millions

COMPARISION OF TOTAL COLLECTIONS (WITH INTEREST) AND PAYMENTS TO MEMBERS - YEAR 2014 TO 2023




	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023
Total Payment (Rs.)	187.80	213.99	277.24	307.11	362.44	359.22	376.34	430.50	454.81	488.54
Total Collection (Rs.)	360.54	317.05	318.74	407.65	467.23	495.58	459.44	514.42	674.62	920.09

FINANCIAL HIGHLIGHTS OF THE PRECEEDING 10 YEARS

All amounts shown in Rs. Millions

COMPARISION OF TOTAL COLLECTIONS (WITHOUT INTEREST) AND PAYMENTS TO MEMBERS - YEAR 2014 TO 2023




	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023
Total Payment (Rs.)	143.03	187.80	213.99	277.24	307.11	362.44	359.22	376.34	430.50	454.81	488.54
Total Collection (Rs.)	156.39	151.66	151.76	157.31	191.24	205.64	235.66	220.88	294.15	329.15	376.93

FINANCIAL HIGHLIGHTS OF THE PRECEEDING 10 YEARS

All amounts shown in Rs. Millions

INTEREST INCOME - YEAR 2014 TO 2023



	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023
Interest Income (Rs.)	208.88	165.28	161.43	216.41	261.59	259.92	238.56	220.26	345.48	543.16



මූල්‍ය විශ්ලේෂණය සහ මෙහෙයුම් කාර්ය සාධනය

SSB

Analysis Of Financial and Operational Performance (FY 2012 -2022)

Description		2013	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023
New Enrolments for the Year	Nos	8,769	15,995	21,271	71,364	63,674	83,350	38,591	25,783	32,078	57,596	
Avg no.of members for pension	Nos	15,821	20,157	22,629	25,263	27,080	28,742	30,598	31,769	32,976	34,280	
Income												
Member Collection	Rs	156,393,155	151,660,082	151,763,891	157,312,782	191,236,129	205,641,471	235,661,355	220,875,820	294,152,727	329,145,803	376,926,910
Interest Income	Rs	237,574,919	208,879,725	165,282,624	161,431,297	216,409,371	261,591,395	259,919,300	238,562,470	220,263,741	345,475,143	543,161,844
Total Income	Rs	393,968,074	360,539,807	317,046,515	318,744,079	407,645,500	467,232,866	495,580,655	459,438,290	514,416,468	674,620,946	920,088,754
Expenditure												
Pension	Rs	127,502,515	167,727,734	186,934,897	234,792,979	263,264,719	313,143,500	312,727,588	331,553,955	356,981,876	380,424,646	407,000,980
Gratuity	Rs	2,491,978	2,079,906	2,139,519	2,087,804	1,747,940	1,962,534	2,103,055	2,135,828	1,584,866	1,572,044	2,404,513
Refund	Rs	10,367,066	15,222,021	24,444,852	38,481,516	38,055,553	32,513,063	25,304,571	27,946,174	18,370,909	31,448,787	22,712,140
Disability	Rs	620,584	714,620	404,275	545,637	627,967	543,279	657,064	589,719	713,451	527,026	658,570
Arassawa Benefits	Rs	-	-	64,000	57,500	2,536,568	4,842,660	2,775,394	2,928,000	3,106,499	5,528,349	7,428,819
Incentives	Rs	2,043,705	2,052,379		1,274,872	880,610	9,439,135	15,649,535	11,188,589	49,743,046	35,306,023	48,338,909
Total Expenditure	Rs	143,025,848	187,796,660	213,987,543	277,240,308	307,113,357	362,444,171	359,217,207	376,342,265	430,500,647	454,806,875	488,543,931
Excess/ Short Fall	Rs	156,393,155	151,660,082	151,763,891	157,312,782	191,236,129	205,641,471	235,661,355	220,875,820	294,152,727	329,145,803	431,544,823
Investment value	Rs	1,617,153,979	1,717,590,837	1,818,136,272	1,874,773,791	1,941,057,650	1,937,822,662	1,870,775,003	1,741,510,030	1,654,232,844	2,371,021,770	3,019,434,247



අනු කමිටු

විගණන කමිටු වාර්තාව

ආයෝජන කමිටු වාර්තාව

විගණන කමිටු වාර්තාව

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ විගණන කමිටුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2021 (2021.11.16) අනුව නිකුත් කර ඇති Guidelines on Corporate Governance for State Owned Enterprises මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 උපඡේදය අනුව පත්කර ඇත. ඒ අනුව විගණන කමිටුව භාණ්ඩාගාර නියෝජිත ඇතුළු විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. රේඛීය අමාත්‍යාංශ ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ ජාතික විගණන කාර්යාල නියෝජිතයෙකු නිරීක්ෂකයන් ලෙස විගණන කමිටු රැස්වීම්වලට සහභාගී වේ.

2023 වර්ෂයේදී විගණන කමිටුව නියෝජනය කල නිලධාරීන් පහත පරිදි විය.

විගණන කමිටුව

එම්.එෆ්.ඒ.මුබාරක් මහතා/හිමාලි බෝගොඩගෙදර මිය	- කමිටු සභාපති (භාණ්ඩාගාර නියෝජිත)
කේ.කේ.ඩී.කුමාරසිරි කන්නන්ගර මහතා	- කමිටු සාමාජික
කේ.එච්.වී.ජයතිලක මහතා	- කමිටු සාමාජික

විගණන කමිටු නිරීක්ෂකයන්

ඩී.එම්.ජී.පී.මල්කාන්ති මිය	- නිරීක්ෂක (ප්‍රධාන අභ්‍යන්තර විගණක - රේඛීය අමාත්‍යාංශය)
එම්.ඒ.පී.මාරසිංහ මිය/එම්.ඩී.කේ මලගල මිය	- නිරීක්ෂක (ජාතික විගණන කාර්යාලය)

රාජ්‍ය විශ්‍රාම වැටුපකට හිමිකම නොලබන ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් දායක බඳවා ගැනීම, වාරික මුදල් රැස්කිරීම, විශ්‍රාම වැටුප් ඇතුළු ප්‍රතිලාභ ගෙවීම යන ප්‍රධාන කාර්යයන්ට අදාල "කාර්යසාධනය" පිළිබඳව සලකා බැලීම, දුර්වලතා හඳුනා ගැනීම සහ දුර්වලතා අවම කරගනිමින් කාර්යසාධනය ඉහල නංවා ගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම විගණන කමිටුවේ ප්‍රමුඛතම කාර්යභාරය විය. ඊට අතිරේකව දායක මුදල් ආයෝජනය සහ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් ආයෝජනය කිරීම හා ගිණුම්ගත කිරීම, මුදල් රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛ හා අනෙකුත් මාර්ගෝපදේශයන්ට අනුව සිදුකර ඇති බව සහතික කිරීමත් ඒ සඳහා අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රම ශක්තිමත් කිරීමට සහ අභ්‍යන්තර පාලන ක්‍රමවලට කාර්යමණ්ඩල අනුකූලතාව දැක්වීම සඳහා උපදෙස් ලබා දීම සිදුවිය.

ඉහල කාර්ය සාධනයක් ලභා කර ගැනීම සඳහා මානව සම්පත් සංවර්ධනය ඉතා වැදගත් සාධකයක් වන බැවින් මණ්ඩලයේ පුහුණු හා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳවද විගණන කමිටුව සලකා බැලීම සිදුකරන ලදී.

ජාතික විගණන කාර්යාලයෙන් යොමුකරනු ලැබූ විගණන විමසුම් හා විගණකාධිපති වාර්තා සහ අභ්‍යන්තර විගණන වාර්තා නිරීක්ෂණ පිළිබඳව සාකච්ඡා කර විගණන නිරීක්ෂණ මගින් ඉදිරිපත් කර ඇති දුර්වලතා අවම කර ගැනීමට හා ඉදිරියේදී ඇතිවීම වළක්වාගැනීම සඳහා නිර්දේශ ලබා දීමද විගණන කමිටුව සිදුකර ඇත.

අභ්‍යන්තර විගණන අංශයේ වාර්ෂික විගණන සැලැස්ම අනුමත කිරීම සහ සංශෝධන සඳහා අනුමැතිය ලබාදීම ද විගණන කමිටුවේ කාර්යභාරයට අයත් විය.

2023 වර්ෂයේදී භාණ්ඩාගාර නියෝජිතයන්ගේ වෙනස්වීම්,අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ ධුර කාලය අවසන්වීම් සහ නව පත්කිරීම් සිදුවීම අනුව 2023 වර්ෂයේදී විගණන කමිටු රැස්වීම් 03 ක් පමණක් පවැත්වීමට හැකිවිය.

පළමු විගණන කමිටු රැස්වීම	-	2023 මැයි 19
දෙවන විගණන කමිටු රැස්වීම	-	2023 ඔක්තෝබර් 04
තෙවන විගණන කමිටු රැස්වීම	-	2023 දෙසැම්බර් 19

2022 වසරට සාපේක්ෂව 2023 වර්ෂයේදී විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමයට වැඩි දායක සංඛ්‍යාවක් බඳවා ගැනීමට සහ වැඩි වාරික මුදලක් රැස්කර ගැනීමට මණ්ඩලයට හැකිවීම අනුව විගණන කමිටු නිර්දේශයන් සහ මහපෙන්වීම් ද ඒ සඳහා ඉවහල් වී ඇති බවට විශ්වාස කරමි.

විගණන කමිටුව වෙනුවෙන්,

හිමාලි ඛෝගොඩගෙදර
විගණන කමිටු සභාපති
2024.06.

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
කාන්තා,ළමා කටයුතු හා සමාජ සවිබලගන්වීම් අමාත්‍යාංශය
ආයෝජන කමිටු වාර්තාව - 2023

01.සංයුතිය

සමාලෝචිත වර්ෂය තුළ කමිටුවේ සාමාජිකයින් පහත සඳහන්පරිදි විය :

පී.එස්.එස්.දික්වැල්ල	සභාපති
කේ.ඒ .එස්.පී.කළුආරච්චි	සාමාන්‍යාධිකාරී
එස් ඩබ්.ලක්ෂ්මන්	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- මුදල්
ඩබ්.එස්.පී.ප්‍රනාන්දු	සහකාර සාමාන්‍යාධිකාරී- මුදල්

02.රැස්වීම්

නම	සහභාගී වූ රැස්වීම් ගණන
පී.එස්.එස්.දික්වැල්ල	30 / 30
කේ.ඒ .එස්.පී.කළුආරච්චි	30 / 30
එස් ඩබ්.ලක්ෂ්මන්	10 / 30
ඩබ්.එස්.පී.ප්‍රනාන්දු	30 / 30

ආයෝජන කමිටුව නිසි පරිදි අදාළ අභ්‍යන්තර සාමාජිකයින්ගෙන් සමන්විත වේ.අවදානම් නැඹුරුවක් සහිත ආයෝජන පිළිබඳ අදහස් සහ මතය දැනගැනීම සඳහා කමිටුව සෑම ආයෝජනයකටම පෙර රැස්වේ.

ආයෝජන සම්බන්ධයෙන් මණ්ඩලයේ මූලික පරමාර්ථය වන්නේ ,මුල්‍ය බැදීම් සපුරාලීම සඳහා ද්‍රවශීලතාවය කළමනාකරණය කරන අතරතුර අදාළ ආයෝජිත මුල් මුදල ආරක්ෂා කරගැනීම වන අතර, අනුදත් ආයෝජනය ප්‍රශස්ත ලෙස භාවිතා කරමින් උපරිම ආයෝජන ප්‍රතිලාභ ඊට ලබාදීමයි.එහි ප්‍රතිඵලයක් වශයෙන්,මණ්ඩලය පහත සඳහන් තෙවැදෑරුම් ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සහතික කිරීමට උත්සහ කරයි.

- **සුරක්ෂිතභාවය**
  ආයෝජන මූල ධනයේ ආරක්ෂාව සලසා ගැනීම මණ්ඩලයේ ප්‍රමුඛ පරමාර්ථය වන්නේය. මෙම මූල ධනයේ ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා කටයුතු කිරීම පිණිස මණ්ඩලයේ සමස්ථ අතිරික්ත අරමුදල් රාජ්‍ය බැංකු වල ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කරයි.

- **ද්‍රවශීලතාවය**
  මුල්‍ය අවාසියක් ඇති නොවන පරිදි ඉදිරියේදී අපේක්ෂා කළ හැකි සියලු මෙහෙයුම් කටයුතුවල අවශ්‍යතාව සපුරා ගැනීමට හැකිවන පරිදි ද්‍රවශීලතා මට්ටමක් පවත්වා ගැනීමට ආයෝජන කමිටුව කටයුතු කරයි.

- **ආයෝජන මත ප්‍රතිලාභ**
  ලබාගත හැකි ඉහළම ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා ආයෝජන සමුච්චය සැලසුම් කලයුතු වන්නේ ගිණුම් සීමාවන් හා මුදල් ප්‍රවාහ අවශ්‍යතා සැලකිල්ලට ගෙනය. ඒ අනුව,ඉහළ පොළී අනුපාත සහ ආයෝජන අවදානම සැළකිල්ලට ගනිමින් 2023 වර්ෂයේ ආයෝජනයන් 26.00% ,25.00% , 24.00%, 22.00%, 21.00%, 19.50% , 18.00%, 15.00% , 13.00%, 12.60%, 11.90% සහ 11.00% යන පොලී ප්‍රතිශතයටනේ ආයෝජනය කර ඇත.

.....
ඩබ්.එස්.පී.ප්‍රනාන්දු
සහකාර සාමාන්‍යාධිකාරී - මුදල්

කේ.ඒ.එස්.පී.කළුආරච්චි
සාමාන්‍යාධිකාරී



විගණකාධිපතිවරයාගේ වාර්තාව

2023 විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම

අවසන් ගිණුම් ප්‍රකාශන

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. එල්එස්ඩබ්/ඩී/එස්එස්බී/එෆ්එස්/2023/

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2024 මැයි 31 දින

සභාපති
ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම්

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

වාර්තාවේ ඇතුළත් නොවිය හොරතුරු අනෙකුත් හොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් හොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් හොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් හොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් හොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම් උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි නනී හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විමේ අවධානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් , ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික කත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	අනුකූල නොවීම්
1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩල පනත 15(2) වගන්තිය	යම් දායකයෙකුට ප්‍රතිලාභ අහිමි වී ඇති විට මණ්ඩලය විසින් එම දායකයාට දැන්වීමක් නිකුත් කළ යුතු වුවත් සාමාජිකයන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතිය තුළින් වාර්තා ලබාගැනීමට නොහැකි වීමෙන් 2023 දෙසැම්බර් 31 දිනට 717,928 ක් වූ අක්‍රිය තත්ත්වයේ පැවති දායකයින්ට ප්‍රතිලාභ අහිමි වීම පිළිබඳව දැනුම් දී නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමයට නව මෘදුකාංග පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා 2017 වර්ෂයේදී රු. 12,511,000 ක් වූ ප්‍රතිපාදනයක් භාණ්ඩාගාරයෙන් ලබාගෙන තිබුණු අතර ඒ සඳහා 2018 දෙසැම්බර් 06 වන දින අදාල සැපයුම්කරු සමඟ ගිවිසුම් ගත වී තිබුණි. 2019 පෙබරවාරි 14 වන දින පලමු සැපයුම් කට්ටලයට අදාලව සියයට 10 ගෙවීමක් ලෙස රු. 1,009,250 ක් ගෙවීම් සිදුකර තිබුණි. ගිවිසුම් ගත කාලය 2019 අගෝස්තු 06 දිනෙන් අවසන් වුවද, වැඩි ප්‍රමාද වීම් හේතුවෙන් සැපයුම්කාර ආයතනය විසින් රු.මිලියන 12 ක අතිරේක

මුදලක් වෙළඳපොළ මිල වෙනස්වීම් මත ඉල්ලා ඇති අතර එම මුදල ආයතනයට ලබාදීමට ප්‍රතිපාදන නොමැති බැවින් 2023 ජුනි 16 දින දෙපාර්ශවයේ එකඟතාවයෙන් අවසන් කිරීමට තීරණය කර තිබුණද, ඒ අනුව කාර්යසාධන ඇපකරය 2022 ජූලි 01 දිනෙන් පසු කාලය දීර්ඝ කර ගැනීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබීම හේතුවෙන් වැය කරන ලද රු. 1,090,250 ක මුදල අය කර ගත නොහැකි වී තිබුණ අතර වසර 4 කාලයක සිට නිශ්ඵල වී තිබුණි. 2023 අගෝස්තු 10 දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි නව පරිගණක පද්ධතියක් මිලදී ගැනීමට අනුමැතිය ලැබී තිබුණද පරිගණක පද්ධතිය ස්ථාපනය කිරීමට අපොහොසත් වී තිබුණි. පද්ධතිය සඳහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ ප්‍රතිපාදනය ස්ථාවර තැන්පත් වල ආයෝජනය කරමින් පවතින අතර 2023 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු ශේෂය රු. 17,129,263ක් විය.

2.3 වෙනත් කරුණු

(අ) වාර්ෂිකව දායකයින් විශාල වශයෙන් සාමාජිකත්වය අහෝසි කර මුදල් ආපසු ලබාගැනීමේ ප්‍රවණතාවයක් පවතින අතර සියයට 25 ක් හෝ ඊට වැඩියෙන් වාරික මුදල් ගෙවූ සාමාජිකයන් තම සමාජික මුදල් ආපසු ලබාගැනීම සිදු කර තිබුණි. ඒ අනුව 2021 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුල සාමාජිකයන් 1981 දෙනෙකු විසින් රු. 69,827,166 ක මුදලක් ආපසු ලබා ගෙන තිබුණි.

(ආ) සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ප්‍රධාන ආදායම් උත්පාදන ප්‍රභවය වන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සඳහා සාමාජිකයින් බඳවා ගැනීම, වාරික අයකරගැනීම, විශ්‍රාම වැටුප් ගෙවීම, අක්‍රිය සමාජිකයන් සක්‍රිය කිරීම වැනි කාර්යයන් සිදුකිරීම සඳහා දක්ත පද්ධති 02 ක් භාවිත කරනු ලැබුවද එම පද්ධති මඟින් බඳවා ගන්නා සාමාජිකයන්ගේ සක්‍රිය හා අක්‍රිය භාවය පිළිබඳව තොරතුරු සෘජුව ලබාගත නොහැකි අතර, අනුගාමී වාරික දහයක් ගෙවීම පැහැරහැරිය හොත් ඔප්පුවේ ප්‍රතිලාභ අහිමි වී සාමාජිකත්වය අක්‍රිය වේ. නමුත් දැනට භාවිතා වන පද්ධතිය තුළින් එය හඳුනාගැනීමට නොහැකි වී ඇත. එසේම විශ්‍රාම වැටුප් ,පාරිතෝෂික ගෙවීම් සහ විශ්‍රාම වැටුප් අරමුදල් ආපසු ගෙවීම් පිළිබඳ වාර්තා පද්ධතිය තුළින් ජනනය නොවීම හේතුවෙන් මණ්ඩලය විසින් දැනට භාවිතා කරන පද්ධති මඟින් අවශ්‍ය පරිදි වාර්තා සකස්වීමේ පහසුකම් නොතිබුණි.

(ඇ) සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අරමුදල සඳහා ආදායම් වශයෙන් සාමාජික දායක මුදල් හා ස්ථාවර තැන්පතු ආයෝජන සඳහා පොළි ලැබීම්ද වියදම් වශයෙන් විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ ගෙවීම්, දායක මුදල් ආපසු ගෙවීම්, විශ්‍රාම පාරිතෝශික ගෙවීම්, නිලධාරීන්ට දිරිදීමනා යනාදී ගෙවීම්ද සිදුකර තිබුණි. ඉකුත් වර්ෂ 05 ක මූල්‍ය ප්‍රකාශන අනුව අරමුදලේ ආදායම්, වියදම් සහ අතිරික්තය සහ ඒවායේ ඉකුත් වර්ෂයන්ට සාපේක්ෂව වර්ධනය හා පිරිහීම් පරීක්ෂාවේදී අරමුදලේ ආදායම සාමාජිකයන්ගේ දායක මුදලින් හා ආයෝජන පොළි යන ආදායම් වලින් සමන්විත වන අතර 2022 හා 2023 වර්ෂ වල බැංකු වල ස්ථාවර තැන්පතු පොළි අධික ලෙස ඉහළ යෑම හේතුවෙන් පොළි ආදායම වැඩි වී අරමුදලේ ආදායම වැඩි වී තිබුණද එය දිගු කාලීනව බලාපොරොත්තු විය නොහැකි අතර ප්‍රධාන ආදායම වන සාමාජිකයන්ගේ දායක මුදල, වියදමට සාපේක්ෂව වර්ධනය කර ගැනීම අඩු මට්ටමක පවතින බැවින් මෙම තත්වය සාමාජිකයන්ට ගෙවීම් හා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු වලට අහිතකර ලෙස බලපා තිබුණි.

(ඈ) සහන, තිලිණ, ඉසුර සරණ, ධන ලක්ෂ්මී, සුරුකුම සහ ආරක්ෂාව යනාදී වශයෙන් විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ යෝජනා ක්‍රම 07 ක් මණ්ඩලය විසින් ආරම්භ කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ

දෙසැම්බර් 31 දින වන විට සුරැකුම් හා ආරක්ෂාව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම 02 පමණක් ක්‍රියාත්මකව පැවතුණි. සහන, සරණ, නිලිණ.ධන ලක්ෂ්මි යෝජනා ක්‍රම සඳහා බඳවාගත් 355.504 ක් වූ සාමාජිකයන් පනවින් සියයට 81 ක් එනම් 289.356 දෙනෙකුගේ සාමාජිකත්වය අක්‍රිය වී නිබුණ අතර ක්‍රියාත්මක වන සුරැකුම්, ආරක්ෂාව හා ඉසුර විශ්‍රාම වැටුප් යොජනා ක්‍රම සඳහා බඳවාගත් 646.289 හි සාමාජිකයන් පනවින් සියයට 66 එනම් 428.572 දෙනෙකුගේ සාමාජිකත්වය අක්‍රිය වී නිබුණි.

(ඉ) අක්‍රිය සාමාජිකයන් සක්‍රිය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂයේ රු. මිලියන 4.6 ක මුදලක් වෙන්කර නිබූ අතර ඒ මගින් අක්‍රිය සාමාජිකයින් 8000 ක් සක්‍රිය කිරීමටත් සක්‍රිය කිරීම මත එකතු කළ යුතු වාරික මුදල් රු.මිලියන 80 ක් දක්වා එකතු කිරීම අපේක්ෂා කලද සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 586.000 ක් වියදම් කර සාමාජිකයින් 2724 දෙනෙකු සඳහා වාරික නොගෙවීම් පිළිබඳ ලිපි මඟින් දැනුම් දීමත් "ආරක්ෂාව " විශ්‍රාම වැටුප් ක්‍රමයේ සාමාජිකයින් 23.745 කගෙන් සාමාජිකයින් 489 ක් හෙවත් සියයට 13 ක් පමණක් නැවත සක්‍රිය කිරීම සාර්ථක කර ගෙන නිබූ අතර අපේක්ෂා කල පරිදි අක්‍රිය සාමාජිකයන්ගේ සක්‍රිය කිරීමේ ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට නොහැකි වී නිබුණි.

(ඊ) මණ්ඩලය විසින් 2017 වර්ෂයේදී ආරම්භ කර නිබුණු කලාකරුවන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමය වෙනුවෙන් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය රු. මිලියන 94 ක මුදලක් ලබා දී නිබුණි. එම මුදල් බැංකු ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර නිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලේ ශේෂය රු. මිලියන 167 ක් විය. නමුත් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා 2017-2022 කාලය තුල කලාකරුවන් 509 ක් බඳවා ගෙන ඉන් 335 ක් අක්‍රිය වී ඇති අතර සමාලෝචිත වර්ෂයේ සාමාජිකයින් 361 ක් බඳවාගෙන සාමාජිකයන් 51 ක් අක්‍රිය වී නිබුණි. ඒ අනුව කලාකරුවන් වෙනුවෙන් ලැබුණ මුදල අදාල කාර්යය සඳහා නිසි පරිදි යෙදවීමට නොහැකිව නිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් තොරතුරු හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්ති ප්‍රකාරව - විගණකාධිපති වාර්තාව සහ ඒ පිළිබඳ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම

ඡේදය අංකය	විගණකාධිපති වාර්තාවේ ඇතුලත් නිරීක්ෂණ		කළමණාකරණයේ අදහස් දැක්වීම
2.2.2	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව. **නීතිරීති / විධානයට යොමුව** --- 1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩල පනත 15(2) වගන්තිය	**නිරීක්ෂණ** --- යම් දායකයෙකුට ප්‍රතිලාභ අහිමි වී ඇති විට මණ්ඩලය විසින් එම දායකයාට දැන්වීමක් නිකුත් කළ යුතු වුවත් සාමාජිකයන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතිය තුළින් වාර්තා ලබාගැනීමට නොහැකි වීමෙන් 2023 දෙසැම්බර් 31 දිනට 717,928 ක් වූ අක්‍රිය තත්ත්වයට පැවති දායකයින්ට ප්‍රතිලාභ අහිමි වීම පිළිබඳව දැනුම් දී නොතිබුණි.	1996 අංක. 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය පනතේ 15(2) වගන්තිය අනුව 2014 වර්ෂය වන විට සාමාජිකත්වය අක්‍රියවූ "සහන" සහ "නිළිණ" යෝජනා ක්‍රමවල අක්‍රිය සාමාජිකයන් 288,234 ක් සඳහා අක්‍රිය නිවේදන නිකුත් කර ඇති අතර, 2013 නිකුත් කර ඇති අභ්‍යන්තර වක්‍රලේඛනය අනුව ඔවුන් නැවත සක්‍රිය කිරීම ද කළ නොහැකිවී ඇත. 2014 වර්ෂයෙන් පසුව අක්‍රිය වූ සාමාජිකයන් 38,426 ක් වෙත අක්‍රිය වී ඇති බව සහ වාරික ගෙවීම් පිළිබ සිහිකැඳවමින් ලිපි නිකුත් කර ඇති අතර, තවත් සාමාජිකයන් 408,298 ක් සඳහා අක්‍රිය නිවේදන නිකුත්කිරීම් සඳහා ව්‍යාපෘතියක් සැලසුම් කර ඇත.
2.2.4	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව. සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමයට නව මෘදුකාංග පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා රු. 12,511,000 ක් වූ ප්‍රතිපාදනයක් භාණ්ඩාගාරයෙන් ලබාගෙන තිබුණු අතර ඒ සඳහා 2018 දෙසැම්බර් 06 වන දින අදාල සැපයුම්කරු සමඟ ගිවිසුම් ගත වී තිබුණි. 2019 පෙබරවාරි 14 වන දින පලමු සැපයුම් කට්ටලයට අදාලව සියයට 10 ගෙවීමක් ලෙස රු: 1,009,250 ක් ගෙවීම් සිදුකර තිබුණි. වැඩ ප්‍රමාද වීම හේතුවෙන් සැපයුම්කාර ආයතනය විසින් රු.මි. 12 ක අතිරේක මුදලක් වෙළඳපොළ මිල වෙනස්වීම් මත ඉල්ලා ඇති අතර එම මුදල ආයතනයට ලබාදීමට ප්‍රතිපාදන නොමැති බැවින් 2023 ජුනි 16 දින දෙපාර්ශවයේ එකඟතාවයෙන් අවසන් කිරීමට තීරණය කර තිබුණද, කාර්යසාධන ඇපකරය 2022 ජුලි 01 දිනෙන් පසු කාලය දීර්ඝ කර ගැනීමට කළමනාකරණය විසින්	පරිගණක පද්ධතිය ස්ථාපනය කිරීම සඳහා අදාල සැපයුම්කාර සමාගම විසින් ගිවිසුමේ ප්‍රකාරව ලබා දියයුතු විස්තරාත්මක මෘදුකාංග පිරිවිතර වාර්තාව (DSRS) ලබා දීම දක්වා කටයුතු කර නිබූ අතර ගිවිසුම ප්‍රකාරව ඒ සඳහා ගෙවිය යුතු මුදල රු.මි.2.5 කි. ඉන් පසුව නව වෙනස්කම් පිළිබඳ අවශ්‍යතාවක් මතු වූ අතර එම වෙනස්කම් සිදු කිරීමට රු.මි. 12ක අතිරේක මුදලක් ඉල්ලා සිටි බැවින් එම ගිවිසුම අවසන් කිරීමට දෙපාර්ශවය එකඟ වූ අතර නව සැපයුම්කරුවකු තෝරා ගැනීම සඳහා ප්‍රවක්පත් දැන්වීමක් පළකර ඇත. ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම තුළින් ඒ මුදල මිලියන 17ක් බවට එම මුදල පත් වී ඇති අතර එම මුදල් භාවිතා කර නවින පරිගණක පද්ධතිය ලබා ගැනීමට කටයුතු කරමින් සිටී.

	කටයුතු කර නොතිබුණි. මේ සඳහා වැය කරන ලද රු. 1,090,250 ක මුදල අය කර ගත නොහැකි වී ඇති අතර වසර 7 කාලයක සිට නිශ්ඵල වී තිබුණි. 2023 අගෝස්තු 10 දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි නව පරිගණක පද්ධතියක් මිලදී ගැනීමට අනුමැතිය ලැබී තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 07 ක කාලයක් ගත වී ඇතත් පරිගණක පද්ධතිය ස්ථාපනය කිරීමට අපොහොසත් වී තිබුණි. මෙම භාණ්ඩාගාර ප්‍රතිපාදනය ස්ථාවර තැන්පත් වල ආයෝජනය කරමින් පවතින අතර 2023 දෙසැම්බර් 31 දිනට රු. 17,129,263ක් විය.	
2.3 (අ)	වෙනත් කරුණු වාර්ෂිකව දායකයින් විශාල වශයෙන් සාමාජිකත්වය අහෝසි කර මුදල් ආපසු ලබාගැනීමේ ප්‍රවණතාවයක් පවතින අතර සියයට 25 ක් හෝ ඊට වැඩියෙන් වාරික මුදල් ගෙවූ සාමාජිකයන් තම සමාජික මුදල් ආපසු ලබාගැනීම සිදු කර තිබුණි. ඒ අනුව 2021 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුල සාමාජිකයන් 1981 දෙනෙකු විසින් රු. 69,827,166 ක මුදලක් ආපසු ලබා ගෙන තිබුණි.	සාමාජිකත්වය අක්‍රියවීම මත පහත සඳහන් අවස්ථාවලදී සාමාජිකයන් වෙත ශුද්ධ දායක මුදල ආපසු ගෙවනු ලබයි. I. සාමාජිකත්වය කල්පිරෙන තෙක් ඒ වන විට අදාළ සාමාජිකයා විසින් ගෙවිය යුතු වාරික මුදලින් 25%-75% අතර වාරික ප්‍රමාණයක් ගෙවා ඇති එහෙත් අක්‍රිය සාමාජිකයන් වෙත රෙගුලාසි අංක. 13(3) අනුව ශුද්ධ දායක මුදල ගෙවීම. II. යෝජනා ක්‍රමයට සාමාජිකවූ පසුව රජයේ රැකියාවක් ලැබීම වැනි හේතු අනුව රෙගුලාසි අංක.12(2)(අ) අනුව ශුද්ධ දායක මුදල ආපසු ගෙවීම. III. සාමාජිකයන්ගේ විවිධ හේතු මත සිදුකරන ඉල්ලීම් අනුව ශුද්ධ දායක මුදල ආපසු ගෙවීම. කෙසේ වුව ද ඉහත අංක I. සහ II. අනුව මුදල් ආපසු ගෙවීමට සිදුවන අතර අංක III හි දක්වා ඇති පරිදි සිදු කරන ඉල්ලීම් වලදී යෝජනා ක්‍රමයේ රැඳී සිටීමට හෝ, එසේ නැතහොත් වෙනත් ගිණුමකට එම මුදල් මාරු කරන ලෙස ලිඛිතව අදාල සාමාජිකයින් වෙත දැනුවත් කරන අතර, ඉන් පසුවද දායක මුදල් ආපසු ලබා ගැනීමට ඉල්ලුම් කිරීමේ දී එම මුදල් ආපසු ගෙවීමට කටයුතු කර ඇත. මෙලෙස ගෙවීම් කිරීමේ දී පරිපාලන වියදම් සහ දිරි දීමනා සඳහා යම්කිසි ප්‍රතිශතයක් අඩු කරන අතර සාමාජිකයාගේ ගෙවිය යුතු මුදල සඳහා ඒ දක්වා ලැබූ පොළිය එකතු කර ශුද්ධ දායක මුදල ගෙවීමට කටයුතු කරයි.

2.3 (ආ)	සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ප්‍රධාන ආදායම් උත්පාදන ප්‍රභවය වන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සඳහා සාමාජිකයින් බඳවා ගැනීම, වාරික අයකරගැනීම, විශ්‍රාම වැටුප් ගෙවීම , අක්‍රිය සමාජිකයන් සක්‍රීය කිරීම වැනි කාර්යයන් සිදුකිරීම සඳහා දන්ත පද්ධති 02 ක් භාවිත කරනු ලැබුවද එම පද්ධති මඟින් බඳවා ගන්නා සාමාජිකයන්ගේ සක්‍රීය හා අක්‍රීය භාවය පිළිබඳව තොරතුරු සෘජුව ලබාගත නොහැකි අතර, අනුගාමී වාරික දහයක් ගෙවීම පැහැරහැරිය හොත් ඔප්පුවේ ප්‍රතිලාභ අහිමි වී සාමාජිකත්වය අක්‍රීය වේ. නමුත් දැනට භාවිතා වන පද්ධතිය තුළින් එය හඳුනාගැනීමට නොහැකි වී ඇත. එසේම විශ්‍රාම වැටුප් ,පාරිතෝෂික ගෙවීම සහ විශ්‍රාම වැටුප් අරමුදල් ආපසු ගෙවීම් පිළිබඳ වාර්තා පද්ධතිය තුළින් ජනනය නොවීම හේතුවෙන් මණ්ඩලය විසින් දැනට භාවිතා කරන පද්ධති මඟින් අවශ්‍ය පරිදි වාර්තා සකස්වීමේ පහසුකම් නොතිබුණි.	පවතින පරිගණක පද්ධති දෙකෙන් එක් පරිගණක පද්ධතියක් බාහිර සැපයුම්කරුවකු විසින් සපයා ඇති අතර එම ආයතනය මේ වන විට නොපවතී.එබැවින් අවශ්‍ය වැඩිදියුණු කිරීම් හා නඩත්තු කටයුතු කිරීමට නොහැකිව ඇත. අනෙක් පරිගණක පද්ධතිය මණ්ඩලයේ සේවයේ නියුතු පරිගණක පද්ධති සහයකවරකු විසින් තාවකාලික භාවිතය සඳහා ස්ථාපනය කරන ලද්දක් වන අතර, එම පද්ධතියේ ඇති පහසුකම් ඉතා සීමිත වේ. එබැවින් නව පරිගණක පද්ධතිය ස්ථාපනය කිරීමට කටයුතු කරමින් පවතින අතර, එම පද්ධතිය මඟින් අවශ්‍ය සියලු වාර්තා කඩිනමින් ලබා ගැනීමට සැලසුම් කර ඇත.
2.3 (ඇ)	සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අරමුදල සඳහා ආදායම් වශයෙන් සාමාජික දායක මුදල් හා ස්ථාවර තැන්පතු ආයෝජන සඳහා පොළි ලැබීම්ද වියදම් වශයෙන් විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ ගෙවීම්, දායක මුදල් ආපසු ගෙවීම්, විශ්‍රාම පාරිතෝෂික ගෙවීම්, නිලධාරීන්ට දිරිදීමනා යනාදී ගෙවීම්ද සිදුකර තිබුණි. ඉකුත් වර්ෂ 05 ක මූල්‍ය ප්‍රකාශන අනුව අරමුදලේ ආදායම්, වියදම් සහ අතිරික්තය සහ ඒවායේ ඉකුත් වර්ෂයන්ට සාපේක්ෂව වර්ධනය හා පිරිනීම් පරීක්ෂාවේදී අරමුදලේ ආදායම සාමාජිකයන්ගේ දායක මුදලින් හා ආයෝජන පොළි යන ආදායම් වලින් සමන්විත වන අතර 2022 හා 2023 වර්ෂ වල බැංකු වල ස්ථාවර තැන්පතු පොළි අධික ලෙස ඉහළ යෑම හේතුවෙන් පොළි ආදායම වැඩි වී අරමුදලේ ආදායම වැඩි වීම සිදුවී තිබුණි. නමුත් එය දිගු කාලීනව බලාපොරොත්තු විය නොහැකි අතර ප්‍රධාන ආදායම වන සාමාජිකයන්ගේ දායක මුදල, වියදමට සාපේක්ෂව වර්ධනය කර ගැනීම අඩු මට්ටමක පවතින බැවින් මෙම තත්වය සාමාජිකයන්ට ගෙවීම් හා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු වලට අහිතකර ලෙස බලපා තිබුණි.	විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සඳහා වාරිකය තීරණය කිරීමේදී ජීවගණක තක්සේරුකරුවන් විසින් සාමාජිකයා විසින් ගෙවනු ලබන මුදල මෙන්ම ඒ මත උපයන පොළියද සැලකිල්ලට ගනු ලැබේ. ඒ අනුව විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ගෙවීම සඳහා පිහිටුවා ඇති අරමුදල මූලික වශයෙන් සාමාජික මුදල් සහ එම මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන පොළී ආදායම මත ගොඩනැගෙයි.ඒ අනුව පොළී ආදායම වර්ධනය කර ගැනීමට කටයුතු කරන අතර ම සාමාජිකයන් බඳවා ගැනීම තුළින් මුල් වාරික මුදල වර්ධනය කර ගැනීම මෙන්ම පසු වාරික එකතු කිරීම වර්ධනය කර ගැනීමටත් කටයුතු කර ඇත. ඒ අනුව, මේ වන විට විශ්‍රාම වැටුප් අරමුදල ශක්තිමත් අරමුදලක් බවට පත් කර ගැනීමට හැකි වී තිබේ. මුල් වාරික රැස්කිරීමේ ප්‍රගතිය හා පසු වාරික රැස් කිරීම් ප්‍රගතිය පහත දක්වා ඇත. වර්ෂය | රැස්කළ මුල් වාරික මුදල (රු.) | රැස්කළ පසු වාරික මුදල (රු.) 2019 | 37,206,855.00 | 198,454,500.00 2020 | 44,391,354.36 | 176,484,465.64 2021 | 131,240,956.00 | 171,132,537.00 2022 | 115,358,139.00 | 221,922,207.00 2023 | 145,258,044.31 | 239,955,690.69

		එසේම පසුවාරික අයකිරීම කවදුරටත් වර්ධනය කිරීමටද සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරමින් පවතින බව සඳහන් කරමි.
2.3 (ඇ)	සහන, තිළිණ, ඉසුර සරණ. ධන ලක්ෂ්මී, සුරුකුම සහ ආරස්සාව යනාදි විශයෙන් විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ යෝජනා ක්‍රම 07 ක් මණ්ඩලය විසින් ආරම්භ කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සුරුකුම හා ආරස්සාව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම 02 පමණක් ක්‍රියාත්මකව පැවතුණි. සහන, සරණ, තිලිණ,ධන ලක්ෂ්මී යෝජනා ක්‍රම සඳහා බඳවාගත් 355,504 ක් වූ සාමාජිකයන් අතරින් සියයට 81 ක් එනම් 289,356 දෙනෙකුගේ සාමාජිකත්වය අක්‍රිය වී තිබුණ අතර ක්‍රියාත්මක වන සුරුකුම, ආරස්සාව හා ඉසුර විශ්‍රාම වැටුප් යොජනා ක්‍රම සඳහා බඳවාගත් 646,289 හි සාමාජිකයන් අතරින් සියයට 66 එනම් 428,572 දෙනෙකුගේ සාමාජිකත්වය අක්‍රිය වී තිබුණි.	මණ්ඩලය ආරම්භයේ හඳුන්වා දී ක්‍රියාත්මක කරන ලද "සහන", "තිළිණ" සහ "ඉසුරු" යෝජනා ක්‍රම සඳහා වාරික ගණනය කිරීමේදී සාමාජිකයාගෙන් අයකරන මුදලට අමතරව රජයේ දායක්වයක් ද අපේක්ෂා කර ඇත. එම රජයේ දායකත්වය මණ්ඩලයට ලබා නොදීම හේතුවෙන් ඉහත යෝජනා ක්‍රම සඳහා සාමාජිකයන් බඳවාගැනීම 2010 වර්ෂයේ සිට පියවර කීපයකින් අත්හිටුවා ඇත. 2012 වර්ෂයේ සිට "සහන" සහ "තිළිණ" යන යෝජනාක්‍රමවල අක්‍රිය සාමාජිකයන් එම යෝජනාක්‍රමවලම සක්‍රිය කිරීමද අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් පදනම්කොටගෙන අත්හිටුවන ලදී. රජයේ දායකත්වය නොලැබීම හේතුවෙන් මෙම යෝජනා ක්‍රම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමෙන් එම සාමාජිකයන්ට, ආයතනයට සහ රජයට මුහුණපෑමට සිදුවන ගැටළු අවම කරගැනීමට මෙම තීරණයය ගෙන ඇත. "සහන" සහ"තිළිණ" අක්‍රිය සාමාජික සංඛ්‍යාව ඉහල මට්ටමක පැවතීමට මෙම යෝජනා ක්‍රමවල සාමාජිකයන් සක්‍රිය කිරීම අත්හිටුවීමට හේතුවී ඇත. එසේ දැනට ක්‍රියාත්මක යෝජනාක්‍රම වන "සුරුකුම" සහ "ආරස්සාව" පූර්ව සැලසුම් ක්‍රමවල සාමාජිකයන් වෙත වාරික ගෙවීම් සඳහා පෙළඹවීම් කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. "ආරස්සාව" පූර්ව සැලසුම් යෝජනා ක්‍රමය "සුරුකුම" විශ්‍රාම වැටුප් ක්‍රමයට පූර්ව සැලසුමක් ලෙස ක්‍රියාත්මක වන්නකි. එහිදී සාමාජිකවන දරුවන් වෙනුවෙන් ගෙවනු ලබන මුදල් සහ ඒ මත උපයන පොළී ආදායම් පදනම්ව වයස අවුරුදු 18 දී "සුරුකුම" විශ්‍රාම වැටුප් ක්‍රමයේ සාමාජිකත්වය ලබාදීමට කටයුතු කරයි.

2.3 (ඉ)	අක්‍රිය සාමාජිකයන් සක්‍රිය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂයේ රු. මිලියන 4.6 ක මුදලක් වෙන්කර තිබූ අතර ඒ මඟින් අක්‍රිය සාමාජිකයින් 8000 ක් සක්‍රිය කිරීමටත් සක්‍රිය කිරීම මත එකතු කළ යුතු වාරික මුදල් මිලියන 80 ක් දක්වා එකතු කිරීම අපේක්ෂා කලද සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 586,000 ක් වියදම් කර සාමාජිකයින් 2724 දෙනෙකු සඳහා වාරික නොගෙවීම් පිළිබඳ ලිපි මඟින් දැනුම් දීමත් "ආරස්සාව " විශ්‍රාම වැටුප් ක්‍රමයේ සාමාජිකයින් 23,745 කගෙන් සාමාජිකයින් 489 ක් හෙවත් සියයට 13 ක් පමණක් නැවත සක්‍රිය කිරීම සාර්ථක කර ගෙන තිබූ අතර අපේක්ෂා කල පරිදි අක්‍රිය සාමාජිකයන්ගේ සක්‍රිය කිරීමේ ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට නොහැකි වී තිබුණි.	ආයතනයේ ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාවලියක් වන බඳවාගත් දායකයින් සක්‍රියව පවත්වාගෙනයාම සඳහා නිසි ක්‍රමවේදයක් ආයතනය සතුව නොමැති වීම හේතුවෙන් මේ සඳහා විශේෂ ව්‍යාපෘතියක් ලෙස 2022 මෙය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර, සැලසුම් කළ පරිදි පුහුණු නිලධාරීන්ගේ සේවය ලබා ගත නොහැකි වීමත් මෙම ව්‍යාපෘතිය සඳහා විශේෂයෙන් අනුයුක්ත කළ නිලධාරීන් රැස්කිරීම් අංශයේ නොසිටීමත් හේතුවෙන් සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපහසු වී ඇත. නමුත් 2023-12-31 දින වන විට රු. 500,856.68 ක පිරිවැයක් පමණක් දරමින් දායකයින් 725ක් සක්‍රිය කර රු. මිලියන 7,433,284.81ක මුදලක් රැස්කිරීමට මුදල් අංශයට හැකියාව ලැබී ඇති අතර දායකයින් 3267 සඳහා අක්‍රිය බව දැනුවත් කර වාරික ගෙවීම සඳහා දැනුවත් කිරීමේ ලිපි යැවීමට කටයුතු කර ඇත.
(ඊ)	මණ්ඩලය විසින් 2017 වර්ෂයේදී ආරම්භ කර තිබුණු කලාකරුවන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමය වෙනුවෙන් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය රු. මිලියන 94 ක මුදලක් ලබා දී තිබුණි. එම මුදල් බැංකු ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලේ ශේෂය රු. මිලියන 167 ක් දක්වා වර්ධනය කරගෙන තිබුණි. නමුත් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා 2017-2022 කාලය තුල කලාකරුවන් 509 ක් බඳවා ගෙන ඉන් 335 ක් අක්‍රීය වී ඇති අතර සමාලෝචිත වර්ෂයේ සාමාජිකයින් 361 ක් බඳවාගෙන සාමාජිකයන් 51 ක් අක්‍රීය වී තිබුණි. ඒ අනුව කලාකරුවන් වෙනුවෙන් ලැබුණ මුදල අදාල කාර්යය සඳහා නිසි පරිදි යෙදවීමට නොහැකිව තිබුණි.	කලාකරුවන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් සකස්කර ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වර්ෂ 2007 දී අවබෝධතා ගිවිසුමකට එළඹී අතර, එම ගිවිසුම අනුව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් කලාකරුවන් තෝරාගෙන එම කලාකරුවන් වෙනුවෙන් නියමිත වාරික මුදල් ද සමඟ මණ්ඩලයට යොමුකරන ලදී. පසුව 2017 වර්ෂයේදී සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය අනුව ඉහත ගිවිසුම අවලංගු කර නව ගිවිසුමකට එළඹෙන ලදී. ඒ අනුව ද කලාකරුවන් තෝරා මණ්ඩලයට ඉදිරිපත් කිරීමේ වගකීම සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සතුවේ. මෙහිදී යෝජනා ක්‍රමයට ගෙවිය යුතු වාරික මුදල අදාළ කලාකරු විසින් ගෙවිය යුතුවේ. සාමාජික වී වසරක් සම්පූර්ණ කළ කලාකරු වෙනුවෙන් රු. 50,000 ක ස්ථාවර තැන්පතුවක් කලාකරුවා නමින් පවත්වාගැනීම සඳහා රුපියල් මිලියන 94 ක තැන්පතුවක් මණ්ඩලයට ලබාදී ඇති අතර, එහි පොලී ආදායමෙන් එම තැන්පතු මුදල වෙන්කරනු ලබයි. ඒ අනුව මණ්ඩලයට ලබා දී

		ඇති රුපියල් මිලියන 94 සඳහා පොළී ආදායමට අනුව රු. 50,000/- බැගින් වෙන්කිරීමට හැකියාව ඇති සංඛ්‍යාවක් බඳවාගනු ලබයි. පළමු ගිවිසුම අනුව සාමාජික මුදල සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් ගෙවීමත්, නව ගිවිසුම මගින් එම වාරික මුදල කලාකරු විසින් ගෙවීමට සිදුවීම ද පදනම් කරගෙන කලාකරුවන් බඳවාගැනීමේ කාර්යය සංස්කෘතික නිලධාරීන්ගෙන් සිදුනොවීය. එසේම සාමාජිකවන කලාකරුවන් සක්‍රියව පවත්වාගැනීමේ වගකීම ද ගිවිසුම් ප්‍රකාරව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සතුවේ. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් මෙම සේවාවන් ප්‍රමාණවත් පරිදි සිදුනොවීම හේතුවෙන් මණ්ඩලය විසින් කලාකරුවන් බඳවාගැනීමේ වගකීම ඉටුකරමින් පවතියි. ඊට අමතරව වාරික ගෙවීම් පසුවිපරම් කිරීම ද සිදුකරයි. 2023.12.31 දින වන විට කලාකරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ප්‍රගතිය පහත සඳහන් පරිදි ඉදිරිපත් කරමි. මුළු බඳවාගැනීම් සංඛ්‍යාව - 870 සක්‍රිය සාමාජික සංඛ්‍යාව - 484 සක්‍රිය සංඛ්‍යාවේ ප්‍රතිශතය - 55.63 % කෙසේ වුවද කලාකරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය වඩාත් ආකර්ශනීය යෝජනා ක්‍රමයක් බවට පත් කල යුතු බවට හඳුනාගෙන ඇති අතර, ඒ සඳහා සාකච්ඡා වට කිපයක් පවත්වා නව යෝජනාවලියක් සකස් කර සංස්කෘතික දෙපාර්තමේන්තුවේ එකඟතාවය ඔවුන් වෙත ඉදිරිපත් කර ඇත.එම යෝජනාවලිය තුළින් මෙම කාර්ය වඩාත් කාර්යක්ෂම ව සිදු කිරීමට හැකි වනු ඇත.

කේ.ඒ.එස්. ප්‍රසන්න කළුආරච්චි.
සාමාන්‍යාධිකාරී.

පී.එස්.එස්. දික්වැල්ල.
සභාපති.

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

	සටහන	2023 (රු.)	2022 (රු.)
වත්කම්			
ජංගම වත්කම්			
අතැති මුදල් සහ බැංකු මුදල්	9	66,268,525	63,511,149
තැන්පතු	10	201,000	76,000
අත්තිකාරම්	11	96,800	110,880
කාර්ය මණ්ඩල ණය	12	9,203,900	9,477,209
වෙනත් වත්කම්	13	129,542,587	344,358,051
සිදුවෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු	14	1,090,250	1,090,250
ආයෝජන	15	3,203,988,258	2,536,179,200
මුළු ජංගම වත්කම්		**3,410,391,320**	**2,954,802,739**
ජංගම නොවන වත්කම්			
දේපල,පිරියත සහ උපකරණ	16	185,433,235	194,260,038
මුළු ජංගම නොවන වත්කම්		**185,433,235**	**194,260,038**
මුළු වත්කම්		**3,595,824,555**	**3,149,062,776**
අඩුකළා :			
වගකීම්			
ජංගම වගකීම්			
වෙනත් වගකීම්	17	146,797,925	128,351,810
මුළු ජංගම වගකීම්		**146,797,925**	**128,351,810**
ජංගම නොවන වත්කම්		3,263,593,395	2,826,450,929
ජංගම නොවන වගකීම්	18	38,486,215	35,983,850
මුළු වගකීම්		185,284,140	164,335,660
මුළු ශුද්ධ වත්කම්		3,410,540,415	2,984,727,116
මූල්‍ය සම්පාදනය කරනුයේ			
සමුච්චිත අරමුදල	19	(28,356,101)	(24,982,454)
ප්‍රත්‍යාගණන සංචිත	20	24,154,371	4,165,978
ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් අරමුදල	21	3,222,087,642	2,801,921,606
වැඩිහිටි අරමුදල් ගිණුම	22	1,238,594	1,054,692
රාජ්‍ය සහ අරමුදල් ප්‍රදාන	23	191,415,908	202,567,294
		3,410,540,415	2,984,727,116

"පිටු අංක 1 සිට 5 දක්වා දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති සහ පිටු අංක 10 සිට 17 දක්වා දක්වා ඇති සටහන් තුළින් මෙම මූල්‍ය ප්‍රකාශන වල අත්‍යවශ්‍ය කොටසක් සකස් කරනු ලැබේ. එසේම මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය සතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන, අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබා තිබේ. "

19/02/2024

ඩබ්.එස්.සී.ප්‍රනාන්දු	කේ.ඒ.එස්.සී.කළුආරච්චි	එච්.ඒ.ඛේ්ගෝඩගෙදර	පී.එස්.එස්.දික්වැල්ල
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)	සාමාන්‍යාධිකාරී	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	සභාපති

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
මුල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය
2023 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

	සටහන	**2023** (රු.)	**2022** (රු.)
ආදායම	1	154,629,511	152,273,830
මුළු ආදායම		**154,629,511**	**152,273,830**
මෙහෙයුම් වියදම්			
පුද්ගල පඩිනඩි	2	110,169,413	114,776,837
ගමන් වියදම්	3	2,859,059	1,218,290
සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ	4	4,391,322	4,267,296
නඩත්තු	5	3,186,576	3,351,042
ගිවිසුම්ගත සේවා	6	17,228,843	16,265,893
වෙනත් වියදම්	7	271,628	861,299
ක්ෂය වීම්	8	11,947,488	11,952,597
මුළු වියදම්		**150,054,328**	**152,693,253**
අදාළ කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/ හිඟය		**4,575,183**	**(419,422)**

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

2023.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

මෙහෙයුම් කාර්යයන්ගෙන් මූල්‍ය ප්‍රවාහය	2023 (රු.)	2022 (රු.)
වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය)	4,575,183	(419,422)
අඩුකළා :		
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලත් ලාභය	(6,199)	(39,130)
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම	-	(4,856,217)
අරමුදලෙන් ප්‍රදාන ක්‍රමක්ෂ කිරීම	-	(371,740)
නැවත තක්සේරු කිරීමේ සංචිතය ක්ෂය කිරීම	-	(6,724,640)
පෙර වර්ෂයේ ගැලපුම්	888,178	1,707,539
එකතු කළා : වර්ෂය සඳහා ක්ෂය වීම්	11,947,528	11,952,597
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	4,357,486	3,600,350
කාරක ප්‍රාග්ධන ලාභය	**21,762,175**	**4,849,337**
ඉන්වෙන්ට්‍රි වැඩි කිරීම	1,434,440	(2,203,118)
වෙළඳ හා අනෙකුත් ලැබීම් අඩුවීම්	213,529,333	542,722,554
පෙර ගෙවීම් වැඩි කිරීම	14,080	(110,880)
උපචිත වියදම් හා ගෙවිය යුතු මුදල් අඩුවීම්	18,446,115	(14,879,210)
වර්ෂය තුළ ගෙවූ පාරිතෝෂිකය	(1,855,121)	(1,743,145)
	231,568,847	**523,786,202**
මෙහෙයුම් කාර්යයන්ගෙන් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**253,331,022**	**528,635,539**
ආයෝජන කාර්යයන්ගෙන් මූල්‍ය ප්‍රවාහය		
ස්ථාවර වත්කම් මිලදී ගැනීම	(3,120,725)	(904,855)
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලත් මුදල්	6,200	45,600
ආයෝජන	(667,809,059)	(773,582,137)
ආයෝජන කාර්යයන්ගෙන් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**(670,923,584)**	**(774,441,392)**
මූල්‍ය කාර්යයන්ගෙන් මූල්‍ය ප්‍රවාහය		
විශ්‍රාම වැටුප් අරමුදලේ වැඩිවීම	420,349,937	254,008,695
ප්‍රාග්ධන ප්‍රධාන	-	-
මූල්‍ය කටයුතු වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**420,349,937**	**254,008,695**
භාවිතා කළ ශුද්ධ මුදල්	**2,757,376**	**8,202,842**
01/01/2023 දිනට මුදල් සහ මුදල් සමාන දෑ	63,511,149	55,308,307
31/12/2023 දිනට මුදල් සහ මුදල් සමාන දෑ	66,268,525	63,511,149

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
2023.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය

	අරමුදල්	Grants	Accumulated Fund & Reserves	Total
2022 ජනවාරි 01 දිනට ශේෂය	2,548,967,602	217,302,072	(24,389,791)	2,741,879,883
පූර්ව වර්ෂ ගැලපීම්	54,262,654	(9,506,821)	10,717,378	55,473,210
වසර තුළ මාරු කිරීම	199,746,042	(5,227,957)	(7,144,063)	187,374,023
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,802,976,299**	**202,567,294**	**(20,816,476)**	**2,984,727,117**
2023 ජනවාරි 01 දිනට ශේෂය	2,802,976,299	202,567,294	(20,816,476)	2,984,727,117
පූර්ව වර්ෂ ගැලපීම්	27,069,140	(11,151,386)	12,039,564	27,957,318
වසර තුළ මාරු කිරීම	393,280,797	-	4,575,183	397,855,980
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	**3,223,326,236**	**191,415,908**	**(4,201,729)**	**3,410,540,414**

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශයන්ට අදාල සටහන්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. සංස්ථාමය තොරතුරු

1.1 වාසස්ථාන සහ නෛතික ආකෘතිය

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (SLSSB) 1999 වසරේ අංක 33 පනත මගින් සංශෝධනය කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් 1996 වසරේ අංක 17 දරන පනත මගින් ස්ථාපිත කර ඇත. ප්‍රධාන කාර්යාල රාජගිරිය, රාජගිරිය පාරේ අංක 18 දරන ස්ථානයේ පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ප්‍රධාන කාර්යය වන්නේ රජයේ විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු සඳහා මාසික විශ්‍රාම වැටුපක් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දීම සහතික කිරීමයි. මෙම විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හරහා මාසික විශ්‍රාම වැටුපක්, අධ්‍යාපන ප්‍රතිලාභ, අර්ධ හා පූර්ණ අබලතා ප්‍රතිලාභ සහ මරණ පාරිතෝෂිකය ගෙවීමට කටයුතු සිදු කෙරේ.

1.3 සේවකයින් සංඛ්‍යාව

වර්ෂය අවසානය වන විට සිටි සේවකයන් සංඛ්‍යාව වනුයේ 152 කි.

2. පිළියෙළ කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශයන්ට ඇතුළත් වනුයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශයන්ට අදාල සටහන් වේ. මෙම මූල්‍ය ප්‍රකාශයන් සකස් කරනු ලබන්නේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ඉදිරිපත් කර තිබෙන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගණකාධිකාරී ප්‍රමිතීන්ට අනුකූලවය. (SLPSAS)

2.2. මිනුම් කිරීමේ පදනම

විකිණීමට ඇති වත්කම් සහ සාධාරණ වටිනාකමින් මනිනු ලබන මූල්‍ය වත්කම් හැර තක්සේරු කළ වත්කම් හැර ඓතිහාසික පිරිවැය පදනම යටතේ මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශනවල උද්ධමන සාධක සඳහා ගැලපීම් සිදු කර නොමැත.

2.3 මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ ඉදිරිපත් කිරීම

මෙම මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කොට ඇති අතර ඒවා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ක්‍රියාකාරී මුදල් වේ.

3.සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත දක්වා ඇති මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේද සඳහා අඛණ්ඩව යෙදී ඇත. ඉදිරිපත් කිරීමේ අරමුණු සඳහා අත්‍යවශ්‍ය සහ අවශ්‍ය වූ විට සංසන්දනය කිරීම සඳහා ප්‍රමාණය නැවත ස්ථාපිත කෙරේ.

3.1. දේපල, යන්ත්‍ර සහ උපකරණ

දේපල, යන්ත්‍ර සහ උපකරණ වල පිරිවැය යනුවෙන් දක්වනුයේ එහි අරමුණුගත කාර්යය සඳහා වත්කම් අත්කර ගැනීම සහ හෝ ඉදිකිරීමේ වියදම් පමණක් නොව වත්කම් ක්‍රියාකාරී තත්වයට ගෙන ඒම සඳහා දරනු ලබන ඕනෑම වියදමක්ද ඇතුළත් පිරිවැයකි. පිරිවැය වශයෙන් වත්කමක් මූලිකව හඳුනා ගැනීමෙන් පසුව වත්කම් ප්‍රති තක්සේරු කිරීම් කරනු ලබනුයේ එහි පසුකාලීනව සිදු විය හැකි ඕනෑම ක්ෂයවීමක් අඩු කළ ප්‍රති තක්සේරු කිරීම් කරනු ලබන ප්‍රමාණයකට වේ. අනිකුත් සියළුම දේපල, යන්ත්‍ර සහ උපකරණ දක්වා තිබෙනුයේ සමුච්චිත ක්ෂය කිරීම් අඩුකළ පිරිවැය ලෙස වේ.

එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ දී, අදාළ වන්නේ නම් වත්කම් වල ශේෂ වටිනාකම්, ප්‍රයෝජනවත් ආයු කාලය හා ක්ෂය වීම් ක්‍රම ඒවා අදාළ වන්නේ නම් සමාලෝචනය කර ගැලපුම් කර ලබා දී තිබේ.

ප්‍රදානයක් ලෙස අත්පත් වන දේපල, යන්ත්‍ර සහ උපකරණ

කිසියම් ප්‍රදානයක් ලෙස අත්පත් වන දේපල, යන්ත්‍ර සහ උපකරණ පිරිවැය යටතේ ප්‍රාග්ධනීකරණය කෙරේ.

දේපල, යන්ත්‍ර සහ උපකරණ සහ වෙනත් සින්නක්කර ඉඩම් දක්වා තිබෙනුයේ සමුච්චිත ක්ෂය කිරීම් අඩුකළ පිරිවැය ලෙස වේ. සින්නක්කර ඉඩම් වල පිරිවැය ප්‍රකාශිත වේ.

ඇස්තමේන්තුගත ආයු කාලයට වඩා පිරිවැය කපා හැරීම සඳහා සින්නක්කර ඉඩම් හැර වෙනත් සියලු දේපල, පිරිස් සහ උපකරණ මත ක්ෂය වීමක් අය කෙරේ.

අනුපාතික පදනම මත වර්ෂය සඳහා ක්ෂයවීම් ලබා දී ඇත.

දේපල, යන්ත්‍ර සහ උපකරණ සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ පහත දක්වා ඇති පරිදි සෘජු රේඛා ක්‍රමය පදනම් කොට ගෙන වේ. එසේම, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගණකාධිකාරී ප්‍රමිතීන් වල දක්වා ඇති පරිදි සියළුම දේපල, යන්ත්‍ර සහ උපකරණ වල ක්ෂයවීම් ගණනය කර ඇත්තේ පිරිවැය ක්‍රමය යටතේ වේ **(SLPSAS 7)**

1.	**මෝටර් රථ**	20%
2.	**දේපල, යන්ත්‍ර සහ උපකරණ**	25%
3.	**පරිගණක සහ වෙනත් ස්ථාවර වත්කම්**	25%
4.	**සන්නිවේදනය**	20%
5.	**ලී බඩු සහ කාර්යාලීය උපකරණ**	10%
6.	**ගොඩනැගිලි**	4%
7.	**වෙනත්**	10%.
8.	**මෘදුකාංග**	25%

බැහැර කරනු ලබන හෝ ඒවා බැහැර කිරීමෙන් හෝ භාවිතා කිරීමෙන් අනාගත ආර්ථික වටිනාකමක් හෝ අපේක්ෂා කළ නොහැකි ඒකක ආර්ථික වටිනාකමක් නොමැති දේපල, යන්ත්‍ර සහ උපකරණ යටතට දක්වනු ලැබේ. (මෙලෙස ආර්ථික වටිනාකමක් නොමැතිව බැහැර කරනු ලබන දේපලක යම්කිසි ලැබීමක් හෝ අහිමි වීමක් ගණනය කරනුයේ ශුද්ධ බැහැර කිරීමේ ඉපැයීම් අතර වෙනස වශයෙන් අතර දෙපළ බැහැර කරනු ලබන වර්ෂයේ ආදායම් ගිණුමේ මෙම අගය දක්වා ඇත.

මුල් තක්සේරුගත කාර්යසාධන ප්‍රමිතිය තුලින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ පවත්වා ගැනීමට හෝ ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා දේපල, යන්ත්‍ර සහ උපකරණ පවත්වා ගැනීම හෝ අළුත්වැඩියා කිරීම මත වැයවන වනුයේ පිරිවැයක් ලෙස හඳුනා ගැනේ.

ශේෂ පත්‍රයේ දිනය වන විට පහත වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති නමුත් තවමත් භාවිතයේ පවතී.. **SLPSAS-07** ලෙස, වෙළඳපල වටිනාකම මත නැවත තක්සේරු කළ යුතුය.

වත්කම්වල මිලදී ගැනීමේ අගයන් පහත පරිදි වේ.

1.	**සන්නිවේදනය**	4,737,540
2.	**ලී බඩු සහ කාර්යාලීය උපකරණ**	10,096,197
3.	**පරිගණක සහ වෙනත් ස්ථාවර වත්කම්**	23.063,419
4.	**දේපල, යන්ත්‍ර සහ උපකරණ**	9,932,023

3.2 සිදුවෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු

ප්‍රාග්ධන වැඩ-ප්‍රගතිය පෙන්නුම් කරන්නේ ශේෂ පත්‍රයේ දිනට සංවර්ධන අදියර යටතේ පවතින පරිගණක මෘදුකාංගවල පිරිවැයයි.

පරිගණක මෘදුකාංග සංවර්ධන ආයතනය වෙත **2019** වර්ෂයේදී සිදු කරන ලද රු. **1,090,250.00** ක අත්තිකාරම් ගෙවීමක්, ප්‍රාග්ධන වත්කම් ගිණුමට වැරදි ලෙස අය කර ඇති අතර දැන් එය නිවැරදි කර ශේෂ පත්‍රයේ දිනට ප්‍රාග්ධන කටයුතු-ප්‍රගතිය ලෙස සලකනු ලැබේ.

3.3. ඉන්වෙන්ට්‍රි

මූල්‍ය වර්ෂය තුළදී භාවිතා කළ ඉන්වෙන්ට්‍රි, ආදායම් හා වියදම් ප්‍රකාශයේ දක්වා ඇත.

තොග ශේෂ තක්සේරු කරනුයේ පිරිවැය, විකුණුම් මිල හෝ ශුද්ධ උපලබ්ධි කළ හැකි අගයෙන් වඩා අඩු අගය ඇති දර්ශකය මත වේ.

3.4. ආයෝජන

වසරකට වඩා අඩු කල්පැවැත්මක් සහිත මුදල් වෙලඳපොල අයෝජනයන් කෙටි කාලීන ආයෝජන ලෙස සලකනු ලබන අතර, වසරකට වැඩි කාලයක් දිගුකාලීන ආයෝජන ලෙස සලකනු ලැබේ. තවද සියලුම ආයෝජන පිරිවැය ලෙස දක්වා ඇත.

ස්ථාවර තැන්පතු සහ කෙටි කාලීන තැන්පතුවල ආයෝජනය පිරිවැය ලෙස දක්වා ඇත. එවැනි ආයෝජනවලින් ලැබෙන ආදායම උපචිත පදනම මත ගිණුම්ගත කර ඇත.

3.5. මුදල් සහ මුදල් වලට සමාන දෑ

මේ යටතට ගැනෙනුයේ අත ඇති මුදල් සහ බැංකු තැන්පතු වේ.

3.6. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සකසා තිබෙනුයේ අනියම් ක්‍රමයකට වේ.

3.7. බැරකම් සහ ප්‍රතිපාදන

ශේෂ පත්‍රයේ වත්මන් බැරකම් යටතේ සඳහන් කර ඇති බැරකම් ශේෂ පත්‍රයේ දිනයෙන් වර්ෂයක් ඇතුළත අයවීමට අපේක්ෂිත පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් වන අතර මෙම අයවීම් නිරවුල් වීම තුළින් ආර්ථික ප්‍රතිලාභ රැගත් සම්පත් පිටතට ගලා යෑමක් අපේක්ෂා කෙරේ. ණය හිමියන්ගේ ඉල්ලීම මත ගෙවිය යුතු ගෙවීම් හෝ ශේෂ පත්‍රයේ දින සිට වසරක් ඇතුළත ගෙවිය යුතු ගෙවීම් ශේෂ පත්‍රයේ ජංගම වගකීම් ලෙස සැලකේ.

පසුගිය අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයට වර්තමානයේදී නීත්‍යානුකූල හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් අතිවීමකදී එලෙස ඇතිවූ බැඳීම් පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත්වන සම්පත් පිටාර ගැලීමක් අවශ්‍ය විය හැක

3.8. බදු අය කිරීම

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ එහි සංශෝධන අනුව මූල්‍ය ප්‍රකාශනයේ වාර්තා කර ඇති බදු වියදම් සහ ගණනය කර ඇත.

3.9.සේවක ප්‍රතිලාභ
I. දායක මුදල් සැලැස්ම අර්ථ දැක්වීම.

දායක මුදල් සැලැස්මේ බැඳීම්, ආදායම් ප්‍රකාශනයේ දැරිය යුතු වියදම් ලෙස හඳුනා ගැනේ. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය අර්ථසාධක අරමුදල් සඳහා 12% ක් සහ භාරකාර අරමුදල් සඳහා සේවකයින්ගේ දළ වැටුපෙන් 3% ක්ද වන පරිදි දායකත්වය ලබාදේ.

II. ප්‍රතිලාභ සැලැස්ම අර්ථ දැක්වීම

ප්‍රතිලාභ සැලැස්ම යනු පාරිතෝෂිකය වේ. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය අදාළ ප්‍රඥප්තිය අනුව පාරිතෝෂික ගෙවීමට වග බලා ගත යුතුය. මෙම වගකීම් පූර්ණය කිරීම සඳහා,ප්‍රතිපාදන ශේෂ පත්‍රයේ ඉදිරියට රැගෙන එනු ලබන අතර එය සේවයේ පළමු වසරේ සිට ආරම්භ කරන සෑම සේවක වර්ෂයක් සඳහාම සියළුම සේවකයින්ගේ මූල්‍ය වර්ෂයේ අර්ධ මාසයක වැටුප ගණනය කරන ලද මුදලකට සමාන වේ.

වර්ෂ 1983 අංක 12 දරණ පාරිතෝෂික පනත යටතේ පාරිතෝෂික ගෙවිය හැකි සියළුම සේවකයන් වෙත විශ්‍රාම පාරිතෝෂික ලබා දෙනු පිණිස ප්‍රතිපාදන සලසා ඇත. මෙම අයිතමය ශේෂ පත්‍රයෙහි නොගෙවූ වගකීම් යටතේ වර්ගීකරණය කර ඇත.

භාණ්ඩාගාරයට අනුව, අවශ්‍ය වන විට අරමුදල් ප්‍රදානය කරන බැවින් අරමුදල් අවශ්‍ය නොවේ.

3.10. ආදායම් හඳුනා ගැනීම

1. ආදායම් හඳුනා ගැනීම

බදවාගැනීමේ ගාස්තු සහ දායකයින්ගේ වාරික ගිණුම් ගත වනුයේ මුදල් පදනම මත වන අතර පොලි ආදායම් සහ අනිකුත් සියළුම ආදායම් උපචිත පදනමින් ගිණුම්ගත වේ.

ප්‍රාග්ධන ප්‍රදාන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ මුළු ආදායම් ලෙස සැලකේ.

II. වියදම්

මණ්ඩලය පවත්වා ගැනීම සඳහා වැයවන සියළුම මුදල් උපචිත පදනමින් ගිණුම්ගත වන අතර ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ආදායම් ධාරිතාවය එලෙස පැවතීම හෝ ආදායම් ධාරිතාවය වැඩි කිරීම අරමුණු කොට ගෙන ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම, පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා වැයවන මුදල් ප්‍රාග්ධන වියදම් ලෙස හැඳින්වේ.

3.11. සංසන්දනාත්මක තොරතුරු

එය අවශ්‍ය වූ විට, සංසන්දනාත්මක සංඛ්‍යා වත්මන් වර්ෂය ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි නැවත සකස් කර ඇත.

3.12. ශේෂ පත්‍රයේ දිනට පසු සිදුවන සිදුවීම්

සියළු ද්‍රව්‍ය පශ්චාත් ශේෂ පත්‍ර පිළිබඳ සිදුවීම් සලකනු ලබන අතර ගිණුම් ප්‍රකාශනයේ අදාළ සටහනට සුදුසු පරිදි ගැලපීම හෝ අනාවරණය කිරීම් සිදු කර ඇත.

3.13. බැඳීම් සහ අවිනිශ්චිත ප්‍රතිපාදන

අතීත සිදුවීම් වලින් ඇතිවිය හැකි වත්කම් හෝ බැඳීම් අවිනිශ්චිත ප්‍රතිපාදන යටතට ගනු ලබන අතර ඒවා නිශ්චිත වනුයේ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයට පාලනය කළ නොහැකි අවිනිශ්චිත අනාගත සිදුවීම්වල සිදුවීම හෝ සිදු නොවීම මත පමණි.

3.14. ප්‍රදානයන් ගිණුම්ගත කිරීම

i. රාජ්‍ය ප්‍රදාන

ඉදිරිපත් කිරීමේ ක්‍රම ඇතුළුව රාජ්‍ය ප්‍රදාන සඳහා අනුගත ගිණුම්කරණ ප්‍රතිපත්තිය පහත දැක්වේ.

ඒ. වත්කම් මිලදී ගැනීම සඳහා රජයේ ප්‍රදාන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ මුළු ආදායම ලෙස පිළිගැනේ.

බී. අරමුදලින් ලැබුණු මුළු ප්‍රදානයන් මෙන්ම ඒ සඳහා වූ වියදම් ලාභ හා අලාභය තුළ හඳුනාගෙන ඇත.

සී. 2022 මූල්‍ය වර්ෂය දක්වා ලැබුණු ප්‍රාග්ධන ප්‍රදානය (මුල් ප්‍රාග්ධනය රු. 28, 600,000 හැර) 2023 වර්ෂයේ සමුච්චිත අරමුදල් ගිණුමට රුපියල් 11, 151,386 ක් මාරු කරන ලදී.

3.15. විදේශ මුදල් ගනුදෙනු

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේහි මෙහෙයුම් සහ වාර්තාකරණ මුදල් ශ්‍රී ලංකා රුපියල් වේ.
කෙසේ වෙතත්, විදේශ මුදල් වල (USD) ගණුදෙණු සටහන් වන්නේ ගණුදෙණු දිනයේ පවතින විනිමය අනුපාතයටය. විදේශ මුදල් ගනුදෙනුවල යම් ලාභයක් හෝ අලාභයක් මූල්‍ය වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශයේ වෙනත් ආදායමක් ලෙස පිළිගැනේ.

මුල්‍ය ප්‍රකාශයේ සටහන්

සටහන 01 අදායම	2023 රු.	2022 රු.
1.1 - පොලී ආදායම සටහන් අංක **01 (I)**	**3,419,118**	**1,780,138**
1.2 - ප්‍රදාන සටහන් අංක **01 (II)**	**151,100,000**	**138,400,000**
1.3 - වෙනත් ආදායම් සටහන් අංක **01 (III)**	**110,393**	**12,093,692**
මුළු ආදායම	**154,629,511**	**152,273,830**

සටහන **01 (I)** ආදායම	2023 රු.	2022 රු.
1.1 - පොලී ආදායම		
අපදා ණය (I) පොලී	120,750	122,044
විශේෂ අත්තිකාරම් පොලී	5,285	4,257
වෙනත් ආදායම් - පොලී	-	-
INTREST - INCOME SYSTEM	3,293,083	1,653,837
මුළු ආදායම	**3,419,118**	**1,780,138**

සටහන **01 (II)** ආදායම	2023 රු.	2022 රු.
1.2 - ප්‍රදාන		
රජයේ ප්‍රදාන - පූනරාවර්තන	145,800,000	138,400,000
රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන	5,300,000	-
TRANSER ACCOUNTS A/C 213	-	-
මුළු ආදායම	**151,100,000**	**138,400,000**

සටහන**01 (III)** ආදායම	2023 රු.	2022 රු.
1.3 - වෙනත් ආදායම්		
විවිධ ආදායම්	104,194	101,966
ගර්හිත හා ප්‍රාග්ධන භාණ්ඩ විකිණීම	6,199	39,130
වෙනස් ආදායම්	-	11,952,597
මුළු ආදායම	**110,393**	**12,093,692**

සටහන **02** පුද්ගල වියදම් -පුද්ගල පඩිනඩි	2023 රු.	2022 රු.
වැටුප් හා වේතන	89,694,905	94,802,037
EPF	9,411,644	9,644,634
ETF	2,350,409	2,411,810
අතිකාල සහ නිවාඩු දින වැටුප්	830,488	822,390
වෙනත් දීමනා	3,524,482	3,495,616
පාරිතෝෂික	4,357,486	3,600,350
එකතුව	**110,169,413**	**114,776,837**

මූල්‍ය ප්‍රකාශයේ සටහන්

සටහන 03 ගමන් වියදම්	2023 රු.	2022 රු.
ගමන් වියදම් - දේශීය	2,859,059	1,218,290
ගමන් වියදම් - විදේශීය	-	-
එකතුව	**2,859,059**	**1,218,290**

සටහන 04 සැපයුම් සහ පාරිභෝගික භාණ්ඩ	2023 රු.	2022 රු.
මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය	2,270,313	2,114,916
ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය	1,474,828	1,723,040
සංග්‍රහ වියදම්	319,666	278,403
පුවත්පත්	15,360	10,640
නිල ඇඳුම්	116,000	-
වෙනත් සැපයුම්	195,156	140,296
එකතුව	**4,391,322**	**4,267,296**

සටහන 05 නඩත්තු	2023 රු.	2022 රු.
නඩත්තු වියදම් - ගොඩනැගිලි සහ අළුත්වැඩියා	162,035	124,260
නඩත්තු වියදම් - යන්ත්‍රෝපකරණ හා කාර්යාල උපකරණ	1,664,050	1,546,087
නඩත්තු වියදම් - වාහන	1,360,491	1,680,695
එකතුව	**3,186,576**	**3,351,042**

සටහන 06 ගිවිසුම්ගත සේවා	2023 රු.	2022 රු.
ප්‍රවාහන	26,415	99,405
විදුලි සංදේශ	1,980,687	2,375,935
තැපැල් ගාස්තු	3,020,212	2,443,702
විදුලිය සහ ජලය	3,955,258	3,060,743
පිරිසිදු කිරීමේ ගාස්තු	1,071,346	1,047,190
ආරක්ෂක ගාස්තු	1,549,660	1,538,736
දැන්වීම්	38,813	38,813
කුලී සහ දේශීය බදු	131,614	102,870
විගණන ගාස්තු	489,900	276,000
මෙහෙයුම් කල්බදු වාහන මිලදී ගැනීමේ කුලී	4,964,940	5,282,500
එකතුව	**17,228,843**	**16,265,893**

සටහන 07 වෙනත් වියදම්	2023 රු.	2022 රු.
ප්‍රවර්ධන වියදම්	41,145	99,040
වෙනත් පුනරාවර්තන වියදම්	92,860	727,489
රැඳවුම් බද්ද	137,623	34,770
එකතුව	**271,628**	**861,299**

මුල්‍ය ප්‍රකාශයේ සටහන්

සටහන 08 ක්ෂය වීම්	2023 රු.	2022 රු.
ගොඩනැගිලි	3,712,026	3,710,007
මෝටර් රථ	3,729,400	3,731,685
පරිගණක	1,657,691	2,168,510
ලී බඩු සහ කාර්යාලීය උපකරණ	1,480,394	1,615,741
මෘදුකාංග වැඩිදියුණු කිරීම	-	13,167
යන්ත්‍ර සහ බලාගාර	588,077	645,331
වෙනත්	32,070	68,156
අක්‍රිය දායකයින් නැවත සක්‍රිය කිරීම	747,830	-
එකතුව	**11,947,488**	**11,952,597**

සටහන 09 අත ඇති සහ බැංකු මුදල්	2023 රු.	2022 රු.
PB - C/A - 174100120350213	16,818,746	6,039,957
PB - C/A - 174100140350212	(1,121,454)	7,531,894
PB - S/A - USD - 174402140350212	3,984,216	1,427,577
PB - JANAJAYA CALL DEPOSITS - 174200210350	22,430,131	40,474,512
BOC - C/A - 228073	112,650	1,366,750
BOC - CALL DEPOSITS - 3532598	23,201,952	6,169,209
NSB - S/A - 101110107557	247,226	118,240
PB - 174100230350212	301,397	205,181
RDB - 135011100464	293,661	177,828
එකතුව	66,268,525	63,511,149

සටහන 10 තැන්පතු	2023 රු.	2022 රු.
ආපසු ලබාදෙන තැන්පතු - ඉන්ධන	200,000	75,000
ආපසු ලබාදෙන තැන්පතු - වෙනත්	1,000	1,000
එකතුව	**201,000**	**76,000**

සටහන 11 අත්තිකාරම්	2023 රු.	2022 රු.
කැපැල්	96,800	110,880
එකතුව	**96,800**	**110,880**

සටහන 12 කාර්ය මණ්ඩල ණය	2023 රු.	2022 රු.
ආපදා ණය 1	3,117,640	2,049,278
ආපදා ණය 2	133,749	230,680
ආපදා ණය 3	5,934,260	7,189,001
උත්සව අත්තිකාරම්	18,250	8,250
එකතුව	**9,203,900**	**9,477,209**

මූල්‍ය ප්‍රකාශයේ සටහන්

සටහන 13 වෙනත් වත්කම්	2023 රු.	2022 රු.
ලැබිය යුතු පොලිය - ස්ථිර තැන්පතු	108,928,862	329,193,211
ලැබිය යුතු පොලිය - ස්ථිර තැන්පතු සංස්කෘතික	12,156,028	5,730,153
INTEREST RECIVABLE SYSTEM	1,093,454	695,402
තොගය	6,473,555	7,907,995
ලැබිය යුතු කාර්ය මණ්ඩල ලැබීම්	482,078	308,590
රක්ෂණ පෙර ගෙවුම්	133,610	247,700
INTEREST RECIVABLE JALAYA	-	-
RECIVABLE FROM TRESURY FUND	275,000	275,000
එකතුව	**129,542,587**	**344,358,051**

සටහන 14 සිදුවෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු	2023 රු.	2022 රු.
මෘදුකාංග ස්ථාපනය	1,090,250	1,090,250
එකතුව	**1,090,250**	**1,090,250**

සටහන 15 ආයෝජන	2023 රු.	2022 රු.
ආයෝජන -ස්ථාවර තැන්පතු	3,019,434,247	2,371,021,770
ආයෝජන - සංස්කෘතික	167,424,749	150,785,526
ආයෝජන - මෘදුකාංග	17,129,263	14,371,904
ආයෝජන - ජාලය	-	-
එකතුව	**3,203,988,258**	**2,536,179,200**

සටහන 15.1 ආයෝජන - දිගු කාලීන	2023 රු.	2022 රු.
ආයෝජන -ස්ථාවර තැන්පතු	-	-
ආයෝජන - සංස්කෘතික	-	-
ආයෝජන - මෘදුකාංග	-	-
ආයෝජන - ජාලය	-	-
එකතුව	-	-

සටහන 15.2 ආයෝජන - කෙටි කාලීන	2023 රු.	2022 රු.
ආයෝජන -ස්ථාවර තැන්පතු	3,019,434,247	2,371,021,770
ආයෝජන - සංස්කෘතික	167,424,749	150,785,526
ආයෝජන - මෘදුකාංග	17,129,263	14,371,904
ආයෝජන - ජාලය	-	-
එකතුව	**3,203,988,258**	**2,536,179,200**

සටහන 16

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

2023 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්

විස්තරය	ගොඩනැගිලි	මොටර් රථ	ලී බඩු සහ කාර්යාලීය උපකරණ	පරිගණක	පන්හිඳවේදන	බලාගාර සහ යන්ත්‍රෝපකරණ	මෘදුකාංග	වෙනත්	ඉඩම්	ප්‍රවර්ධන - අක්‍රිය දායකයින් සක්‍රිය කිරීම්	එකතුව
	රු	රු	රු	රු	රු	රු	රු	රු	රු	රු	රු
2023 ජනවාරි 01 දිනට පිරිවැය	92,750,181	18,647,000	26,586,868	31,965,564	4,737,540	12,543,301	24,401,068	1,066,105	97,050,000	1,422,576	311,170,203
ප්‍රත්‍යාගණනය	-	-	-	-	-	-	-	-			-
මාරු කිරීම්	-	-	-	-	-		-	-			-
එකතු කිරීම්	347,551	-	504,244	1,521,100	-		-	-	-	747,830.00	3,120,725
බැහැර කිරීම් / විකිණීම්	-	-	-	76,080	-	-	-	-	-		76,080
SCRAPPE			189,190	6,945	2,550						198,685
2023 දෙසැම්බර් 31 දිනට පිරිවැය	93,097,732	18,647,000	26,901,922	33,403,639	4,734,990	12,543,301	24,401,068	1,066,105	97,050,000	2,170,406	314,016,163
2023 ජනවාරි 01 දිනට සමුච්චිත ක්ෂය වීම්	14,702,638	11,501,476	18,656,842	28,719,877	4,737,500	11,734,151	24,401,068	1,034,036	-	1,422,576	116,910,164
මාරු කිරීම්		-	-	-	-		-	-		-	-
ප්‍රත්‍යාගණනය	-	-	-	-	-	-	-	-	-	-	-
ක්ෂය වීම්	3,712,026	3,729,400	1,480,394	1,657,691	40	588,077	-	32,070	-	747,830	11,947,528
බැහැර කිරීම් / විකිණීම්	-	-	-	76,079	-	-	-	-	-	-	76,079
SCRAPPE			189,190	6,945	2,550						198,685
2023 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂයවීම	18,414,664	15,230,876	19,948,046	30,294,544	4,734,990	12,322,228	24,401,068	1,066,106	-	2,170,406	128,582,928
2023 ජනවාරි 01 දිනට W.D.V	78,047,543	7,145,524	7,930,026	3,245,687	40	809,150	-	32,069	97,050,000	0	194,260,039
2023 දෙසැම්බර් 31 දිනට W.D.V	74,683,068	3,416,124	6,953,876	3,109,095	(0)	221,073	-	(1)	97,050,000	0	185,433,235

මුල්‍ය ප්‍රකාශයේ සටහන්

සටහන 17 වෙනත් වගකීම්	2023 රු.	2022 රු.
උපචිත වියදම් - වෙනත් දීමනා	-	60,000
උපචිත වියදම් - අතිකාල	62,093	51,195
උපචිත වියදම් - ගමන් වියදම්	189,741	307,537
උපචිත වියදම් - ලිපිද්‍රව්‍ය	193,233	1,698,280
උපචිත වියදම් - ඉන්ධන	218,697	203,993
උපචිත වියදම් - වෙනත් සැපයුම්	7,210	3,115
උපචිත වියදම් - වාහන නඩත්තු	3,500	253,450
උපචිත වියදම් - යන්ත්‍ර සහ බාලාගාර නඩත්තුව	39,000	18,900
උපචිත වියදම් - ප්‍රවාහන	4,000	-
උපචිත වියදම් - විදුලි සංදේශ	3,091	302,176
උපචිත වියදම් - තැපැල් ගාස්තු	57,686	78,787
උපචිත වියදම් - ජලය සහ විදුලිය	13,299	325,108
උපචිත වියදම් - වෙනත් ගිවිසුම්ගත සේවා	219,188	663,123
උපචිත වියදම් - පාරිතෝෂික ගෙවීම්	-	103,560
උපචිත වියදම් - විගණන ගාස්තු	489,900	552,000
උපචිත වියදම් - රැඳවුම් බදු	2,640,640	16,459,663
උපචිත වියදම් -රදවාගැනීමේ ගැනීමේ බදු ගෙවිය යුතු - සංස්කෘතික	-	286,508
උපචිත වියදම් - මෙහෙයුම් කල්බදු වාහන මිලදී ගැනීමේ කුලි	379,705	320,500
OPER.LESING METHOD	77,000	-
උපචිත වියදම් - වෙනත් පුනරාවර්තන	1,800	-
ගෙවිය යුතු දිරි දීමනා	43,620,000	32,008,764
ගෙවිය යුතු රැඳවුම් දීමනා	60,610	60,610
ගෙවිය යුතු ආරක්ෂක බදු	50,000	50,000
පිරිසිදු කිරීමේ තැන්පතු -1 ගෙවිය යුතු	25,000	25,000
කාර්ය මණ්ඩල ගෙවිය යුතු	98,626	157,992
ආපසු ගෙවිය තැන්පතු ගෙවිය යුතු	30,000	30,000
වැටුප් පාලන ගිණුම	317,766	332,755
WITHHOLDING TAX PAYBLE SYSTEM	27,642	34,770
නඳුනා නොගත් බැංකු තැන්පතු (24 සටහන)	2,630,747	2,950,621
SUSPENSE ACCOUNT	1,157,609	1,157,609
INTERST INCOME PAYBLE CULTURE	36,468	17,190
PAYABLE TO SLSSB PROMATION FUND	275,000	275,000
උපචිත වියදම් 212	3,344,148	1,812,216
INTERST INCOME CULTURE LIABILIT	90,528,267	67,751,388
REFUNDABLE DEPOSIT - STAFF	8,000	-
PAYBLE TO OTHER FUNDS BENEFITS	(11,741)	-
එකතුව	**146,797,925**	**128,351,810**

සටහන 18 ජංගම හා ජංගම නොවන වගකීම්	2023 රු.	2022 රු.
ගෙවිය යුතු පාරිතෝෂික (18 (1) සටහන)	38,171,015	35,668,650
ආයෝජන - ආරක්ෂාව - රශ්මි නිමේෂා	255,000	255,000
ආයෝජන - ආරක්ෂාව - රසානි දිලිනිකා	50,200	50,200
ආයෝජන - ආරක්ෂාව - 100 චිත්‍ර තරඟකරුවන්	10,000	10,000
එකතුව	**38,486,215**	**35,983,850**

මුල්‍ය ප්‍රකාශයේ සටහන්

සටහන 18 (I) සාරිතෝෂික	2023 රු.	2022 රු.
වර්ෂය මුලදී ඇති ශේෂය	35,668,650	33,811,445
පෙර වර්ෂයේ ගැලපීම්	-	-
වර්ෂය සඳහා ගාස්තු	4,357,486	3,600,350
වර්ෂය තුළ ගෙවා ඇති පාරිතෝෂික	1,855,121	1,743,145
එකතුව	**38,171,015**	**35,668,650**

සටහන 19 සමුච්චිත අරමුදල	2023 රු.	2022 රු.
වසර ආරම්භයේදී පවතින ශේෂය	(24,982,454)	(48,544,163)
පෙර වර්ෂයේ ගැලපීම්	(7,948,829)	23,981,131
වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය)	4,575,183	(419,422)
එකතුව	**(28,356,101)**	**(24,982,454)**

සටහන 20 ප්‍රත්‍යාගණන සංචිත	2023 රු.	2022 රු.
ආරම්භක ශේෂය	4,165,978	24,154,371
පෙර වර්ෂ ගැලපීම්	19,988,393	(13,263,753)
කපා හැරීම් අගය		(6,724,640)
එකතුව	**24,154,371**	**4,165,978**

සටහන 21 ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් අරමුදල	2023 රු.	2022 රු.
ආරම්භක ශේෂය	2,707,921,606	2,453,954,766
පෙර වර්ෂයේ ගැලපීම්	27,069,140	54,262,653
මෙම වර්ෂයේ ගැලපීම්	-	
වර්ෂය තුළ මාරු කිරීම්	393,096,895	199,704,187
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ අරමුදල		
ආරම්භක ශේෂය	94,000,000	94,000,000
වර්ෂය තුළ සිදුවූ ගනුදෙනු කිරීම්		
විශ්‍රාමිකයන්ගේ දීමනා		
එකතුව	**3,222,087,642**	**2,801,921,606**

සටහන 22 වැඩිහිටි දීමනා ගිණුම	2023 රු.	2022 රු.
ආරම්භක ශේෂය	1,054,692	1,012,837
මෙම වර්ෂයේ ගැලපීම්	-	-
වර්ෂය තුළ පොළිය	267,002	179,855
ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ගෙවීම්	(83,100)	(138,000)
එකතුව	**1,238,594**	**1,054,692**

මූල්‍ය ප්‍රකාශයේ සටහන්

සටහන 23 රජයේ දීමනා සහ අරමුදල්	2023 රු.	2022 රු.
ප්‍රාග්ධනය - රජයේ	28,600,000	36,485,786
ප්‍රාග්ධන - නව ශ්‍රවණාගාරයක් ඉදිකිරීම	-	540,000
ප්‍රාග්ධන - ප්‍රවර්ධන කටයුතු සඳහා වන අලෙවි ජාලය	-	2,725,600
ප්‍රාග්ධන - අරමුදල්	162,815,908	162,815,908
එකතුව	**191,415,908**	**202,567,294**

සටහන 23 (I) ප්‍රාග්ධනය - රජය	2023 රු.	2022 රු.
ආරම්භක ශේෂය	36,485,786	37,594,344
ප්‍රාග්ධනය - මෘදුකාංග පද්ධතිය		12,511,000
පෙර වර්ෂයේ ගැලපීම්	(7,885,786)	(8,763,341)
වසර තුළ මාරු කිරීම්	-	(4,856,217)
එකතුව	**28,600,000**	**36,485,786**

සටහන 23 (II) ප්‍රාග්ධනය - අරමුදල	2023 රු.	2022 රු.
ආරම්භක ශේෂය	162,815,908	163,931,128
පෙර වර්ෂයේ ගැලපීම්	-	(743,480)
වසර තුළ මාරු කිරීම්	-	(371,740)
එකතුව	**162,815,908**	**162,815,908**

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
2016 - 2023 දක්වා හඳුනා නොගත් තැන්පතු පිළිබඳ විස්තර

වසර	බැංකුව	**2023-12-31** දිනට හඳුනාගත යුතු තැන්පතුවල මුළු වටිනාකම	**2023-12-31** දක්වා හඳුනාගෙන ගිණුම්ගත කර ඇති හඳුනා නොගත් තැන්පතුවල මුළු වටිනාකම	**2023-12-31** හඳුනා ගත යුතු ශේෂය	**2023-12-31** දිනට හඳුනා නොගත් තැන්පතු පිළිබඳ විස්තර	
					දායකයා හඳුනා ගැනීම සඳහා තැන්පත්කරු බැංකු පත්‍රිකාවේ කිසිදු විස්තරයක් නොතැබූ බැවින් හඳුනාගෙන නොමැති ශේෂය	**(f)** සහ **(g)** හි සඳහන් කර ඇති හේතු හැර හඳුනා ගැනීමට ඉතිරිව ඇති ශේෂය
(a)	(b)	(c)	(d)	(e) = (c) - (d)	(g)	(h)
		Rs	Rs	Rs	Rs	Rs
2016	ලංකා බැංකුව	22,375,693.00	22,336,773.00	38,920.00	17,583.00	21,337.00
	මහජන බැංකුව	11,364,867.00	11,364,507.00	360.00	-	360.00
	ඉතිරි කිරීමේ බැංකුව	773,205.00	773,205.00	-	-	-
	එකතුව	**34,513,765.00**	**34,474,485.00**	**39,280.00**	**17,583.00**	**21,697.00**
2017	ලංකා බැංකුව	30,234,011.00	30,197,125.00	36,886.00	33,908.00	2,978.00
	මහජන බැංකුව	15,590,484.00	15,577,671.00	12,813.00	-	12,813.00
	ඉතිරි කිරීමේ බැංකුව	467,308.00	467,308.00	-	-	-
	එකතුව	**46,291,803.00**	**46,242,104.00**	**49,699.00**	**33,908.00**	**15,791.00**
2018	ලංකා බැංකුව	37,225,295.00	36,992,056.00	233,239.00	40,287.00	192,952.00
	මහජන බැංකුව	12,204,785.00	12,083,527.00	121,258.00	-	121,258.00
	ඉතිරි කිරීමේ බැංකුව	357,918.00	357,918.00	-	-	-
	එකතුව	**49,787,998.00**	**49,433,501.00**	**354,497.00**	**40,287.00**	**314,210.00**
2019	ලංකා බැංකුව	38,917,698.00	38,575,683.28	342,014.72	-	342,014.72
	මහජන බැංකුව	9,949,601.00	9,645,760.00	303,841.00	-	303,841.00
	ඉතිරි කිරීමේ බැංකුව	151,412.00	151,412.00	-	-	-
	එකතුව	**49,018,711.00**	**48,372,855.28**	**645,855.72**	-	**645,855.72**
2020	ලංකා බැංකුව	23,086,244.98	23,033,388.98	52,856.00	-	52,856.00
	මහජන බැංකුව	12,883,612.94	12,789,835.12	93,777.82	-	93,777.82
	ඉතිරි කිරීමේ බැංකුව	94,341.00	93,213.00	1,128.00	-	1,128.00
	එකතුව	**36,064,198.92**	**35,916,437.10**	**147,761.82**	-	**147,761.82**
2021	ලංකා බැංකුව	65,354,459.14	65,134,507.64	219,951.50		219,951.50
	මහජන බැංකුව	14,238,341.54	14,071,366.54	166,975.00		166,975.00
	ඉතිරි කිරීමේ බැංකුව	123,965.00	123,965.00	-		-
	එකතුව	**79,716,765.68**	**79,329,839.18**	**386,926.50**	-	**386,926.50**
2022	ලංකා බැංකුව	86,905,538.93	86,705,734.63	199,804.30		199,804.30
	මහජන බැංකුව	17,912,313.97	17,681,477.85	230,836.12		230,836.12
	ඉතිරි කිරීමේ බැංකුව	77,127.00	77,117.00	10.00		10.00
	එකතුව	**104,894,979.90**	**104,464,329.48**	**430,650.42**	-	**430,650.42**
2023	ලංකා බැංකුව	127,717,167.39	127,405,466.79	311,700.60		311,700.60
	මහජන බැංකුව	54,732,331.43	54,468,455.86	263,875.57		263,875.57
	ඉතිරි කිරීමේ බැංකුව	107,843.00	107,343.00	500.00		500.00
	එකතුව	**182,557,341.82**	**181,981,265.65**	**576,076.17**	-	**576,076.17**
අවසාන එකතුව		**582,845,563.32**	**580,214,816.69**	**2,630,746.63**	**91,778.00**	**2,538,968.63**

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
ආයෝජන කාලසටහන- 2023.12.31 දිනට

Short Terms												
ආයෝජකයා/ බැංකුව	යහතිකපත් අංකය	ආයෝජන			කාලය	පොලී අනුපාතය (වාර්ෂික)	ලැබිය යුතු මුළු පොලී	කල්පිරීමේ අගය	මුළු WHT @ 5%	ශුද්ධ කල්පිරීමේ අගය	ලැබිය යුතු පොලී	WHT ගෙවිය යුතු
		දිනය		ආයෝජනය කල මුදල (රු)								
		ආයෝජන	කල්පිරීම්								2023	2023
NSB	Culture-2/0111/03/74628	11-Apr-2023	11-Apr-2024	82,017,495.54	12 M	21.00%	17,223,674.06	99,241,169.60	861,183.70	98,379,985.90	12,470,692.97	623,534.65
PB	System-174600100036121-4	2-Jun-2023	2-Jun-2024	4,440,000.00	12 M	18.00%	799,200.00	5,239,200.00	-	5,239,200.00	465,108.20	-
PB	174600100036192-8	8-Jun-2023	8-Jun-2024	32,494,000.00	12 M	15.00%	4,874,100.00	37,368,100.00	-	37,368,100.00	2,756,663.11	-
HDFC	999201000115/110	11-Jul-2023	11-Jan-2024	25,000,000.00	6 M	12.00%	1,508,196.72	26,508,196.72	75,409.84	26,432,786.89	1,426,229.51	71,311.48
PB	174600100036642-4	24-Jul-2023	24-Jan-2024	10,000,000.00	6 M	12.00%	529,315.07	10,529,315.07	-	10,529,315.07	463,150.68	-
PB	174600100036741-4	2-Aug-2023	2-Feb-2024	680,000,000.00	6 M	13.00%	44,563,287.67	724,563,287.67	-	724,563,287.67	36,813,150.68	-
NSB	Reserve Fund-2/0111/03/79778	2-Aug-2023	2-Feb-2024	69,097,000.00	6 M	13.00%	4,528,219.84	73,625,219.84	226,410.99	73,398,808.84	3,740,703.34	187,035.17
NSB	System-2/0111/03/79760	2-Aug-2023	2-Feb-2024	10,211,719.00	6 M	13.00%	669,217.31	10,880,936.31	33,460.87	10,847,475.45	552,831.69	27,641.58
HDFC	999201000115/115	23-Aug-2023	23-Aug-2024	392,725,000.00	12 M	12.25%	48,108,812.50	440,833,812.50	2,405,440.63	438,428,371.88	17,219,274.42	860,963.72
HDFC	Reserve Fund-999201000115/116	23-Aug-2023	23-Feb-2024	44,755,000.00	6 M	12.50%	2,820,178.08	47,575,178.08	141,008.90	47,434,169.18	2,007,844.18	100,392.21
PB	174600100037124-9	4-Sep-2023	4-Mar-2024	17,000,000.00	6 M	12.50%	1,059,589.04	18,059,589.04	-	18,059,589.04	692,808.22	-
PB	174600100037397-9	25-Sep-2023	25-Mar-2024	15,679,000.00	6 M	12.50%	977,252.74	16,656,252.74	-	16,656,252.74	526,213.01	-
PB	System-174600100037489-8	4-Oct-2023	4-Jan-2024	2,477,544.00	3 M	12.50%	78,059.61	2,555,603.61	-	2,555,603.61	75,514.18	-
SMIB	SMIB/IFD/0001278	11-Oct-2023	11-Apr-2024	903,293,750.00	6 M	12.60%	56,907,506.25	960,201,256.25	2,845,375.31	957,355,880.94	25,499,538.32	1,274,976.92
SMIB	Reserve Fund-SMIB/IFD/0001279	11-Oct-2023	11-Apr-2024	103,407,500.00	6 M	12.60%	6,514,672.50	109,922,172.50	325,733.63	109,596,438.88	2,919,142.87	145,957.14
PB	174600100037711-8	18-Oct-2023	18-Oct-2024	451,518,000.00	12 M	11.60%	52,519,584.13	504,037,584.13	-	504,037,584.13	10,762,209.86	-
PB	174600100037769-9	25-Oct-2023	25-Oct-2024	124,227,000.00	12 M	11.90%	14,783,013.00	139,010,013.00	-	139,010,013.00	2,746,570.72	-
PB	Reserve Fund-174600100037770-6	25-Oct-2023	25-Oct-2024	18,238,000.00	12 M	11.90%	2,170,322.00	20,408,322.00	-	20,408,322.00	403,229.22	-
PB		8-Dec-2023	8-Dec-2024	122,831,000.00	12 M	11.00%	13,511,410.00	136,342,410.00	-	136,342,410.00	885,994.10	-
PB	Reserve Fund	8-Dec-2023	8-Dec-2024	9,169,000.00	12 M	11.00%	1,008,590.00	10,177,590.00	-	10,177,590.00	66,137.05	-
PB	Culture	21-Dec-2023	21-Jun-2024	85,407,253.14	6 M	12.00%	5,138,474.74	90,545,727.88	-	90,545,727.88	308,870.07	-
Total				3,203,988,258.37			280,292,675.26	3,484,280,936.94	6,914,023.86	3,477,366,913.07	122,178,344.13	2,668,281.18

සටහන 24

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා
ආදායම් සහ වියදම් ප්‍රකාශය - විශ්‍රාම වැටුප් අරමුදල

විස්තරය	2023 (රු.)	2022 (රු.)
සාමාජික දායක මුදල් අයකර ගැනීම්		
තැපැල් එකතු කිරීම්	165,745,228	162,731,616
බැංකු සහ වෙනත් එකතු කිරීම්	219,468,507	174,548,730
සම්පූර්ණ එකතුව (a)	**385,213,735**	**337,280,346**
එකතු කළා - පොලී ආදායම්		
ස්ථාවර තැන්පතු	543,161,844	345,475,143
ඉතිරි කිරීම් තැන්පතු	2,444,360	1,818,588
වෙනත් (ආපදා ණය II)	-	-
වෙනත් (ආපදා ණය III)	657,975	656,096
සංස්කෘතික අරමුදලේ පොළිය	-	-
පොලී ආදායම් - ජාලය	-	27,024
වෙනත් ආදායම්-අරමුදල	100	28,885
වෙනත් ආදායම-අරස්සාව	261,626	-
විනිමය ලාභය	(207,885)	7,969
පොලී ආදායම් සංස්කෘතික SSB	565,277	420,645
පොලී එකතුව (b)	**546,883,298**	**348,434,350**
අඩුකළා - වියදම්		
විශ්‍රාම වැටුප් ගෙවීම්	407,000,980	380,424,646
දායකයන්ගේ ශුද්ධ මුදල් ආපසු ගෙවීම්	22,712,140	31,448,787
පාරිතෝෂික ගෙවීම්	2,404,513	1,572,044
අබාධිත දීමනා ගෙවීම්	658,570	527,026
දායකයින්ට ප්‍රතිලාභ ගෙවීම්	7,428,819	5,528,349
තැපැල් ගාස්තු	(14,595)	(19,915)
දිරිදීමනා ගෙවීම්	48,338,909	35,306,023
වාරික එකතු කිරීම සඳහා වන වියදම්	877,739	207,840
ප්‍රවර්ධන වැඩසටහන් සඳහා වියදම්	495,160	2,358,814
25 වැනි සංවත්සර වියදම්	-	(67,315)
බඳවා ගැනීම් සම්බන්ධ පුනරාවර්තන වියදම්	12,812,510	9,198,018
ගිණුමෙන් කපා හැරීම්	-	7,111
අක්‍රිය සාමාජිකයින් සක්‍රීය කිරීම	271,936	72,476
පුනරාවර්තන වියදම් විශේෂ	5,252,279	
සංස්කෘතික කලාකරුවන්ගේ වැඩමුළුවේ වියදම	27,765	
මාධ්‍ය ප්‍රවර්ධන	1,586,708	
රජයේ කාර්යාලීය නිලධාරීන් අගය කිරීම්	2,003,857	
කාර්යය මණ්ඩල රක්ෂණ	735,000	614,500
බැංකු ගාස්තු	57,351	42,993
තැපැල් කොමිස්	8,286,825	8,134,543
රඳවා ගැනීමේ බදු - අරමුදල	18,009,190	10,368,062
රඳවා ගැනීමේ බද්ද - සංස්කෘතිය		286,508
රඳවා ගැනීමේ බද්ද - ඉතිරිකිරීම්	54,482	
මුළු වියදම් (c)	**539,000,138**	486,010,509
ශුද්ධ ශේෂය (a) + (b) - (c)	**393,096,895**	**199,704,187**

සටහන -
2023.01.01 සිට 2023.12.31 දක්වා මුළු මුදල් එකතු කිරීම රු. 387,844,481.37 කි.
හඳුනා නොගත් තැන්පතු රුපියල් 2,630,746.63 කි. එය වත්මන් වගකීම් ලෙස ශේෂ පත්‍රයේ දක්වා ඇත (සටහන 24)

ස්තූතිය

රාජ්‍ය විශ්‍රාම වැටුප් හිමිකම නොමැති තැනැත්තන්ගේ ජ්‍යෙෂ්ඨ පුරවැසි සමය වඩාත් සුරක්ෂිත කිරීම සඳහා විශ්‍රාම වැටුප් රැකවරණය සැලසීම හා වෙනත් සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සහතික කිරීම සඳහා සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාවට නංවා ඇත. එම කාර්යයභාරය ඉටුකිරීමේ දී පරිපාලන මෙහෙයුම් සම්බන්ධීකරණය ආදි සෑම අංශයකින්ම සහය දක්වන ලද සැමට ස්තූතිය ප්‍රකාශ කරමු.

- කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
- මුදල් අමාත්‍යාංශය
- ජාතික විගණන කාර්යාලය
- රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
- දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශිය ලේකම්වරුන්
- සමාජ සේවා නිලධාරින්, ග්‍රාම නිලධාරින්
- මහජන බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව
- තැපැල් දෙපාර්තමේන්තුව
- සමූපකාර ග්‍රාමීය බැංකු ජාලය
- විවිධ අයුරින් සහය දක්වන ලද සැමට

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

සමාජ ආරක්ෂණ පියස

අංක 18, රාජගිරිය පාර,

රාජගිරිය.

වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන

வருடாந்த அறிக்கை மற்றும் நிதிக் கூற்று

ANNUAL REPORT AND FINANCIAL STATEMENTS

2023

''සමාජ ආරක්ෂණ පියස'', අංක : 18, රාජගිරිය පාර, රාජගිරිය.
දුරකථන : 0112 886585 / 0112 886586, ක්ෂණික ඇමතුම් : 0112 886088
වෙබ් අඩවිය : www.ssb.gov.lk ඊ - මේල් : info@ssb.gov.lk